2026.06.21 ඉරිදා | හත්වැනි කාණ්ඩය | 48 වැනි කලාපය
දැන් ඉරිදා

# මව්බිම

රු.100




උපුල් ජෝෂප් ප්‍රනාන්දුගේ
## ගුරුදු විග්‍රහය



### ජේ.ආර්.ගේ ඡන්ද ලක්ෂ 25 කා ගාවද?

P » 04



## සාකච්ඡාව පැය එකහමාරයි

සමගි ජන බලවේගයේ නායක, විපක්ෂ නායක සජිත් ප්‍රේමදාස මහතා සහ එක්සත් ජාතික පක්ෂයේ නායක රනිල් වික්‍රමසිංහ මහතා අතර සුවිශේෂ හමුවක් පසුගිය සෙනසුරාදා (13) දින කොළඹදී සිදුව තිබේ. කොළඹ කොල්ලුපිටියේ 5 වැනි පටුමගේ පිහිටි රනිල් වික්‍රමසිංහ මහතාගේ පෞද්ගලික නිවසේදී මෙම හමුව සිදුව ඇත. පැය එකහමාරක පමණ කාලයක් පුරා පැවැත්වී ඇති මෙම සාකච්ඡාවේදී සමගි ජන බලවේගයත්, එක්සත් ජාතික පක්ෂයත් ඒකාබද්ධ කිරීම සම්බන්ධයෙන් දෙදෙනා අතර දීර්ඝව අදහස් හුවමාරු වී ඇති බවක් දැනගන්නට ඇත.

P » 02

# සජිත්-රනිල් හමුවෙයි



## සලේගේ නෝනා දැන් හරි ජනප්‍රියයි

P » 02

## අනුර-ටිල්වින් අලුත් ගේමකට සූදානම් වෙයි

ලබන වසරේ මාර්තු මාසයෙන් පසු ගම්දනවු ඉලක්ක කොටගෙන දැවැන්ත සංවර්ධන සංග්‍රාමයක් ආරම්භ කිරීමට ජනාධිපතිවරයා ප්‍රමුඛ ජනතා විමුක්ති පෙරමුණු ආණ්ඩුව තීරණය කොට ඇත.

P » 02



පච මදිවට හොරු

## සජබ රට පුරාම මහපාරේ

P » 02

## මල්පාරේ සුපිරි ගෙයක් ගත්ත විපක්ෂ දේශපාලකයා රටින් පනී?

කොළඹ 07 මල් පාරේ පිහිටි සුවිසල් නිවසක් කෝටි ගණනක මුදලකට මිලදී ගත් විපක්ෂයේ ප්‍රබල දේශපාලනඥයකු මේ වනවිට රටින් පලාගොස් ඇති බව වාර්තා වේ.

P » 02



## ඇමෙරිකාවේ කපූර් ගිදිසියේම ලංකාවට එයි

P » 02

මුදලිගේව

## මරන්න ගිය හැටි

P » 03



## කසාගලගේ වගාවන් ගැන මහ බැංකුවෙන් විමර්ශන

P » 02

## සංගීත් ආපහු පච වෙයි



P » 11





ඔබේ බිස්නස් එකට Power එකක් දෙන්න ළඟම තියෙන Dialog එකට එන්න

කුඩා හෝ මධ්‍ය පරිමාණ ව්‍යාපාර වෙනුවෙන්ම සකස් වූ තාක්ෂණික විසඳුම්

Business Connectivity පහසුකම්
Business Wi-Fi පැකේජ
Business DTV සබඳතා
Smart Tracking සේවාවන්

ඔබගේ ළඟම ඇති Dialog ශාඛාවේ අපගේ නියෝජිත මහතා (Enterprise Advisor) හමුවී ඔබේ ව්‍යාපාරයට ගැලපෙනම ඩිජිටල් විසඳුම් ඇතුළු අනෙකුත් සේවාවන් ගැන දැන ගන්න.

0777 887 887 | business.dialog.lk

Dialog ENTERPRISE



# අනේ මෙහෙමත් තිරිසන්නු

## කොටිකාවත්ත බස් එකෙත් හිටියා

## මැදවච්චියේ සැලුන් එකෙත් හිටියා

**අපේ රටේ බොහෝ දෙනෙක් ගතකරන්නේ සුවපහසු ජීවිත නෙවෙයි. එදා වේල කොහොම හරි හොයාගෙන, යන්තම් ජීවිතය ගැටගහන්න අය තමයි වැඩිපුරම අපේ රටේ ඉන්නේ.**

ඒ අතර ඇතැම් අය මේ අගහිඟකම් නිසාම මනුෂ්‍යයන් ලෙස ජීවත්වීම නවතා තිරිසනුන් ලෙස හැසිරෙන විට ඒ සමාජයේ ජීවත්වන අහිංසක මිනිසුන්ට දැනෙන්නේ අනාරක්ෂිත බවක්. පසුගිය දින කිහිපය තුළ හදවත කම්පනයට පත්කරන එවැනි සිදුවීම් දෙකක් අසන්නට ලැබුණා. ඒ සිදුවීම් දෙක අපේ සමාජයේ මනුෂ්‍යත්වය තවමත් ජීවත්වේදැයි ප්‍රශ්න කිරීමට අපව පොලඹවනවා.

මෙහි පළමු සිදුවීම ලෙස පසුගිය 15 වැනිදා උදෑසන මා මුහුණදුන් සිදුවීම මාගේ ජීවිතයේ අමතක නොවන අමිහිරි අත්දැකීමක් වුණා. එදින උදෑසන මා කොටිකාවත්තේ බස් නැවතුම්පළට ගියේ අඹතලේ සිට කොල්ලුපිටිය දක්වා දිවෙන මාර්ග අංක 175 බස් රථයකට ගොඩවීමටයි. එම අවස්ථාවේ එහි සිටි කුඩා දරුවකු සහ ඔහුගේ මව මුහුණදුන් අසාධාරණය දකිද්දී හදවත දැඩි කම්පනයට පත්වුණා.

175 මාර්ග අංකය යටතේ දිවෙන බස් රථ උදෑසනට ගමන් කරන්නේ මිනිස්සුන්ගේ ජීවිත ගැනද තැකීමක් නොමැතිව අධික වේගයෙනි. ඒ ඔවුන් නියමිත වේලාවට ගමන් කළ යුතු බවට බස් සංගම්වලින් පනවාගත් නීතියක් නිසා වන්නට ඇත. එදා මෙම බස් රථයේ කිටි කිටියේ ගමන් කරන මගීන් අතර අවුරුදු 3ක පමණ දරුවකු සමග මවක් සිටියා. මගී ආසනවල අසුන්ගෙන සිටි කවුරුවත් තමන්ගේ අසුන මේ මවට හෝ දරුවාට දීමට කැමැත්තක් දැක්වූයේ නැහැ. මේ මව සහ දරුවා බස් රථයට ගොඩවී තිබුණේ අයි.ඩී.එච්. මංසන්ධිය දක්වා ගමන් කිරීමටයි. ඔවුන් බස්රථයේ රියැදුරු අසුනට පසු අසුන ඉදිරිපිට රැඳී සිටියා. කොහොම වුණත් පුංචි දරුවන් බස් රථයේ ජනේලය අසල ගමන් කිරීමට කැමැත්තක් දැක්වීම සාමාන්‍ය දෙයක්. මේ දරුවාද ඉදිරි අසුනේ සිටි කාන්තාවක් සහ පිරිමි පුද්ගලයෙකු අතරින් ජනේලය අසල සිටගන්නට වුණේ ගමන් කරන අතරතුර අවට පරිසරය නැරඹීමේ අපේක්ෂාවෙනුයි.

එහෙත් සිදුවූයේ අනපේක්ෂිත දෙයක්. ජනේලය අසල අසුනේ වාඩිවී සිටි පිරිමි පුද්ගලයා මේ කිරිසප්පයාට බැණ වැදුණේ ඉතා පහත් ආකාරයකටයි.

'මගේ කකුල වදිනවා... එහාට යනවා...' යනුවෙන් බැණවදිමින් ඔහු දරුවා තල්ලු කරන්නට වුණා. මේ වචන මවක් කෙසේ නම් ඉවසයිද? කෙසේ නම් දරාගනීද? මිනිස්සු කොයිතරම් අසරණද? ඇයි මෙහෙම මිනිස්සු සත්තු වගේ හැසිරෙන්නේ? තම කිරිසප්පයාට බැණවැදීම මේ මවට දරා ගැනීමට නොහැකි වුණා. මේ මව යටි ගිරියෙන් කෑගසමින් බසය දෙවනත් කළේ තමන් දස මසක් කුස දරා මෙලොවට බිහිකළ දරුවා තමන්ගේ මුළු ලෝකයම නිසයි. ඒ, වේදනාව දරාගැනීමට නොහැකිවයි.

මේ මව 'තමුසේට ළමයි නැද්ද...? මං පොලිසි යනවා... මගේ කිරිසප්පයා අසනීපෙන් ඉන්නේ. පයින් ගැහුවා... තමුසේට සාප වෙනවා... තමුසෙගේ ගෙදර ගෑනි ළමයි නැද්ද...?' ආදී වශයෙන් ඒ මව සිය වේදනාව සහ කෝපය පිටකළේ බසය දෙවනත් වන්නටය. අසල සිටි කිසිදු මගියෙකුවත්, රියැදුරා හෝ කොන්දොස්තරවරයාවත් ඒ සම්බන්ධයෙන් කිසිදු වචනයක් කතා නොකිරීම විශේෂ සිදුවීමක් වුණා. ඒ මොහොතේ මා රැඳී සිටියේ එම බසයේ පිටුපසයි. ඇයි ඒ වෙනුවෙන් කාටවත් හඬ නගන්නට බැරිවුණේ. මිනිස්සු ජීවත් වන්නේ නොමැරෙන මිනිස්සු වගේයි. ඒ මගේ හදවතට දැනුණු දේය. ඒ අම්මා බෙරිහන් දී බසය දෙවනත් කළේ තමන්ගේ අහිංසක කිරිසප්පයා වෙනුවෙනි. ළමයෙක් අරන් කවුරු බසයට නැග්ගත් කොන්දොස්තරගේ වගකීම වන්නේ එවැනි මවකට ආසනයක් ලබාදීමයි. එහෙත් ඉහත කී මගියා කටයුතු කළේ ඔහුට බිරිඳක් හෝ දරුවෙක් නොමැති ආකාරයටයි. ඇයි මනුස්සයෝ මිනිස් ගුණධර්ම නොමැති අය ලෙස ජීවත් වෙන්නේ? අපි ජීවත් වෙන්නේ ටික කාලයයි. ඒ ටික කාලේ මිනිස්සුන්ට සමාජයට ආදරෙන් කරුණාවෙන් ජීවත්වීම හැම කෙනෙක්ම යුතුකමක් ලෙස සිතට ගතයුතුයි.

ඒ සිදුවීමෙන් දිනක් ගතවන්නට පෙර පසුගිය 16 වැනිදා හද කම්පා කරවන තවත් සිදුවීමක් වාර්තා වුණේ මැදවච්චිය ප්‍රදේශයෙන්. අහිංසක තරුණයෙක් දුක් මහන්සියෙන් පවත්වාගෙන ගිය ව්‍යාපාරික ස්ථානයට කඩාවැදුණු මංකොල්ලකරුවෙක් ඒ තරුණයාට පහරදුන්නේ අමානුෂික විදියට. මේ සිදුවීම එහි සවිකර තිබූ ආරක්ෂිත කැමරාවක සටහන්ව තිබුණා.

මැදවච්චියේ පිහිටි කොණ්ඩා කපන ස්ථානයකට ඇතුළු වූ තරුණයන් දෙදෙනකු එය අයිති තරුණයාගෙන් කප්පන් ඉල්ලා තර්ජනය කරනවා. කප්පම් නොදීම හේතුවෙන් ඔවුන් අදාළ තරුණයාට පහරදී ඔහුගේ අතක් දැළි පිහියෙන් තුවාල කරනවා. එලෙස පහරකෑමට ලක්වූ තරුණයා සිද්ධිය මාධ්‍ය වෙත විස්තර කර සිටියේ මෙලෙසයි.

'මම වැඩකරන සැලෝන් එකට ඇවිත් කෙනෙක් දැළි පිහියෙන් මගේ අත ගාවයි කන ගාවයි කපලා ගියා. මේ පහරදීමට හේතුව වුණේ මත්ද්‍රව්‍ය. අපෙන් සල්ලි ඉල්ලුවා. ඒ නොදුන් නිසා තමයි පහර දුන්නේ. මම ප්‍රතිකාර සඳහා මැදවච්චිය රෝහලේ නතර වුණා. වැඩිදුර ප්‍රතිකාර සඳහා මාව මැදවච්චිය රෝහලෙන් අනුරාධපුර රෝහලට මාරුකර යැව්වා..'

මේ සමාජයේ මනුෂ්‍යත්වය මනිනු ලබන්නේ අසරණ අහිංසක මිනිස්සුන්ට සලකන ආකාරයෙන්. එහෙත් අද අප ජීවත්වන සමාජයේ අහන්නට ලැබෙන ඇතැම් සිදුවීම් මනුෂ්‍යත්වය තවදුරටත් ජීවත් වේදැයි ප්‍රශ්න කිරීමට අපව පොලඹවයි. සුළු ව්‍යාපාරයක් පවත්වාගෙන යමින් දෛනික ජීවිතය ගෙනයාමට වෙහෙසෙන සාමාන්‍ය වෙළෙඳසල් හිමියකුට මුහුණ දීමට සිදුවූ මෙම අවාසනාවන්ත ප්‍රහාරය හේතුවෙන් මුළු ප්‍රදේශයම භීතියට පත්කරනු ලැබුවා. කප්පම් මුදල් ඉල්ලා පැමිණි පුද්ගලයන්ට එලෙස කප්පම් ලබාදීම ප්‍රතික්ෂේප කිරීමත් සමග ඔවුන් කෝපාවිෂ්ඨ වී එහි හිමිකරුට පහරදී ඇති බවයි වාර්තා වුණේ.

තම දහඩිය මහන්සියෙන් ජීවිතය ගොඩනගා ගැනීමට වෙහෙසෙන මිනිසුන් මෙලෙස බියගන්වා පහරදීම කිසිසේත්ම සාධාරණීකරණය කළ නොහැකියි. මත්ද්‍රව්‍ය උවදුරත් සමග බැඳී පවතින මෙවැනි අපරාධ අද ගම්වල සාමය සහ ආරක්ෂාව බරපතළ ලෙස අභියෝගයට ලක්කරමින් තිබේ. දිගින් දිගටම අසන්නට දකින්නට ලැබෙන මෙවැනි තර්ජන අහිංසක මිනිසුන්ගේ ජීවතවලට මහත් සේ බලපානු ලබයි. සමාජයට පිළිලයක් වූ මෙවැනි මංකොල්ලකරුවන්, මත්ද්‍රව්‍ය භාවිත කරන්නන්, මහජන සාමයට බාධා කරන්නන් අත්අඩංගුවට ගෙන නැවත එවැනි සිදුවීම් සිදු නොවීමට වගබලා ගැනීම පොලිසිය ඇතුළු වගකිව යුතු අංශවල කාර්යයකි.

මෙම පහරදීමෙන් තුවාල ලැබුවේ එක් පුද්ගලයෙකි. නමුත් හෙට දිනයේ ඒ ඉරණමට මුහුණ දීමට සිදුවන්නේ කාටදැයි කිසිවකු දන්නේ නැත. ඒ නිසාම මෙවැනි අපරාධකරුවන්ට විරුද්ධව නීතිය තදින් ක්‍රියාත්මක වීම කාලීන අවශ්‍යතාවක් වී තිබේ.

අපේ රටේ ඇතැම් ගම්මානවල වගේම නගරවලත් ජනතාවට නිදහසේ තම කටයුතු සිදුකරගැනීමට නොහැකි වාතාවරණයක් නිර්මාණය වී ඇති අයුරු දිනෙන් දින වාර්තා වන මෙවැනි සිදුවීම් හරහා දක්නට හැකිය. වත්මන් ආණ්ඩුව බලයට පැමිණීමට පෙර දේශපාලන වේදිකාවල නිතර පැවසුවේ ජනතාවට නිදහසේ ජීවත් විය හැකි ආරක්ෂිත සාමකාමී රටක් නිර්මාණය කරන බව වුණත් අද වනවිට සිදුවන ඇතැම් සිදුවීම් දෙස බලද්දී ඔවුන්ගේ එම පොරොන්දුව හිස් ප්‍රලාපයක් බවට පත්ව ඇති අයුරු දැකගත හැකිය.



නිලන්ති රේණුකා

මේ මත්ද්‍රව්‍ය උවදුර මැදවච්චිය ප්‍රදේශයට පමණක් සීමාවූ දෙයක් නොවෙයි. බොහෝ ප්‍රදේශවල මෙවැනි තත්ත්වයක් පවතී. එබැවින් මෙවැනි අපරාධ සමාජයෙන් තුරන් කිරීමට අවශ්‍ය පියවර ගැනීම සැම දෙනාගේම වගකීමකි.

මනුෂ්‍යත්වය යනු ධනයෙන් හෝ බලයෙන් මනින දෙයක් නොවේ. අසරණ මිනිස්සුන්ට දක්වන කරුණාවෙන් මනින දෙයකි. අපේ ප්‍රාර්ථනාව වන්නේ තවත් කිසිදු මවකට තම දරුවා වෙනුවෙන් කඳුළු සලන්නට නොලැබේවා යන්නයි. ඒ වගේම තවත් කිසිදු අහිංසකයෙකුට මෙවැනි පහරදීමක් සිදු නොවේවා යන්නයි. මක්නිසාද යත් අහිංසක මිනිසුන්ගේ කඳුළු මතින් ගොඩනැගෙන සමාජය කිසිදා සාමකාමී රටක් නිර්මාණය නොකරන නිසාවෙනි.

---

# වල්ලපට්ටා කිලෝ පේර වැනිලා වගාවන් පෙන්නලා කිසිම කෙනෙකුගෙන් තැන්පතු ගන්න බෑ

## ඒක නීති විරෝධීයි

## මහබැංකුවෙන් විශේෂ නිවේදනයක්



**විවිධ වගාවන් වෙනුවෙන් ආයෝජන කරන පුද්ගලයන්ට මාසිකව විශාල මූල්‍ය ප්‍රතිලාභ හිමිකර දෙන බව ප්‍රචාරය කරමින් ජනතාවගේ මුදල් වංචා කරන ආයතන රැසක් මේ වනවිට කරළියට පැමිණ ඇති බවත්, ඒවායේ ආයෝජනය නොකරන ලෙසත් සඳහන් කරමින් ශ්‍රී ලංකා මහබැංකුව පසුගිය දා විශේෂ දැනුවත් කිරීමක් සිදුකළා. ඒ සම්බන්ධයෙන් තවදුරටත් ජනතාව දැනුවත් කිරීම සඳහා වූ විශේෂ සාකච්ඡාවක් පසුගිය 04 වැනිදා දෙරණ රූපවාහිනියේ 'බිග් ෆෝකස්' වැඩසටහන ඔස්සේ සිදුකෙරුණු අතර, ඊට ශ්‍රී ලංකා මහබැංකුවේ බැංකු නොවන මූල්‍ය ආයතන අධීක්ෂණ දෙපාර්තමේන්තුවේ අධ්‍යක්ෂ චමරී ජයසිංහ මහත්මිය ඇතුළු නිලධාරීන් පිරිසක් එක්ව සිටියා. මේ, එම වැඩසටහනේදී අදාළ නීති විරෝධී ආයෝජන ක්‍රම සම්බන්ධයෙන් මාධ්‍යවේදියා විමසූ ප්‍රශ්නවලට චමරී ජයසිංහ මහත්මිය ලබාදුන් පිළිතුරුයි.**

**මාධ්‍යවේදී චතුර අල්විස්**

**සමහරු කියනවා දින 30කින් මුදල දෙගුණ කරලා දෙනවා කියලා. තව අය කියනවා 20%ක පොලියක් දෙනවා කියලා. එහෙම ගානක් දෙන්න බැරිද ඔය වගාවක් කරන කට්ටියට? ඒක මිථ්‍යාවක්ද?**

**චමරී ජයසිංහ**

එහෙම දෙන්නේ කොහොමද කියන එක තමයි අපිට අහන්න වෙන්නේ. දැන් යම්කිසි වගාවක් කරනවා නම් අපි අත්දැකීමෙන්ම දන්නවා වගාවේ ප්‍රතිලාභ ලැබෙන්න යම්කිසි කාලයක් යනවා. අද වවලා හෙට ගෙඩි එන්නේ නැහැනේ කිසිම භෝගයක. මාසෙකට 20% කියන එක නම් ඉතාම ඉහළ පොලියක්. එතකොට වාර්ෂික පොලිය 240% යි. ඉතින් මොන ව්‍යාපාරයක්වත් කරලා අපේ දැනුමේ හැටියට නම් එහෙම පොලියක් ගෙවන්න බැහැ. සාමාන්‍ය බැංකු පද්ධතියේ 10%ට අඩුයි වාර්ෂික පොලී මට්ටම.

**මාධ්‍යවේදී චතුර අල්විස්**

**එහෙමනම් ඔබතුමියලාගේ මුහුණු, ඔබතුමාගේ අපිත් එක්කම කරපු වැඩසටහන්වල ඔබලා කියන ප්‍රකාශයන් අපි දකිනවා ලංකාවේ ඔය විදියට වගාකරන ආයතන ඒගොල්ලෝ රැස් කරලා ඒගොල්ලන්ගේ යූටියුබ්වල, සෝෂල් මීඩියාවල, වෙබ් අඩවිවල ඔක්කොගෙම පාවිච්චි කරනවා. නීති විරෝධී නැහැ, වගාවන්ට මුදල් රැස් කරන්න පුළුවන් කියලා. ඒක කොහොමද එහෙමනම් වෙන්නේ නීති විරෝධී නම්?**

**චමරී ජයසිංහ**

නීති විරෝධී තමයි. ඒක තැන්පතුවක් විදිහට නමින් ගන්නේ නැහැ. යම් යම් ලියකියවිලි දීලා මහජනතාවගෙන් මුදල් රැස්කිරීම තමයි ඔය කරන්නේ. අන්න ඒක තමයි නීති විරෝධී. වගාව නෙමෙයි, වගාව මුවාවෙන් මහජනතාවගෙන් මුදල් රැස්කිරීම නීති විරෝධීයි. වගාව මුවාවෙන් මොනම ආකාරයෙන්වත් මහජනතාවගෙන් තැන්පතු රැස්කිරීම, මුදල් රැස්කිරීම මුදල් ව්‍යාපාර පනතේ වගන්ති යටතේ.

**මාධ්‍යවේදී චතුර අල්විස්**

**දැනට පැමිණිලි ලැබිලා තියෙනවා නම් මොන වගේ වගාවන් සම්බන්ධවද මුදල් රැස් කරනවා කියලා පැමිණිලි ලැබිලා තියෙන්නේ? මොකද එහෙම නැතුව මේක උඩින් කිව්වම මිනිස්සුන්ට තේරෙන්නේ නැහැ. මොන ක්ෂේත්‍රවල වගාවන්ට මුදල් එකතු කරනවා කියලා ද පැමිණිලි ලැබිලා තියෙන්නේ?**

**චමරී ජයසිංහ**

වර්ග වශයෙන් කිව්වොත් වැනිලා වගාව, නයි මිරිස්, කොච්චි මිරිස්, කංකුන්, කිලෝ පේර, වල්ලපට්ටා වගේ විවිධාකාර වගාවන්. එක වර්ගයක් නෙමෙයි. විවිධ භෝග. ඉතින් අපිට කියන්න බැහැ මේ එක වගාවක් ගැන විතරක් කියලා. නමුත් අපි දන්න හැටියට ලංකාව කෘෂිකාර්මික රටක්. එතකොට කෘෂිකාර්මික රටක් වුණාම මේවා දිගුකාලීනව වවන්න ඇතිනේ මීට කලිනුත්. දැන් තමයි අලුතෙන් මේ වගාවල්වලට සල්ලි එකතු කරන්නේ. නමුත් එහෙම වවලා ලංකාව දියුණු වෙන්න එපැයි. අපි ශතවර්ෂ ගානක් ගොවිතැන් කරපු මිනිස්සු. එතකොට ඕවයින් ඔය තරම් ලාභ ගන්න පුළුවන් නම් අපි මේ රැකියාවල් කරන්නවත් වෙන දෙයක් කරන්නවත් ඕනේ නැහැ, වගාව කරලා ඔහොම ලොකු ගණන් ගන්න පුළුවන්.

**මාධ්‍යවේදී චතුර අල්විස්**

**බොහොම සරලව කියනවා නම්, ඔබ මේ කියපු වගාවන් කිසිම එකකට ඔබ මුදල් දීලා වගාව කරන්නේ නැතුව මුදල් ආයෝජනය කරන්න යනවා නම්, හම්බ කරන්න හිතාගෙන මුදල් දෙන්න එපා.**

*චානක ලියනගේ*

---



## OKTOBERFEST උත්සවයට AHK ශ්‍රී ලංකා සහ FAIRWAY HOLDINGS අත්වැල් බැඳගනී

මෙරට ප්‍රමුඛ පෙළේ සමාගමක් වන Fairway Holdings සමූහයට අයත් F Entertainment ආයතනය විසින් ශ්‍රී ලංකාව සහ ජර්මනිය අතර සංස්කෘතික සබඳතා තවදුරටත් සවිමත් කිරීමේ සුවිශේෂ පියවරක් සනිටුහන් කරමින්, ශ්‍රී ලංකාවේ ජර්මානු කර්මාන්ත හා වාණිජ මණ්ඩලය (AHK Sri Lanka) සමග උපායමාර්ගික හවුල්කාරිත්වයක් ආරම්භ කර තිබේ. ඒ අනුව, සැබෑ ජර්මානු අත්දැකීමක් සමීප කරවන Oktoberfest උත්සවයක් ශ්‍රී ලංකාවේදී පැවැත්වීමට නියමිත වේ. කොළඹ පිහිටි AHK ශ්‍රී ලංකා කාර්යාලයේදී පසුගියදා මෙම අවබෝධතා ගිවිසුම අස්සන් කෙරුණු අතර ශ්‍රී ලංකාවේ සහ මාලදිවයිනේ ජර්මානු තානාපති ආචාර්ය ෆීලික්ස් නියුමන් (H.E. Dr. Felix Neumann) මහතාද මේ අවස්ථාවට සහභාගි විය. මෙම උත්සවය ඔක්තෝබර් 14 වැනිදා සිට 17 වැනිදා දක්වා කොළඹදී පැවැත්වීමට සැලසුම් කර ඇති අතර, සහභාගි වන්නන් වෙත මෙතෙක් ශ්‍රී ලංකාවේ අත්නොවිඳි Bavarian සංස්කෘතික අත්දැකීමක් හිමිවනු ඇත.

මෙම "AHK Sri Lanka Oktoberfest by Fairway" උත්සවය ජර්මානු ආයතනයක සෘජු දායකත්වයෙන් ශ්‍රී ලංකාවේ සංවිධාන කරනු ලබන ප්‍රථම 'ඔක්ටෝබර් ෆෙස්ට්' උත්සවය වීමද විශේෂත්වයකි. ජර්මනියේ සුප්‍රසිද්ධ Oompah සංගීත කණ්ඩායමක සංගීතයෙන්ද මෙම උත්සවය රසගැන්වීමට බලාපොරොත්තු වන අතර Bangkok, Ho Chi Minh City, Da Nang, සහ Hanoi යන නගරවල සංචාරය කිරීමෙන් අනතුරුව ඔවුන් සිය ලෝක සංචාරයේ කොටසක් ලෙස ශ්‍රී ලංකාවේදී ප්‍රසංග පවත්වනු ඇත.

*ප්‍රියන්ත හෙට්ටිගේ*

---

PAGE - 01

## කසාගලගේ වගාව...

කසාගල ග්‍රීන් ප්ලාන්ටේෂන් සමාගමේ අධ්‍යක්ෂ මල්වත්තගේ රංජිත් පීරිස් මහතා ස්වාධීන රූපවාහිනිය වෙත පැමිණ සිදුකළ අසත්‍ය, පදනම් විරහිත සහ නෛතික පදනමක් නොමැති ප්‍රකාශ සම්බන්ධයෙන් වහාම විමර්ශනයක් ආරම්භ කිරීමට මහබැංකුව තීරණය කොට ඇත.

පසුගිය දිනෙක කසාගල ග්‍රීන් ප්ලාන්ටේෂන් අධ්‍යක්ෂවරයා රාජ්‍ය මාධ්‍යයට පැමිණ කියා සිටියේ සිය ආයතනය මහබැංකුව මගින් නියාමනය වන බවත්, මාස 6කට වරක් දත්ත, තොරතුරු සහ වාර්තා සියල්ල මහබැංකුව වෙත යොමුකරන බවත්, අවශ්‍ය නම් ඒ සම්බන්ධයෙන් මහබැංකුවෙන් විමසා සිටිය හැකි බවත්ය.

නමුත් නිවේදනයක් නිකුත් කරමින් මහබැංකුව කියා සිටින්නේ මේ සියල්ල අසත්‍ය ප්‍රකාශ බවකි.

ඒ සම්බන්ධයෙන් වහාම විමර්ශනයක් ආරම්භ කිරීමට පියවර ගෙන ඇති බව පෙන්වා දෙන මහබැංකුව යම් ලෙසකින් කසාගල ග්‍රීන් ප්ලාන්ටේෂන් ආයතනය ජනතාවගෙන් මුදල් එකතු කොට ඇතිද යන්න තහවුරු කරගැනීම ඇතුළු කරුණු කිහිපයක් සම්බන්ධයෙන් මෙම විමර්ශනය පවත්වන බවත් පෙන්වා දෙයි.

කෙසේ වෙතත් මේ සම්බන්ධයෙන් කසාගල ප්ලාන්ටේෂන් මාධ්‍ය නිවේදනයක් නිකුත් කර කියා සිටියේ තම සමාගම සමාගම් මැඳුරේ ලියාපදිංචි වී ඇති බවකි.

## සජිත් රනිල් හමුවෙයි...

මෙම හමුවට පෙර දින රනිල් වික්‍රමසිංහ මහතාගේ නිවසේදීම සජබ සභාපති කබීර් හෂීම්, සජබ මහලේකම් රංජිත් මද්දුමබණ්ඩාර සහ ලකී ෆොන්සේකා යන මහත්වරුන් රනිල් වික්‍රමසිංහ මහතා හමුවී පැවැත්වූ සාකච්ඡාවක ප්‍රතිඵලයක් ලෙස සජිත් ප්‍රේමදාස මහතා හා රනිල් වික්‍රමසිංහ මහතා අතර හමුව සිදුව ඇති බව පැවැසේ.

මේ සම්බන්ධයෙන් සම්පූර්ණ විස්තරයක් 'රාජ්‍ය රහස්' තීරයේ පළවේ.

## අනුර ටිල්වින්...

ඒ අනුව, සෑම ගමක්ම ඉලක්ක කොටගෙන මාර්ග සංවර්ධනය, පාලම් බෝක්කු ප්‍රතිසංස්කරණය කිරීම ඇතුළු සංවර්ධන ව්‍යාපෘති රැසක්ම එක වර දියත් කිරීමට ජවිපෙ තීරණය කොට ඇති බවක් පැවැසේ.

මීට අමතරව දැනට අතරමග නැවතී ඇති අධිවේගී මාර්ගවල ඉතිරි කොටස් ඉදිකිරීම ලබන මාර්තු මාසයෙන් පසු වහාම ආරම්භ කිරීමටත් ආණ්ඩුව සැලසුම් කොට තිබේ.

විශේෂයෙන්ම ලබන මාර්තු මාසයේදී ජාත්‍යන්තර මූල්‍ය අරමුදල සමග අස්සන් කළ ගිවිසුම අවසන් වීමත් සමග භාණ්ඩාගාරයේ ඉතිරිව ඇති ට්‍රිලියන ගණනින් වූ මුදල් රටේ සංවර්ධනය සඳහා වෙන් කිරීමට ජනාධිපතිවරයා තීරණය කොට ඇත.

එම සංවර්ධන කටයුතුවලින් අනතුරුව 2027 මැද භාගයේදී පළාත් සභා මැතිවරණය පැවැත්වීම කෙරෙහි ආණ්ඩුවේ අවධානය යොමුව ඇති බවක්ද වාර්තා වේ.

## කපූර් හදිසියේ...

ඇමෙරිකානු රාජ්‍ය දෙපාර්තමේන්තුවේ දකුණු සහ මධ්‍යම ආසියානු කලාපය භාර සහකාර ලේකම් පෝල් කපූර් මහතා ලබන 22, 23 යන දෙදින තුළ ශ්‍රී ලංකාවේ සංචාරය කිරීමට නියමිතව ඇත.

ඇමෙරිකානු රජය විසින් ශ්‍රී ලංකාවට ලබාදුන් ආපදා කටයුතුවලදී භාවිත කළ හැකි හෙලිකොප්ටර් යානා 8ක් ජනාධිපතිවරයා වෙත නිල වශයෙන් භාරදීම සඳහා පෝල් කපූර් මහතා මෙසේ ලංකාවේ සංචාරය කිරීමට නියමිතය.

එම සංචාරයේදී ජනාධිපතිවරයා හමුවීමට සූදානමින් සිටින කපූර් මහතා ඉන් අනතුරුව කොළඹ වරායේ බටහිර පර්යන්තයේ නිරීක්ෂණ චාරිකාවකද නිරත වීමට නියමිතව ඇත.

## සලේගේ නෝනා...

ශ්‍රී ලංකාවේ දේශපාලනය තුළ කලින් කලට විවිධ චරිත හිටි හැටියේම අතිශය ජනප්‍රිය වන ආකාරයක් දැකගැනීමට පුළුවන.

ඇතැම් විට එය දේශපාලන චරිතයක් වීමට පුළුවන. තවත් විටෙක එය කලාවට බර චරිතයක් වීමට පුළුවන. තවත් අවස්ථාවක ක්‍රීඩා තරුවක් හිටි හැටියේම ජනප්‍රිය වන ආකාරයක්ද දැකගැනීමට පුළුවන.

නමුත් මේ දිනවල රට ඇතුළේ වඩාත්ම ජනප්‍රිය චරිතය වී ඇත්තේ මේ කිසිදු ක්ෂේත්‍රයකට සම්බන්ධ චරිතයක් නම් නොවේ.

ඒ චරිතය වෙන කවුරුවත් නොව, අපරාධ පරීක්ෂණ දෙපාර්තමේන්තුව භාරයේ අත්අඩංගුවේ පසුවන හිටපු රාජ්‍ය බුද්ධි සේවයේ ප්‍රධානී සුරේෂ් සලේ මහතාගේ බිරිය වන මනෝරි සලේ මහත්මියය.

කිසිදු දිනෙක මාධ්‍ය ඉදිරියට පැමිණ නොමැති සලේ මහත්මිය සිය සැමියා අත්අඩංගුවට පත්වීමත් සමග මේ වනවිට මාධ්‍ය ඉදිරියේ තමන්ටම අනන්‍ය වූ භාෂා රටාවක් භාවිත කරමින් අදහස් දැක්වීම ඇගේ මෙම ජනප්‍රියත්වයට හේතු වී තිබේ.

## මල් පාරේ ගෙයක්...

වයඹ පළාතේ ඉහළ තනතුරක් දැරූ මෙම විපක්ෂ දේශපාලනඥයාට එරෙහිව මුදල් විශුද්ධිකරණ පනත යටතේ විමර්ශන ආරම්භ වීමත් සමග ඇතැම් ප්‍රබල පුද්ගලයන්ගේ මැදිහත්වීම මත හෙතෙම ඇමෙරිකාවට පිටමං කොට ඇති බවක් දැනගන්නට ඇත.

කෙසේ වෙතත් මෙම පුද්ගලයා තමන්ගේ නමට මෙම දේපළ මිලදී ගත්තාද, එසේත් නොමැති නම් සිය පක්ෂයේ සිටින ප්‍රබලයන්ගේ නමකට මිලදී ගත්තාද යන්න සම්බන්ධයෙන් මේ වනවිට දීර්ඝ විමර්ශනයක් ආරම්භ කර ඇති බවක් දැනගන්නට ඇත.

## සජබ රට පුරාම...

'පච මදිවට හොරු - අනුරට බෑ - ජනතාවට අමාරුයි' යන තේමාව යටතේ සමගි ජන බලවේගය විසින් ආරම්භ කොට ඇති සම්මන්ත්‍රණ මාලාව ඉදිරියේදී රට පුරා පැවැත්වීමට එම පක්ෂය තීරණය කොට ඇති බව වාර්තා වේ.

ඒ අනුව, සෑම දිස්ත්‍රික්කයකම ගම් මට්ටමෙන් මෙම සම්මන්ත්‍රණ මාලාව පැවැත්වීම සඳහා කටයුතු කරන ලෙසට සියලු දිස්ත්‍රික් සංවිධායකවරුන්ටත්, ආසන සංවිධායකවරුන්ටත් උපදෙස් නිකුත් කොට ඇති බවක් දැනගන්නට ඇත.

එමෙන්ම දිස්ත්‍රික්කයේ සජබ මන්ත්‍රීවරුන්ට අමතරව පක්ෂයේ සිටින ප්‍රබල පාර්ලිමේන්තු මන්ත්‍රීවරුන් එම සියලු රැස්වීම්වලට සහභාගි කරවීමටද සජබය මේ වනවිට තීරණය කොට තිබේ.

මීට මාස දෙකකට ප්‍රථම ආරම්භ වූ මෙම සම්මන්ත්‍රණ මාලාවට ආසන මට්ටමෙන් ඉහළ ප්‍රතිචාර හිමිවීමත් සමග මෙසේ එය රට පුරා පැවැත්වීමට පක්ෂ නායකත්වයේ අවධානය යොමුව ඇති බව පැවැසේ.



කුඹ්බලා මාළු කෑවා නම්...

# කලකදී වහ වෙන කලකදී රහ වෙන PTA

**ත්‍රස්තවාදය වැළැක්වීමේ පනත හෙවත් පී.ටී.ඒ. පනත 1979 සිට භාවිතා කර ඇති පනතකි. දශක ගණනාවක් පුරා දහස් ගණනක් පුද්ගලයන් මේ යටතේ අත්අඩංගුවට ගෙන වධහිංසා පමුණුවා නඩු නොපවරා දීර්ඝ කාලයක් රඳවා තබාගෙන ඇති බව විවිධ මානව හිමිකම් වාර්තාවලින් තහවුරු කර තිබේ.**

## වධහිංසා 'පද්ධතිමය' සහ 'සාමාන්‍ය' ලෙස...

2020දී ශ්‍රී ලංකා මානව හිමිකම් කොමිසමේ අධ්‍යයනයකට අනුව, පී.ටී.ඒ. යටතේ රඳවා සිටි සිරකරුවන්ගෙන් 84%ක් පමණ අත්අඩංගුවට ගැනීමෙන් පසු දරුණු වධහිංසාවන්ට ලක්කර ඇති බව වාර්තා වී ඇත.

2015-2022 කාලය තුළ ආරක්ෂක අංශ විසින් දෙමළ පුද්ගලයන් 123 දෙනකු වධහිංසා, ලිංගික අපයෝජන සහ නීති විරෝධී රඳවා තබාගැනීම්වලට ලක්කළ බවට ජාත්‍යන්තර සත්‍ය හා යුක්ති ව්‍යාපෘතිය (ITJP) වාර්තා කර ඇත.

එක්සත් ජාතීන්ගේ විශේෂ වාර්තාකරුවන් සහ Human Rights Watch ආයතනය පී.ටී.ඒ. යටතේ වධහිංසා 'පද්ධතිමය' සහ 'සාමාන්‍ය' ලෙස සිදුව ඇති බව සඳහන් කර ඇත.

ගෝඨාභය රාජපක්ෂ (2019- ජූලි 2022) සහ රනිල් වික්‍රමසිංහ (ජූලි 2022 - සැප්තැම්බර් 2024) පාලන කාලයන් තුළ පී.ටී.ඒ. යටතේ අත්අඩංගුවට ගෙන වධහිංසා පමුණුවනු ලැබූ හෝ මරාදැමූ පුද්ගලයන්ගේ නිශ්චිත නිල සංඛ්‍යාවක් නොමැති නමුත්, වෙනත් ප්‍රසිද්ධ වාර්තා අනුව විශේෂයෙන් ශ්‍රී ලංකා මානව හිමිකම් කොමිසමේ අධ්‍යයනයකට අනුව පී.ටී.ඒ. සිරකරුවන්ගෙන් 84%ක් පමණ අත්අඩංගුවට ගැනීමෙන් පසු වධහිංසාවට ලක්ව ඇති බව වාර්තා කර තිබේ.

2020දී පී.ටී.ඒ. යටතේ පුද්ගලයන් 212 දෙනකු සහ 2021දී 109 දෙනකු අත්අඩංගුවට ගෙන තිබූ බව Human Rights Watch (HRW) සංවිධානය විසින් උපුටා දක්වන දත්ත පෙන්වාදී ඇත.

ජාත්‍යන්තර සත්‍ය හා යුක්ති ව්‍යාපෘතිය 2015-2022 කාලය තුළ දෙමළ පුද්ගලයන් 123 දෙනකු සම්බන්ධ පැහැරගැනීම්, රඳවා තබාගැනීම් සහ වධහිංසා සිද්ධීන් ලේඛනගත කර ඇති අතර, එම සිද්ධීන් 11ක් රනිල් වික්‍රමසිංහ ජනාධිපති ධුරයට පත්වීමෙන් පසු සිදුවූ බවද වාර්තා කර ඇත.

මානව හිමිකම් සංවිධාන කිහිපයක් ගෝඨාභය සහ රනිල් යන දෙපාර්ශ්වීය පාලන කාලවලද පී.ටී.ඒ. භාවිතය, අත්තනෝමතික රඳවා තබාගැනීම් සහ වධහිංසා චෝදනා දිගටම පැවැති බව ප්‍රකාශ කර ඇත. එබැවින් සත්‍ය වශයෙන්ම කිව හැක්කේ, පී.ටී.ඒ. යටතේ අත්අඩංගුවට ගත් පිරිස සිය ගණනක සිට දහස් ගණනක් අතර ප්‍රමාණයක වධහිංසා චෝදනා පුළුල් ලෙස ලේඛනගත වී ඇති බවයි.

**“ වසන්ත මුදලිගේ රඳවා තබාගෙන සිටින තැන පවා එළිදරව් නොකොට, ඔහුව නවගමුව පත්තිනි දේවාලය අසල ගඟ අසලට රැගෙන ගොස් මරාදැමීමට පවා සැලසුම් සකස් කර තිබූ බවට චෝදනාවක් තිබිණි. එම සැලසුම එළිදරව් වීම නිසා ඔහුගේ ජීවිතය රැකගැනීමට ඔහුට හැකි විය. මාස කිහිපයකට පසු ඔහු නිදහස් විය. අරගලයට සම්බන්ධ ක්‍රියාකාරකම් හේතුවෙන් 2022 දී පී.ටී.ඒ. යටතේ අත්අඩංගුවට ගෙන රඳවා තබා ගැනීම් විවාදයට ලක්විය.**

## සලේ යටතේ පී.ටී.ඒ. භාවිත කරමින් සිදුකර ඇති වධහිංසා..

2019 දෙසැම්බර් මාසයේදී ගෝඨාභය රාජපක්ෂ ජනාධිපති වීමෙන් පසු සුරේෂ් සලේ රාජ්‍ය බුද්ධි සේවයේ අධ්‍යක්ෂවරයා ලෙස පත්කළේය. ඔහු 2024 ඔක්තෝබර් දක්වා එම ධුරයේ කටයුතු කළේය. ගෝඨාභය රාජපක්ෂගෙන් පසුව රනිල් වික්‍රමසිංහගේ පාලන කාලය පුරාම එම තනතුරේ සිටියේ සුරේෂ් සලේය. ඒ අනුව, පසුගිය අරගල සමයේදී පී.ටී.ඒ. භාවිත කරමින් අත්අඩංගුවට ගැනීම් සහ ආරක්ෂක මෙහෙයුම් සිදුවූයේද සුරේෂ් සලේ රාජ්‍ය බුද්ධි සේවයේ ප්‍රධානියා ලෙස සිටින විටදීය.

ගෝඨාභය රාජපක්ෂ සහ රනිල් වික්‍රමසිංහ පාලන කාලයන් තුළ පී.ටී.ඒ. යටතේ වඩාත් ප්‍රසිද්ධියට පත්වූ නඩු කිහිපයක් විය. මේවා අධික ලෙස මාධ්‍ය සහ මානව හිමිකම් සංවිධානවල අවධානයට ලක්වූ සිද්ධීන්ය.

ප්‍රසිද්ධ නීතිඥයකු වන හිජාස් හිස්බුල්ලා 2020 අප්‍රේල් මාසයේදී පී.ටී.ඒ. යටතේ අත්අඩංගුවට ගනු ලැබීය. ඔහුට එරෙහිව එල්ල වූ චෝදනා සම්බන්ධයෙන් ප්‍රමාණවත් සාක්ෂි නොමැතිව දීර්ඝ කාලයක් රඳවා තබාගෙන ඇති බවට මානව හිමිකම් සංවිධාන ඇඟිල්ල දිගු කළේය. නමුත් 2022 දී ඔහුව අධිකරණ විසින් නිදහස් කරනු ලැබීය.

කවියකු සහ ගුරුවරයකු වූ අහ්නාෆ් ජසීම් 2020දී පී.ටී.ඒ. යටතේ අත්අඩංගුවට ගන්නා ලද අතර, ඔහුගේ Navarasam කාව්‍ය සංග්‍රහය අන්තවාදය ප්‍රවර්ධනය කරන බවට චෝදනා එල්ල විය. මානව හිමිකම් සංවිධාන සහ ලේඛක සංවිධාන මෙම අත්අඩංගුවට ගැනීම ප්‍රකාශන නිදහසට එල්ල වූ ප්‍රහාරයක් ලෙස විවේචනය කළහ. 2022දී ඔහු ඇප මත නිදහස් විය.

## මරා දමන්න ගඟ ළඟටත් රැගෙන ගිය මුදලිගේ...

අන්තර් විශ්වවිද්‍යාල ශිෂ්‍ය බලමණ්ඩලයේ කැඳවුම්කරු ලෙස කටයුතු කළ වසන්ත මුදලිගේ 2022 අරගල සමයේ පී.ටී.ඒ. යටතේ රඳවා තැබිණි. රනිල් වික්‍රමසිංහ ජනාධිපති ධුරයට පත්වීමෙන් පසු පී.ටී.ඒ. භාවිතය පිළිබඳ ජාත්‍යන්තර අවධානය වැඩි වූ ප්‍රධාන සිද්ධිය මෙය විය.

වසන්ත මුදලිගේ රඳවා තබාගෙන සිටින තැන පවා එළිදරව් නොකොට, ඔහුව නවගමුව පත්තිනි දේවාලය අසල ගඟ අසලට රැගෙන ගොස් මරාදැමීමට පවා සැලසුම් සකස් කර තිබූ බවට චෝදනාවක් තිබිණි.

එම සැලසුම එළිදරව් වීම නිසා ඔහුගේ ජීවිතය රැකගැනීමට ඔහුට හැකි විය. මාස කිහිපයකට පසු ඔහු නිදහස් විය.

අරගලයට සම්බන්ධ ක්‍රියාකාරකම් හේතුවෙන් 2022 දී පී.ටී.ඒ. යටතේ අත්අඩංගුවට ගෙන රඳවා තබා ගැනීම් විවාදයට ලක්විය. භික්ෂූන් වහන්සේලාට පී.ටී.ඒ. යෙදවීම පිළිබඳ විවේචන දැඩි ලෙස එල්ල විය.

Ceylon Teachers Union හි ලේකම් ජෝසප් ස්ටාලින්ට එරෙහිව 2022 දී පී.ටී.ඒ. භාවිත කිරීමට උත්සාහ කළ බවට චෝදනා මතුවිය. ඔහු සම්බන්ධ සිද්ධිය පී.ටී.ඒ. භාවිතයේ සීමා පිළිබඳ විවාදයට හේතු විය.

ගෝඨාභය සහ රනිල් යන දෙපාර්ශ්වයේම පාලන කාලයන් තුළ සිදුවූ වධහිංසා චෝදනා පිළිබඳවත්, පී.ටී.ඒ. රැඳවියන්ට වධහිංසා, බලහත්කාර ප්‍රකාශ ලබාගැනීම්, නීතිඥ ප්‍රවේශය ප්‍රමාද කිරීම සහ දිගුකාලීන රඳවා තබාගැනීම් පිළිබඳ වාර්තා Human Rights Watch, Amnesty International, International Truth and Justice Project සහ Human Rights Commission of Sri Lanka යන ආයතන ප්‍රකාශයට පත්කර ඇත.

## කැත නින්දිත මිලේච්ඡයන්ට එරෙහිව අද පී.ටී.ඒ.

ඉහත සඳහන් සියලු වධහිංසා, බලහත්කාරකම්, ප්‍රමාද කිරීම් සහ දිගුකාලීන රඳවා ගැනීම් පී.ටී.ඒ. යොදාගනිමින් කැත නින්දිත ලෙස හැසිරුණු මිලේච්ඡයන්ට එරෙහිව මේ වන විට පී.ටී.ඒ. ක්‍රියාත්මක වෙමින් පවතින්නේ දෛවයේ සරදමක් ලෙසය. දැන් ඔවුන්ට ප්‍රජාතන්ත්‍රවාදය සිහිපත් වී තිබේ. දැන් ඔවුහු ප්‍රජාතන්ත්‍රවාදය සොයමින් හඬා වැටෙමින් සිටිති.

මේ අතර තවත් සමහරුන්, මේ පී.ටී.ඒ. පනත යොදාගනිමින් පාහර වැඩ කළ මිලේච්ඡයන්ව රණවිරු සායමින් පින්තාරු කරන්නට දැඩි වෙහෙසක් දරමින් සිටිති. අපි නම් පී.ටී.ඒ. පනතට එදත් විරුද්ධය.

අදත් විරුද්ධය. හෙටත් විරුද්ධය. නමුත් පී.ටී.ඒ. පනත කැත නින්දිත ලෙස යොදාගනිමින් එදා මිලේච්ඡයන් ලෙස හැසිරුණු අය දැන් පූස් පැටව් මෙන් අහිංසකකම් පෙන්වමින් අනුකම්පාව දිනාගැනීමට උත්සාහ කරමින් සිටිති. ඒ අයට අපට නම් කියන්නට ඇත්තේ 'කුම්බලා මාළු කෑවා නම් විඳවාපන් බළලෝ' කියා පමණය.

*සුනිල් ගාමිණී ජයලත්ගේ*

### නන්දා ශ්‍රීගේ කැබිනෙට්ටුව

## දකිතැකි 'ජටා' ඇතිවග බහි සහ 'අන්තෝ'

**ලෝක පොලිස්කරුගේ පිස්සු වැඩවල**
**ලොවටම ලැබුණි බලමැන අනිසි ප්‍රතිඵල**
**ජීවිත මිනිස් දේපළ සුනු විසුනු කළ**
**යුද්ධය යළි එපා මනුදම් සසල කළ**

**ලොල්වී තෙලට ලොව බලවතා වීමට**
**පල්වී මරි මෝඩ තීරණ ඇති කලට**
**අරඹා යුද සටන් ඉඳ හිට යල මහට**
**ගැවේ ඇයිද ජන හදවත් තුළ කහට**

**තැන තැන ජනී ජනයා කඳුළැලි හෙළතී**
**මිහිකත තෙමාගෙන උණු ලේ කඳු හලතී**
**බල ඇති එකා බල නැතියට තග දමතී**
**අගනා මිනිස්කම් වළ පල්ලට දැමෙතී**

**හිමිකම් රකින මානව බලතල ඇත්තෝ**
**හැසිරෙනු පෙනෙනවද ලෙස සිත්පිත් නැත්තෝ**
**යුද අවි වනන විට දස අත බුදු සන්තෝ**
**දකිතැකි 'ජටා' ඇතිවග බහි සහ 'අන්තෝ'**

**අසරණ ජනී ජනයට ගිනි පිඹින්ට**
**දේපළ පවා රට රටවල නසන්ට**
**නීතිය අතට ගත් මේ නරුමයන්ට**
**සොබදම් මැණියෙනි දඬුවම් දෙවන්ට**

**දරුවන් නොදරුවන් දේපළ නසන්නේ**
**තත්පර ගණනකිනි ඇයි එය නොදන්නේ**
**පොඩි රටවලට මොකටද ගිනි තබන්නේ**
**මෙයටද අහෝ විදු දියුණුව කියන්නේ**



# බස් දෙන්න ආපු අය පන්නපු ස්මාට් බෝඩ් දීපු අය එළවපු අලුත් දේශපාලන වසන්තයේ

## මල් පිපෙන හැටි බලන්න එන්න

**පහුගිය ටික දොහේ මේ රටේ ලස්සන ලස්සන දේවල් සිදුවිය. ඒවා වචනයේ පරිසමාප්ත අර්ථයෙන්ම ලස්සනය. මේවා කිසිම කඩප්පුලි කතාවක් නොවේ. ගුණගරුක නෝනලා මහත්තුරු කෝප නොගත යුතුය.**

ජාතික ජන බලවේගයේ මන්ත්‍රීවරයෙකු වන අරුණ පනාගොඩ මහතා විසින් ඩෙලික්ලෙයාර් වතුයාය ආශ්‍රිතව බස් රථ සේවාව විවෘත කිරීම සිදුවිය. එම කර්තව්‍යය උත්සවාකාරයෙන් සිදුකළ එතුමන්වද මේ මොහොතේ සාධාරණ සිතින් පින් අනුමෝදනා සහිතව සිහිපත් කරන්නෙමු. ඔහොම ඒවා ඔහොම නොකර වෙන කරන්නේ අහවල් විදියකට දැයි නන් දොඩවන ගෙම්බන්ගෙන් අසමු.

ජාතික ජන බලවේගයේ පාර්ලිමේන්තු මන්ත්‍රී ලක්මාලි හේමචන්ද්‍ර මහත්මියවද මේ වෙලාවෙ අමතක කරලම බැරිය. ඒ නෝනාගේ මැදිහත් වීමෙන් පසුගියදා ආරම්භ කරනු ලැබුවේ මට්ටක්කුලිය සිට සොයිසාපුර දක්වා ධාවනය වන 155 බස් රථ සේවාවයි. කොවිඩ් වසංගත සමයේ සිට අත්හිටුවා තිබූ මෙම 155 බස් රථ සේවාව, මහජනතාව මුහුණ දුන් ප්‍රවාහන දුෂ්කරතා සැලකිල්ලට ගනිමින් ඇයගේ ප්‍රධානත්වයෙන් සහ කොළඹ මන්ත්‍රීවරුන් කිහිපදෙනෙකුගේ සහභාගිත්වයෙන් නැවත ආරම්භ කරන ලදී. ඒ නිසා ඒක ආරම්භ කිරීමක්ම නොවේ යැයි ඇතැම් කඩප්පුලියෝ වහසිබස් දොඩවති.

**“ චන්දන සූරියආරච්චි අමාත්‍යතුමා අපූරු කතාවක් කීවේය. ඒක කිව්වෙ අගමැතිනිය පෙර කී කතාවක් ගැන මාධ්‍ය ප්‍රශ්න ඇසූ කලය. මේ මාහැඟි දේශපාලකයාගේ නැණවත් ගුණවත් හරවත් කතා අසා පාසල් සිසුන්ගේ දැනුම පුළුල් වෙන බව එහි අර්ථය විය.**

මෝල්ලමක් එහෙම ගසා උජාරුවට කළ ඒ වැඩේ තුට්ටු දෙකට දාන්න වළිකන එවුන් එහෙම වැඩක වටිනාකම දන්නේ නැත. හරිනම් කළ යුත්තේ ඔහොම ගරු කටයුතු ඒවා විවේචනය නොවේ. ඊට සහාය දෙමින් යන්න ගමනක් නැතත් බස් එකේ රවුම් දෙකක් තුනක් යාමය.

තවත් දිනෙක අම්බිකා සැමුවෙල් මන්ත්‍රීවරිය විසින් යටිතල පහසුකම් අවම පාසලක දරුවන් වෙනුවෙන් නව වැසිකිළි පද්ධතියක් ඉදිකිරීමේ ව්‍යාපෘතියකට මුල්ගල තබා සිමෙන්ති දමා එය ආරම්භ කරන ලදී. හැන්ද ගෙන බදාම ඩිංගක් දමා වැඩේ කරන්නට ඇයටද අවස්ථාව ලැබුණේය. වැඩේ විචිත්‍රවත් කිරීම සඳහා ඉස්කෝලෙ බෑන්ඩ් කණ්ඩායමද සහභාගි වී තිබුණේය. කඩප්පුලියෝ ඕකටද කතා හැදුවෝය.

ක්ලීන් ශ්‍රී ලංකා ලේකම් කාර්යාලය සහ තවත් රාජ්‍ය ආයතන එක්ව සංවිධාන කළ ශ්‍රමදානයක් තිබුණේය. එයට එක්වෙමින් සමන්ත විද්‍යාරත්න අමාත්‍යවරයා උදළු ගාමින් සහ මැෂින් එකක් ආධාරයෙන් තණකොළ කපමින් පොදු ස්ථානය පවිත්‍ර කිරීමට දායක විය.

වැඩේ උනේ ජගත් පරිසර දිනය දාය. ඇමැතිතුමාගේ මේ සද්ක්‍රියාව කඩප්පුලියෝ විහිළුවට ගත්තෝය. අපි නම් එහෙම නැත. මෙවන් වීර ඇමැතිලා ජාති ජාතික් පහළ වේවායි අපි ප්‍රාර්ථනා කරමු.

චන්දන සූරියආරච්චි අමාත්‍යතුමා අපූරු කතාවක් කීවේය. ඒක කිව්වෙ අගමැතිනිය පෙර කී කතාවක් ගැන මාධ්‍ය ප්‍රශ්න ඇසූ කලය. මේ මාහැඟි දේශපාලකයාගේ නැණවත් ගුණවත් හරවත් කතා අසා පාසල් සිසුන්ගේ දැනුම පුළුල් වෙන බව එහි අර්ථය විය. නැත්නම් මේ මැති ඇමැතිගොල්ලෝ ඉස්කෝලයක පැත්ත පළාතක නොයන්නට දැඩි අදිටනින් උන් අයය. ඒ ගැන මාලිමාවේ දේශපාලන වේදිකාවලද කීප විටක්ම කියා තිබුණේය. නමුත් ජාතියේ පිනට ඒ අදහස මේ නෝනාවරු මහත්වරු පස්සට ගත්තේය. දැන් දැනුම පාසල් වේදිකාවෙන් එළියට බැස පන්ති කාමර පුරා ගලයි. පාසල්වල කානු පද්ධති නළ මාර්ග සියල්ල දිගේ ගලාගොස් කුණු කානුවලින් පවා දැනුම ගලා බසී.

ඉස්සර එහෙම නැත. මහින්ද ජයසිංහගේ විදග්ධ ඉංග්‍රීසි කතා හරි නම් සතියකට සැරයක් පාසලක අසන්නට තිබිය යුතුය. විජිත හේරත්ලාට හඳුන්නෙත්තිලාටද ඉඳහිට අවස්ථාවක් දුන්නාට වරදක් නැත. අර කළුතර නෝනාගේ දැනුම ගැන ආයෙ කතා දෙකක් නැත. මේ යන විදියට ලංකාවට දැනුම අපනයනය කර ජීවත් වෙන්න වුණත් බැරිකමක් නැත.

ඉස්සර සජිත්ලා කළා වගේ තකතීරු වැඩ දැන් නැත. ඒවා විහිළු බව අපට තේරුම් කර දුන්නේත් මේ අයමය. සජිත්ලා ඈත පිටිසර ගම්මානවල ඉස්කෝලවලට බස් දුන්නේය. අහල ගම් හතකට බස් එකක් නැති ඒ ඉස්කෝලවලට මොන බස්දැයි හිතන්නට අපට ඒ වෙලාවේ මතක් වුණේ නැත. ඒ අස්සේ මේ යකාලා ස්මාට් පන්ති කාමර නමින් අටමගලක් අටවා ගත්තේය. කළු ලෑල්ලේ හුණු කූරෙන් ලියනා සාම්ප්‍රදායික ගුරු අභිමානය සිඳ බිඳදමා ළමයි නරක් කිරීමේ කූට උපක්‍රමය අපි ජය ගත්තෙමු. ඔය ස්මාට් අටමගලෙන් ලෝකෙ හැම එකක්ම බලන්න ළමයින්ට ඉඩක් ලැබුණේය. ඒක කොයි තරම් නම් භයානකද තේරුම් ගත් ලංකාවේ පාසල් ගුරු ප්‍රජාව හැකි උපරිමයෙ කැපවී සජිත්ලාට ඉස්කෝල අහලකට එන්ඩ බැරි වෙන්න වැඩේ දුන්නේය. දැන් පාසල් ඉස්සර වගේ නැත. එක එකාට කියා වැඩ කරගන්න අවශ්‍ය නොවේ. උඩ තට්ටුවටත් මුල්ගල තියන දේශපාලන පරිණත බව මේ ආණ්ඩුව ලෝකෙට පෙන්නුවේය. උගතුන් එහෙමය. ඇවිදින පුස්තකාල බඳු ඒ මහත්තුරු ඉඳහිට හෝ ඉස්කෝලෙකට යන එන එක පවා වටිනා දෙයකි. උදේ හවස සුබ ලකුණු දකින දරුවෝ පිබිදෙති. සුවපත් වෙති. ගුණ යහපත් වෙති.

මේ යන විදිය මරුය. ඔබ දුටු ස්වර්ගය පහළ වෙමින් තිබේ. මේ යන විදියට ප්ලේටෝටත් උණ හෙම්බිරිස්සාව හැදෙන ගානට සිහින රාජ්‍ය සංකල්පය යථාර්ථයක් වෙනු ඇත. මේ ටික අල්ලගෙන ඉමු. එයාලා වැසිකිළි හදමින්, බස් දමමින්, තණකොළ කපමින් හිඳ ගේමට බහිනු ඇත. අපිට තියෙන්නේ ස්මාට් බෝඩ්කාරයන්ට ආයේ ඔළුව උස්සන්න බැරි කරන්නය.

ජයම වේවා...



ජීවන පහන් තිළිණ

මව්රට

ලිපිනය
නො: 22, ජයරත්න මාවත,
කොළඹ 05

කර්තෘ මණ්ඩලය
0112505134

ඊමේල්
news@mawratanews.lk

වෙබ් අඩවිය
www.mawratanews.lk

බෙදාහැරීම්
0764 449 688

දැන්වීම්
0114870063

උපුල් ජෝශප් ප්‍රනාන්දුගේ

## ගුරුදු විග්‍රහය



# ප්‍රේමදාසගේ ඡන්ද ලක්ෂ 25 තියෙනවා ජේ.ආර්.ගේ ඡන්ද ලක්ෂ 25 කා ගාවද?

**'යූ.ඇන්.පී.ය ආපහු දිනන්න නම් යූ.ඇන්.පී.ය වෙනස් වෙන්න ඕනා. බයිබලයේ තියෙනවා ජේසුස් වහන්සේ කියනවා පවු කරන මිනිස්සුන්ට ස්වර්ගයට යන්න නම් ඔටුවා ඉඳිකටු සිදුරෙන් රිංගන්න පුළුවන් තරමට වෙනස් වෙනවා වගේ වෙනස් වෙන්න ඕනෙ කියලා. අපි බලයට එන්න නම් ඉඳිකටු සිදුරෙන් ඔටුවා රිංගා ගන්න වෙනස් වුණා වගේ වෙනස් වෙන්න ඕනා...'**

මේ, ජේ.ආර්. 1970 මහ මැතිවරණයෙන් අන්ත පරාජයක් ලබලා සිටියදී ඔහුව හමුවෙන්න ආ යූ.ඇන්.පී. නායකයන්ට කී කතාවය.

ජේ.ආර්. කිව්ව විදියටම යූ.ඇන්.පී.ය වෙනස් කළේය. ගම්වල ප්‍රභූවරුන්ව දමලා තවදුරටත් ඡන්ද දිනන්න බැරි බව ජේ.ආර්. තේරුම් ගත්තේය. යූ.ඇන්.පී.ය හංවඩු ගසා තිබුණේ ප්‍රභූ ධනපති පක්ෂයක් ලෙසය. යූ.ඇන්.පී.යේ ආසන සංවිධායකයෙක් වෙන්න, නාගරික මන්ත්‍රී අපේක්ෂකයෙක් වෙන්න සල්ලි යහමින් තිබෙන ගමේ ගම්මුලාදෑනියෙක්වත් විය යුතුය යන මතයක් ජනගත වී තිබිණි. ජේ.ආර්. ඒ මතය වෙනස් කොට සිරිකොත පොඩි මිනිහාට විවෘත කළේය.

ජේ.ආර්. රණසිංහ ප්‍රේමදාස උස්සලා ගත්තේ යූ.ඇන්.පී.ය තවදුරටත් ප්‍රභූ ධනපති පක්ෂයක් නොවේ කියා ඔප්පු කර පෙන්වන්නටය.

ඩඩ්ලි සේනානායක මියයෑමෙන් පසු පක්ෂ නායකත්වයට පත් ජේ.ආර්. ගම්වල පොඩි පවුල්වල තරුණයන් ආසන සංවිධායකයන් ලෙස පත් කළේය. පක්ෂය වෙනස් කොට ජේ.ආර්. මුහුණ දුන් පළමු මැතිවරණය ජාඇළ අතුරු මැතිවරණයය. එම අතුරු මැතිවරණයට තරග කරන්න ජාඇළ ප්‍රභූ පවුලක කුමාරයෙක් දමන්න පක්ෂයේ ප්‍රභූවරු උත්සාහ ගනිද්දී ප්‍රේමදාස ජේ.ආර්.ව හමුවෙන්න ආවේය.

'සර්, මේ තරුණයා වැඩ කරන්නේ ජාඇළ රත්නාවලී හෝල් එකේ. පොඩි පවුලක තරුණයෙක්. අපි මෙයාව ඡන්දයට දමමු...'

ප්‍රේමදාස යෝජනා කළේය. ඒ තරුණයා ජෝෂප් මයිකල් විය.

'පක්ෂයේ වෙනස පෙන්වන්න හොඳම අවස්ථාව

**ඩඩ්ලි සේනානායක මියයෑමෙන් පසු පක්ෂ නායකත්වයට පත් ජේ.ආර්. ගම්වල පොඩි පවුල්වල තරුණයන් ආසන සංවිධායකයන් ලෙස පත් කළේය. පක්ෂය වෙනස් කොට ජේ.ආර්. මුහුණ දුන් පළමු මැතිවරණය ජාඇළ අතුරු මැතිවරණයය.**

## ජේ.ආර්.ගේ ප්‍රභූ පන්තියයි ප්‍රේමදාසගේ පොඩි පන්තියයි

මේකයි. අපි මේ තරුණයාව දමලා පෙන්වමු යූ.ඇන්.පී.ය දැන් පොඩි මිනිහගේ පක්ෂයක් කියලා...'

ජේ.ආර්. එහෙම කියලා ප්‍රේමදාසගේ යෝජනාව ඉහ මුදුණින් පිළිගත්තේය.

1977 යූ.ඇන්.පී.ය හයෙන් පහක මහා බලයකින් දින්නේ ජේ.ආර්.ගේ ප්‍රභූ පන්තියේ ඡන්දයි, ප්‍රේමදාසගේ දුප්පත් පන්තියේ ඡන්දයි එකට එකතු කරලාය.

ඩී.ඇස්. සේනානායක කොහොමත් යූ.ඇන්.පී.ය පිහිටෙව්වේ ලංකාවේ ඉහළම ප්‍රභූ ධනපති පන්තියයි අන්ත දුප්පත් පන්තියයි එකට එකතු කරලාය. අන්ත දුප්පත් පන්තිය යූ.ඇන්.පී.යට සමීප වුණේ ගම්වල ප්‍රභූ ධනපති පන්තිය මත යැපුණු නිසාය. බණ්ඩාරනායක ශ්‍රීලනිපය හැදුවේ මැද පන්තිය ඉලක්ක කරලාය. පසුව ලංකා සමසමාජ පක්ෂය සහ කොමියුනිස්ට් පක්ෂය ශ්‍රීලනිපය සමග සන්ධානගත වීම නිසා නගරයේ සහ ගම්වල දුප්පත් පන්තිය ශ්‍රීලනිප-වාමාංශික හවුලට ආකර්ෂණය විය. ඩී.ඇස්. යූ.ඇන්.පී.යට දුප්පත් පන්තිය ආකර්ෂණය කරගත්තේ දුප්පතුන් යැපුණු ගම්වල ප්‍රභූවරුන් ඡන්දයට දමලාය. ශ්‍රීලනිපය සහ වාමාංශික හවුල ගම්වල ගුරුවරු, දේශීය වෛද්‍යවරු වැනි පොඩි මිනිස්සු දමලා ඡන්දය ඉල්ලීමෙන් දුප්පතුන් ක්‍රම ක්‍රමයෙන් පොඩි මිනිස්සුන්ගේ නායකත්වයට ආකර්ෂණය විය. අනෙක ශ්‍රීලනිප - වාමාංශික හවුල කුඹුරු පනත වෙනස් කිරීමෙන්, වතු ජනසතු කිරීමෙන්, බස් සමාගම් ජනසතු කිරීමෙන් ගම්වල ප්‍රභූවරු දුප්පත් පන්තිය මත දරා සිටි ආධිපත්‍ය අහෝසි විය. යූ.ඇන්.පී.යට දුප්පතුන් අහිමි වීමේ තවත් හේතුවක් වූයේ එයය.

ජේ.ආර්., ප්‍රේමදාස ඇතුළු පොඩි මිනිහාට පක්ෂය විවෘත කළේ මේ බව හොඳින් තේරුම් ගෙනය. 1977 වන තෙක් ශ්‍රීලනිපය සහ වාමාංශික හවුල යූ.ඇන්.පී.යට කිව්වේ ප්‍රභූ ධනපතියන්ගේ පක්ෂය කියාය. 1977 සිට ජේ.ආර්. ප්‍රේමදාස ලවා ශ්‍රීලනිපයට ගැහුවේ රදළ පවුල් පක්ෂය කියාය. ප්‍රේමදාස යූ.ඇන්.පී.යට විශාල දුප්පතුන්ගේ ජන පදනමක් හැදුවේය. ගම්උදාව, කැපකරු මාපිය ක්‍රමය, ජනසවිය ඔහු හැදුවේ දුප්පතුන්ටය. ප්‍රේමදාස ඝාතනය වූයේ දුප්පතුන්ගේ ඡන්ද පදනම හොඳින් යූ.ඇන්.පී.ය තුළ සුරක්ෂිත කරලාය. ප්‍රේමදාස ඝාතනය වූ පසුත් 1993 පළාත් සභා ඡන්දයේදී යූ.ඇන්.පී.ය බස්නාහිර හැර අනෙක් සියලු පළාත් සභාවල බහුතරය හිමිකර ගත්තේ

**2020 ගෝඨා රැල්ල තිබියදී පරදින මහ ඡන්දයකදී සමගි ජන බලවේගය ඡන්ද ලක්ෂ 27ක් ගත්තේය. 2024 අනුර රැල්ල තිබියදී ජනාධිපතිවරණයේදී සජිත් ඡන්ද ලක්ෂ 43ක් දක්වා ලක්ෂ 27ක් වැඩි කරගත්තේ රනිල් ජනාධිපති වී යූ.ඇන්.පී. - සජබ ඡන්ද කඩද්දීය.**

ඒ ඡන්ද පදනම සුරක්ෂිතව තිබූ නිසාය.

ඩී.බී. විජේතුංග ජනාධිපති වී ප්‍රේමදාස ප්‍රතිරූපයට ගහලා ප්‍රේමදාස ප්‍රතිරූපය විනාශ කිරීමත්, රනිල් පක්ෂ නායකයා වී යළි යූ.ඇන්.පී.යට ඉංග්‍රීසි කතා කරන ප්‍රභූ පන්තිය කැඳවාගෙන ඒමත් සමග ප්‍රේමදාස යූ.ඇන්.පී.යට හදලා දුන් දුප්පතුන්ගේ ඡන්ද පදනම දුර්වල විය. පක්ෂය තුළ ප්‍රේමදාසගේ පුත් සජිත් ප්‍රේමදාසගේ නැගීමත් සමග යළිත් රණසිංහ ප්‍රේමදාස හදපු දුප්පත් ඡන්ද පදනම ශක්තිමත් විය. රනිල් සහ සජිත් එක්වී 2014 සජිත්ව නියෝජ්‍ය නායකයා කොට ඌව පළාත් සභාවට තරග කොට යූ.ඇන්.පී. ඡන්ද පදනම ශක්තිමත් කරගත්තේය. 2015 ජනාධිපතිවරණයට මෛත්‍රීපාල සිරිසේන වැනි ප්‍රේමදාසගේ පන්තියේ පොඩි මිනිසෙකු දමලා රාජපක්ෂ පවුල පරාජය කරන්න පුළුවන් වුණේත් සජිත් හරහා ශක්තිමත් කරගත් දුප්පතුන්ගේ ඡන්ද පදනම නිසාය.

සජිත් සමගි ජන බලවේගය පිහිටුවා 2020 මහ මැතිවරණයට තරග කරද්දී යූ.ඇන්.පී.යට ඇප නැතිවන බව තේරුම් ගත් යූ.ඇන්.පී. නායකයන් රනිල් හමුවෙන්න ගොස් නාහෙන් හඬද්දී රනිල් කීවේ අමුතු කතාවකි.

'යූ.ඇන්.පී.යෙන් ලලිත්, ගාමිණී වගේ ප්‍රබලතම නායකයන් එළියට ගිහිල්ලා ගත්තේ ඡන්ද ලක්ෂ 10යි. සජිත් කීයක් ගන්නද? වැඩිම වුණොත් ලක්ෂ 5ක් ගනී...'

මේ, රනිල්ගේ අමුතු කතාවය. අන්තිමට යූ.ඇන්.පී.ය ගත්තේ ලක්ෂ දෙකහමාරකි. සජිත් ලක්ෂ 27ක් ගත්තේය.

'එතකොට ඩී.ඇස්., ඩඩ්ලි, ජේ.ආර්. යූ.ඇන්.පී.යට හදලා දීලා ගිය ඡන්ද ලක්ෂ 25ට මොකද වුණේ...?'

ඒ ඡන්ද ආරක්ෂා කරගන්න රනිල් අසමත් විය. හැබැයි සජිත් රණසිංහ ප්‍රේමදාස යූ.ඇන්.පී.යට හදලා දීලා ගිය ඡන්ද ලක්ෂ 20 හෝ 25 සුරක්ෂිත කරගන්න සමත්වී ඇත.

'සජබය සහ යූ.ඇන්.පී.ය එකතු වුණොත් ඩී.ඇස්., ඩඩ්ලි, ජේ.ආර්.ලා හදලා දුන්න ඡන්ද එකතු කරගන්න පුළුවන්ද..?'

2020 ගෝඨා රැල්ල තිබියදී පරදින මහ ඡන්දයකදී සමගි ජන බලවේගය ඡන්ද ලක්ෂ 27ක් ගත්තේය. 2024 අනුර රැල්ල තිබියදී ජනාධිපතිවරණයේදී සජිත් ඡන්ද ලක්ෂ 43ක් දක්වා ලක්ෂ 27ක් වැඩි කරගත්තේ රනිල් ජනාධිපති වී යූ.ඇන්.පී. - සජබ ඡන්ද කඩද්දීය. ඊළඟ ජනාධිපතිවරණයකදී සමගි ජන බලවේගය මුහුණ දුන්

## අමාරු ඡන්ද දෙකකදී සජිත් ආරක්ෂා කළ ඡන්ද

අවසන් ඡන්දය වූ පුංචි ඡන්දයේදී ලබාගත් ඡන්ද ලක්ෂ 22ට තව ලක්ෂ 20ක් එකතු කරගැනීම දුෂ්කර නැත. එතැන තියෙන්නේ සුළු ජාතික ඡන්ද සහ පාවෙන ඡන්දය. දිනන්නේ කවුදැයි අවිනිශ්චිත ජනාධිපතිවරණයකදී හෝ මහ මැතිවරණයකදී ඒ ලක්ෂ 20 ගන්න එක මහ ලොකු කප්ජක් නොවේ.

ඒත් ප්‍රශ්නය ඩී.ඇස්.ලා, ඩඩ්ලිලා, ජේ.ආර්.ලා යූ.ඇන්.පී.යට හදලා දීලා ගිය ඡන්දවලට මොකද වුණේ කියන එකය.

**උපුල් ජෝශප් ප්‍රනාන්දු**



# වෙස් වළාගෙන යායුතු ගමනක්........

**රජ කාලේ රජවරුන්ට රටේ තත්ත්වය, රට වැසියන් කියන්නේ මොනවාද කියලා දැනගන්න පුරෝහිතයන්ද කේවට්ටයන්ද අන්දරේලාද ඕනේ තරම් හිටියේය. ඒ හැබැයි දුරකතන, රූපවාහිනී, සමාජ මාධ්‍ය ඇතුළු කිසිදු සන්නිවේදන මාධ්‍යයක් නොතිබූ නිසාය. ඒ නිසා අර සෙට් එක කියන ඕනෑම දෙයක් විශ්වාස කරන්න රජතුමාට සිදුවෙනවාය. හැබැයි ඉතින් මේවා ටක්කෙටම දැනගන්න බොහෝ විට රජවරු වෙස්වළාගෙන ගම් නියංගම්වල ඇවිද්දේය. ඒ යන ගමන් ලස්සන යුවතියක් නෙතට ගැටුණොත් තම අන්තඃපුරේ රැකියාවක් ලබාදීමටද අමතක කළේ නැත. පහුගිය දොහේ හිටපු ඇමැතිවරු රජතුමාගේ ඒ ක්‍රියාව නම් යසට අනුගමනය කළේය. හැබැයි අමාත්‍යාංශයට හදිසියේ නිත්‍යානුකූලව බිසව පැනපු වේලේ පුටු පෙරළන් අග බිසවට දුවන්න වුණේද සෞඛ්‍ය අමාත්‍යාංශයේය. කොහොම වුණත් රට වැසියන් කියන දේ රජතුමා කනට ගත්තේය.**

අපේ අනුර රජතුමාද දැන් 'හැම ආසනයකටම යන්න යනවා' කියලා ප්‍රවෘත්තියක් පළවී තිබුණේය. ධුර කාලයට අවුරුදු දෙකකුත් කිට්ටු වෙන්න යන නිසා දැන්මම යන එක ඇඟට ගුණය. හැබැයි ඉතින් මේ යන ගමනේ මුඛ්‍ය පරමාර්ථය 'ජාතික ජන බලවේගයේ සාමාජිකයන් මුණගැසී ඔවුන්ගේ ප්‍රශ්න විසඳීම' බව කියැවේ. හැබැයි ගොයියෝ එහෙම එවුන් හිටියේ 3%කි. දැන් ඕනේ නම් ඒක 4%ක් හෝ 5%ක් විය හැකිය. නුඹව බලයට පත්කරන්න ඡන්දය දුන් ඉතිරි 58%ම ජාතික ජන බලවේගය, හෝ ජේ.වී.පී. ඡන්දදායකයන් නොවන්නේය. නිල් පාටද කොළ පාටද ඊටත් වඩා කුරහන් පාට පිළිබඳ තවත් කිසිදු විශ්වාසයක් තැබිය නොහැකි නිසා 'මුන්ටත් දීලා බලමු' කියලා රතු පාටට ඡන්දය දුන්නේ ඒ පිරිසය.

71 රාජ්‍ය විරෝධී කුමන්ත්‍රණ, 88, 89 භීෂණය මෙන්ම නුඹලා ආවොත් රට විනාසයි, බුදු දහම විනාසයි කියමින් විරුද්ධ පාර්ශ්වය මොන තරම් වේදිකා දෙවනත් කළද ඒවා පයිසෙකට ගණන් නොගෙන නුඹ සමග 159ක්ම බලයට ගේන්න ඡන්දය දුන්නේ ඒ මිනිසුන්ය.

හැබැයි ඉතින් එහෙම කළේ දහසක් බලාපොරොත්තු ඇතුවය. ඒ ජනතා අපේක්ෂාවන් තාමත් නිසියාකාරව සිදු නොවන බව නම් නොකියාම බැරිය. රටට මොන මගුල කළත් 'බඩවියතට' හරි බෙහෙත නොදෙන්නේ නම්, ඒ ආණ්ඩුවෙන් වැඩක් නැත. නුඹේ අග්‍ර පුරෝහිතලා රොත්තක්ම ඒවාට පණ මදිය. නුඹට මේ ගම් ගානේ යන්න වෙලා තියෙන්නේ ඒ නිසාය.

හැකි නම් දින කීපයක් වෙස්වළාගෙන ත්‍රීවිලරයකට නැග ගමන් දෙක තුනක් නුඹට යා හැකි නම් රට වැසි අදහස් නිසියාකාරව නුඹේ කනටම අසාගත හැකිය. නුඹේ පුරෝහිතයන් පමණක් නොව උන්ගේ අහිංසක අම්මලාවද සිහිපත් කරන හැටි දැනගන්නට පුළුවන්ය. නුඹ නොයා හැකිනම් මහරගම ආසනය හාර නුඹේ පුරෝහිතයකුට ආසනය පුරාම නැතත් ගෙවල් කීපයකට ගියොත් හරබරට, රසබරට දැනගන්නට හැකිය. අපිරිසුදුකමේ අපායකි. මදුරු තවාන් එමටය. අලින්ටද නෑමට පුළුවන් වළවල් පාර පුරාය. 'ක්ලීන් ශ්‍රී ලංකා' උන් අහලාවත් නැති ගානය. ඒ වගේම මහනුවර නගරයට ගියහොත් ක්ලීන් ශ්‍රී ලංකාවෙන් කිලීන් වෙනවාදැයි ඇස් දෙකෙන්ම දැකගත හැකිය. රාජ්‍ය සේවය වැඩ කරන්නේ නැත්නම් වැඩ කරවා ගැනීම නුඹේ 159 වගකීමක්ය. නුඹ මේ පෙට්ටි 159 දාගෙන කෝච්චිය අදින්නේ නුඹේ තනි ඉන්ජිමෙන්ය. ඒ කියන්නේ නුඹේ පුරෝහිතලාද බොහෝ දෙනෙක් බුදිය. එක පාරක් දියවන්නා තරණය කළහොත් ඒ ඇතිය. 'හිටපු මන්ත්‍රී' කියන නාමය තිබුණොත් හොඳටම ඇති කියලා පුරෝහිතලාට හිතෙනවත් ඇතිය.

'රටේ ආර්ථිකය තව ටික දවසකින් කඩා වැටේවි...'. එහෙම කියන්නේ රනිල්ය. 'රට කරන්න දන්නේ නැහැ..'. එහෙම කියන්නේ අටවා ගත් ඒකාබද්ධ විපක්ෂයෙ විජේදාසය. 'රට විනාශ කරනවා...' පාඨලී එහෙම කියනවාය. මෙහෙම කියන්නේ කාලෙන් කාලෙට එක එක ආණ්ඩුවල ලැග දැන් යන එනමං නැතුව ඉන්නා ඇවන්ගාඩ් දාසලා වගේම රාජගිරිය කේස් යටගහන්න හැදූ ගල් අඟුරු ලීලලාය. විපක්ෂය කියන ඒවාට උත්තර බඳින්න යනවාට වඩා, ආණ්ඩුව කියන කරන දේට විපක්ෂයෙන් උත්තර ලබාගැනීමට අවස්ථාව සැලසීමයි රජය උපක්‍රමශීලීව කළ යුත්තේ. එහෙම වෙන්නේ ආණ්ඩුව තම කාර්යය හරියාකාරව හරියට කළොත් පමණය. විපක්ෂයට කට උත්තර නැති වෙන්නේ එවිටය. ආණ්ඩුව කරන්න එකෙක් දෙන්නෙක් නොව 159ම නුඹ එක්ක හරි හරියට ගමන් කළ යුතුය. දැන්වත් රූපවාහිනී සංවාදවලට යවන්න, වොයිස් කට් දෙන්න, වේදිකාවල කතා කරන්න, ප්‍රවෘත්ති සාකච්ඡා තියන්න වෙන වෙනම සෙට් එකක් හදන්න ඕනේය. 159ක් ඉන්න එකේ දහයක් පහළොවක් සොයාගැනීම නුඹට කජ්ජක්ද නොවන්නේය. මාධ්‍ය මෙහෙයුමේ ප්‍රබලත්වය වටහා ගතයුතුය. අලුත් සෙට් එක හරියට හැදුවා නම් 'අපේ රට අවුරුදු තිහක් විනාශ කළ ප්‍රභාකරන්ට දෙවියෝ' කියා කතා කරපු අර්චුනා වගේ එකෙකු තම ප්‍රධාන කථිකයා ලෙසින් ගෙන ආපු පොහොට්ටුවට වගේම 'විශ්‍රාමික සලේ මුර පදය දුන්නොත් රටේ බුද්ධි තොරතුරු එළියට එනවා' කියන දයාසිරිලාට, වීරසේකරලාට වගේම උඩු බුරන සැමට කටඋත්තර නැති වෙන්නම උත්තර දෙන්න පුළුවන්ය. පැරන්නන්ගෙන් කීප දෙනෙකුගේ මුඛයන් බැඳ ටිකක් පැත්තකින් තියෙන එක ඉදිරි ගමනට නුඹට වාසිය. මොකද නුඹේ පැරන්නෝ කියන ඇමැති මණ්ඩලයේ ඉන්න වැඩි පිරිසක් තාමත් හානවාය. හාලා නානවාය. නුඹේ වැඩ බැරිම ඩබල ලාල් සහ නාමල් දෙබෑයන්ය. වැඩ කරන්නේ කෙසේද කියා බිමල් සහ ප්‍රසන්නගෙන්වත් අනිත් සෙට් එකටම හයවැනි පන්තිය ලෙසින් කැලෑසියක් තිබ්බොත් යහපත්ය. මොකද අර පන්ති පහෙන් දැන් වැඩක් නෑ වගේ ජේන්න තියෙනවාය.

කලින් ආණ්ඩුවටත් ගෙදර යන්න පාර කැපුවේ ගොවියන් පාරට බැහැලාය. අරුන් දෙන්නා ගොවියා වෙනුවෙන් යමක් නොකළහොත් නුඹට වෙන්නෙත් ඒකමය. අද හෙටම ගොවියා පාරට බහිනවාය. යුද්ධයද දැන් නවතින සයිස් එකට ඇවිත් නිසා දැන් කඩනමින් රට පෙර තත්ත්වයට ගේන්න යුහුසුලු විය යුතුය. එහෙම වුණා නම් නුඹලා අර කිව් 'පොහොසත් රට' හැදෙන්න පුළුවන්ය. රට වටේ ගිහින් රට්ටු කියන ඒවා කන පුරා අහගෙන ආවොත් ඒකත් නුඹට පහසුය.

හැබැයි ඉතින් රට පුරාම නොගොස් සැම නාලිකාවකම.... සැම පත්තරයකම.... ප්‍රවෘත්ති වගේම, සංවාද, කියන කරන ඒවා බලලා ඒවා හරිද වැරදිද, ඒවාට ගතයුතු විසඳුම්, දියයුතු පිළිතුරු පිළිබඳ දිනපතාම අධ්‍යයනයක් කළා නම් ආයෙ රට වටේ ගිහින් මුහුණ කළු කරගන්නත් ඕනෑ නැතිය. නුඹේ මුහුණේ නම් තාමත් එදා තිබුණු අර මහන්සි, තෙහෙට්ටු පාට තියෙනවාය. ඒ මේ ගේම නුඹට තනියම අදින්න වෙලා තියෙන නිසාය.

ඒ වුණාට ඉතින් වසන්තගේ, හඳුනාගේ, විජිතගේ, හේවගේ, සමන්තගේ, ලාල්ගේ, එරංගලාගේ පමණක් නොව ටිල්වින්ගෙත් මුහුණු දැන් පට්ට ලස්සනේ බලන්න බැරුවය. අර එදා තිබුණු කවඩ පෙනුම, කීරි ගැහිච්චි මුහුණු දැන් කොහෙත්ම පේන්ඩ නැත. ඒකට කියන්නේ පින් පාට කියලාය. ඒක එහෙම වෙන්න ඕනේය. ඒකට අපි ඉරිසියා කරලා වැඩක් නොමැත. කලින් රට කරපු විමලේලා තාමත් රතු පාට මූණේ උලාගෙන ෆේෂල්වලින්ම ඉන්නවා නම් රට කරවන ඇත්තෝද ඉන්න ඕනෙ එහෙමය. හදිසියේ හරි වෙන ආණ්ඩුවක් ඇවිල්ලා කරුමෙට හරි උළු ගනින්න යන්න වුණොත් ආයේ ඉතින්, මේකප් සේදීලා පරණ ගානටම එනවාය. එහෙම නොවෙන්න වැඩ කරතියි කියලා අපි තාමත් හිතනවාය.

නුඹව අයින් කරලා ආයෙ ගේන්න එකෙක් ජේනතෙක් මානෙකවත් නොමැත. පරණ හොරු නැවත ගේන්න මිනිස්සු සූදානම්ද නැත. විපක්ෂය ආණ්ඩුව ගන්න කරන මේ දැඟලිල්ලට වඩා, අමාරුවෙන් අතට ගත්තු මේ ආණ්ඩුව කටට දාගන්න එක තියෙන්නේ නුඹේ අතේමය. නුඹෙන් මේක ගිලිහී වැටුණොතින් ලංකාවේ ඡන්ද පෝලිමට යන පිරිස දෙකෙන් පංගුවක්ම අඩුවෙනවාය. ඒ නිසා රට වටේම ගොහින් තොරතුරු ගන්න එක එක අතකින් හොඳය.

*ෂර්ලි අනිල් ද සිල්වා*

## එල්ලේ තරගාවලියෙන් ඇඹලේගොඩ විදුහලට ජයග්‍රහණයක්







**ජයග්‍රහණ මාවතේ තවත් පියවරක් ඉදිරියට තබමින් කුරුණෑගල දිස්ත්‍රික් අන්තර් යෞවන සමාජ එල්ලේ තරගාවලියේදී දිස්ත්‍රික්කයේ තෙවැනි ස්ථානය දිනාගැනීමට ඇඹලේගොඩ මහා විද්‍යාලය සමත් විය.**

ඇඹලේගොඩ මහා විද්‍යාලය දිස්ත්‍රික්කයේ පාසල් 171ක් අතරින් මලල ක්‍රීඩා තරගාවලියේ 7 වැනි ස්ථානයද දිනාගැනීමට සමත් වීම විශේෂත්වයකි.

පාසලේ ක්‍රීඩා ගුරු හා පුහුණුකරු ලෙස හිමන්ත ශනිල්ක සංදීප මහතා කටයුතු කරනු ලබයි.

*චානක රුවන්*

# නටන නැටුම් රඟන රැඟුම් ඉවත හෙළයි සෝක සුසුම්

**හැමදාමත් එකම නළුවන් පිරිසක්, එකම වේදිකාවක, අවුරුදු කිහිපයක ඇවෑමෙන් තමන් රඟපෑ චරිතය සම්පූර්ණයෙන්ම කණපිට හරවා රඟපාන අපූරු 'දේශපාලන සර්කස් එකක්' මේ දවස්වල විපක්ෂයේ මාධ්‍ය සාකච්ඡා දෙස බලන අපට නොමිලේම බලාගත හැක. බලයේ ඉන්නකොට එක රංගනයකුත්, විපක්ෂයට ආපුවාම තවත් රංගනයකුත් පෙන්වන මේ දේශපාලන නඩයේ අලුත්ම ට්‍රේලර් එක දකින විට බඩ අල්ලාගෙන හිනායෑම නතර කරගත නොහැක්කේ ඒ නිසාය.**

මතකය ටිකක් අලුත් කරගන්නට අපි 2013 වසරට යමු. එදා රටේ පළමු අගවිනිසුරුවරිය වූ ශිරාණි බණ්ඩාරනායක මහත්මියට එරෙහිව මුළු රටම පාහේ විරෝධය පාද්දී, ඇයව දෝෂාභියෝගයකින් අගවිනිසුරු පුටුවෙන් එළියට ඇද දමන්නට පෙරමුණ ගත්තේ කවුදැයි අපට අමතක නැත. අද විපක්ෂයේ සිට 'අධිකරණයේ ස්වාධීනත්වය සහ ප්‍රජාතන්ත්‍රවාදය' ගැන උගුර ලේ රහ වනතුරු කෑගසන ජී.එල්. පීරිස්, පාඨලී චම්පික සහ විමල් වීරවංශ ඇතුළු සෙට් එක එදා එකතු වී කළේ අගවිනිසුරුවරිය පන්නා දැමීමේ දේශපාලන මෙහෙයුමයි. එදා ඔවුන්ට අධිකරණයේ ස්වාධීනත්වය යනු තමන්ගේ දේශපාලන න්‍යායපත්‍රයට අනුව නටන නැටුමකි. නීතිය තමන්ට අවශ්‍ය පරිදි නවාගෙන, එදා අගවිනිසුරුවරියක පන්නා දැමීමට 'හෝයියා' කියූ මේ නඩයම, අද දෛවයේ සරදමකට මෙන් එකම මේසයක වාඩි වී, එකම මයික්‍රෆෝනයක් බෙදාගනිමින්, 'අනේ... රටේ අධිකරණයේ ස්වාධීනත්වයක් නෑ...' කියමින් රට වටේ බෙර ගසති. ලෝක දේශපාලන විද්‍යාඥයන්ටද මේවා දකින විට පිස්සු හැදෙනවා නියතය.

හාස්කම් එතැනින් නතර නොවේ. එදා තමන් බලයේ සිටිද්දී විරුද්ධවාදීන්ව දඩයම් කරන්නට, කොටු කරන්නට සහ කටවල් වසන්නට රත්තරන් නීතියක් සේ සලකා 'ත්‍රස්තවාදය වැළැක්වීමේ පනත' කර උඩ තබාගෙන ආවේද මෙන්න මේ කියන කට්ටියමය. එදා ඔවුන්ට PTA පනත යනු රට බේරාගැනීමේ මහා මෙවලමකි. හැබැයි අපේ රටේ දේශපාලකයෙක් නීතියක් හදන්නේ තමන්ට වාසි වෙනතුරු පමණි. ඔවුන් හිතාගෙන ඉන්නේ පක්ෂය හෝ විපක්ෂයේ අසුන මාරු කළාම තමන් කරපු පරණ පව් ඔක්කොම ස්වයංක්‍රීයවම 'රීසෙට්' වෙනවා කියාය. නමුත් දේශපාලන කර්මය කියන්නේ කාටවත් මගහැරිය නොහැකි දෙයකි. එදා තමන් විසින්ම මුවහත් කර පදම් කළ PTA නීතිය නමැති කඩුව, අද කැරකී අවුත් තමන්ගේම බෙල්ලට තැබෙන විට, ඔවුන්ට එය මහා ම්ලේච්ඡ, ප්‍රජාතන්ත්‍ර විරෝධී පනතක් වී ඇත. තමන් හැදූ උගුලේ තමන්ම වැටී, අද PTA හරහා අත්අඩංගුවට පත්වන විට, 'අනේ මේක මහා අසාධාරණයක්' කියමින් මාධ්‍ය සංදර්ශන පවත්වන හැටි දකින විට හිනානොවී සිටින්නේ කෙසේද?

ඇත්තටම මෙතැන තියෙන්නේ ප්‍රතිපත්තිමය ප්‍රශ්නයක් නොවේ. 'මතකය අමතක වීමේ' දේශපාලන ලෙඩකි. එදා ආණ්ඩුවේ ඉඳන් හැම ජනතා විරෝධී වැඩකටම, නීති විරෝධී දඩයමකටම 'එළකිරි' කියා අත්පුඩි ගැසූ මේ අය, අද විපක්ෂයට ආ සැණින් 'පාරිශුද්ධ උත්තමයන්' වී ඇත. ඔවුහු අද අලුත් අලුත් සංවිධාන හදති, ප්‍රජාතන්ත්‍රවාදය සුරැකීමේ පෙරමුණු අස්සන් කරති, ආණ්ඩුවට විරුද්ධව ක්‍රියාත්මක වෙති. බලයේ සිටිද්දී රටට කරපු විනාශය, නීතිය නැමූ හැටි, සහ ගත්තු තීන්දු තීරණවල පව් ඔක්කොම විපක්ෂයේ අසුනක වාඩි වූ සැණින් හෝදිලා ගිහිල්ලා දැයි අප දන්නේ නැත. වයසින් මුහුකුරා ගියත්, මොළයේ වර්ධනය ආපස්සට ගොස් තමන් එදා කළේ කුමක්දැයි මතක නැති 'බබාලා' වී ඇති සෙයකි.

බල ලෝභයෙන් සහ අවස්ථාවාදයෙන් කුණු වී ගිය දේශපාලනඥයකුගේ 'ප්‍රතිපත්තිය සහ දේශපාලන න්‍යාය පත්‍රය' කිසිදා මාරු කළ නොහැක. එදා තමන් බලයේ සිටිද්දී පැදවූ 'මර්දන' රෝදයම අද තමන් දෙසට කැරකී එන විට හඬාවැටීම විහිළුවකි. බලයේ ඉන්නකොට වැදගත් වෙන්නේ තමන්ගේ බලය රැකගැනීම පමණක් වුවත්, විපක්ෂයට ආපුවාම නීතියේ ආධිපත්‍යය ගැන මතක් වීම පුදුමසහගතය.

ගරු මන්ත්‍රීවරුනි, ඔබලා විපක්ෂයට වී මොන වීර කතා කීවත්, මොන සංවිධාන හැදුවත්, මේ රටේ ජනතාවට දැන් ඔබලාගේ මේ 'ඩබල් ගේම්' සහ දේශපාලන සෙල්ලම් ගැන හොඳ 'මීටරයක්' ඇත. එදා ඔබලා වැපිරූ දේ අද ඔබලාටම නෙළාගන්නට සිදුවී ඇති බව වටහාගෙන, තවත් රූපවාහිනී කැමරා ඉදිරියේ විහිළු සපයන්නේ නැතිව සිටීම ඔබලාට මෙන්ම රටටද කරන ලොකුම යහපතකි. නැත්නම්, ඔබලාගේ මේ ව්‍යාජ ප්‍රජාතන්ත්‍රවාදී වෙස්මූණු විතරක් නෙවෙයි, නැවත දේශපාලන වේදිකාවට ඒමට තබා ඇති බලාපොරොත්තු පවා සදහටම අකාමකා දමනු නියතය.

රතේ!

# AIA උසස් අධ්‍යාපන ශිෂ්‍යත්ව වැඩසටහන

## මෙරට දීප්තිමත්ම සිසු දරු දැරියන් 750කට අධික ප්‍රමාණයක් සවිබල ගන්වමින් 31 වැනි සංවත්සරය සමරයි



AIA ඉන්ෂුවරන්ස් ලංකා, ශ්‍රී ලංකාවේ වැඩිම කාලයක් අඛණ්ඩව පවත්වාගෙන යන සමාජ සත්කාරක වැඩසටහනක් වන AIA උසස් අධ්‍යාපන ශිෂ්‍යත්ව වැඩසටහනෙහි 31 වැනි වසර නොබෝදා මහත් අභිමානයෙන් සමරන ලදී. 2018 වසරේ 5 වසර ශිෂ්‍යත්වයෙන් දිස්ත්‍රික් මට්ටමින් වැඩිම ලකුණු ලබාගත් ශිෂ්‍ය ශිෂ්‍යාවන් මෙවර ශිෂ්‍යත්ව ප්‍රතිලාභ වැඩසටහනට සහභාගි වී සිටි අතර, ඔවුන් 25 වැනි AIA උසස් අධ්‍යාපන ශිෂ්‍යත්වලාභී කණ්ඩායමයි. එමෙන්ම මෙම ශිෂ්‍ය ශිෂ්‍යාවන් පිරිස මේ වසරේදී උසස් පෙළ අධ්‍යාපන කටයුතු සඳහා පිවිස සිටියි. මෙම ශිෂ්‍යත්ව පිරිනැමීමේ වැඩසටහන කොළඹ සිනමන් ලේක්සයිඩ් හෝටලයේදී මෙවරත් අතිඋත්කර්ෂවත් අයුරින් පවත්වන ලදී.

1994 වසරේ දී ආරම්භ කරන ලද AIA උසස් අධ්‍යාපන ශිෂ්‍යත්ව වැඩසටහන දියත් කරන ලද්දේ දිවයින පුරා විසිර සිටින වඩාත්ම දීප්තිමත් ශිෂ්‍ය ශිෂ්‍යාවන් ඇගයීමට මෙන්ම ඔවුන්ගේ අධ්‍යාපන කටයුතු සඳහා අත්වැලක් සැපයීමටත්ය. සෑම වසරකම 5 වසර ශිෂ්‍යත්වයෙන් දිස්ත්‍රික්ක මට්ටමින් වැඩිම ලකුණු ලබාගන්නා ශිෂ්‍යයා හෝ ශිෂ්‍යාවට මෙම ශිෂ්‍යත්වය හිමි වේ. මෙහිදී විශේෂ කරුණ වන්නේ AIA උසස් අධ්‍යාපන ශිෂ්‍යත්වයට හිමිකම් කීමට එම දරුවන්ගේ දෙමාපියන්හට AIA හි රක්ෂණයක් තිබීම අත්‍යාවශ්‍ය නොවීමයි. මෙම ශිෂ්‍යත්වලාභීන් උසස් පෙළට පිවිසිදා සිට ඔවුන් විශ්වවිද්‍යාල අධ්‍යාපනය අවසන් කරන තුරු මෙම ශිෂ්‍යත්ව ප්‍රතිලාභ මුදල් මාසික මුදල් ආධාරකයක් ලෙස ඔවුන්ට හිමි වේ.

මෙම උත්සවයට ප්‍රධාන ආරාධිත අමුත්තා ලෙස සහභාගි වූ විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාවේ හිටපු සභාපති වන මහාචාර්ය සම්පත් අමරතුංග මහතා ශිෂ්‍යත්වලාභී දරුදැරියන් අමතමින් කියා සිටියේ ජාතික සංවර්ධනය සඳහා අධ්‍යාපනය ඉතාමත් වැදගත් බවත් තිරසාරව ලබාදෙනු ලබන ආයතනික සහාය ඔස්සේ අප රටේ ඉදිරි පරපුර වඩාත් සවිබල ගැන්වෙනු ඇති බවත්ය.

මෙම උත්සවයේදී ශිෂ්‍යත්වලාභී සිසු දරුවෙක් සභාව අමතා AIA වෙත සිය කෘතඥතාව පළකරමින් 'අප සැමට අවශ්‍යම මොහොතේ දී අප ගැන විශ්වාසය තබා AIA අපට මෙලෙස උදව් කිරීමට ඉදිරිපත්ව ඇති අතර අපි සියලු දෙනා ඒ වෙනුවෙන් හොඳින් අපගේ අධ්‍යාපන කටයුතු කරගෙන යාමටත්, ඒ වගේම ඔවුන් අප මත තැබූ විශ්වාසයට ගරුකරමින් අනාගතයේ දී දිනක අපගේ රටට ධනාත්මකව දායකත්වය ලබාදීමටත් අධිෂ්ඨාන කරගමු...' යනුවෙන් කියා සිටියේය.

පසුගිය වසර 31ක පුරාවට 750 වඩා ශිෂ්‍ය ශිෂ්‍යාවන් පිරිසකට මෙම වැඩසටහන ඔස්සේ අප සහාය ලබාදී ඇති අතර, එම ශිෂ්‍යත්වලාභීන් මේ වනවිට වෛද්‍ය, නීති, ඉංජිනේරු යන වෘත්තීන්වල වගේම රාජ්‍ය සේවකයන් සහ අධ්‍යාපනඥයන් ලෙස සේවය කරමින් ශ්‍රී ලංකාවේ ප්‍රගමනය වෙනුවෙන් සිය දායකත්වය ලබාදෙමින් සිටියි. මෙමගින් පිළිබිඹු වන්නේ අර්ථවත් වූ ආයතනික සමාජ සද්කාර්ය මෙහෙවර ඔස්සේ කළ හැකි ධනාත්මක බලපෑම සහ අනාගත නායකයන් ගොඩනැගීම සඳහා අධ්‍යාපනය ඔස්සේ ජනනය කළ හැකි පරිවර්තනීය ශක්තියයි.

2024 වසරේ ශ්‍රී ලංකා ජනලේඛන සහ සංඛ්‍යාලේඛන දෙපාර්තමේන්තුවේ දත්ත වාර්තාවලට අනුව දැනට ශ්‍රී ලංකාවේ සාක්ෂරතාව 97.4%ක් එනම් දකුණු ආසියාවේ ඉහළම මට්ටමක පවතින බව කියමින් අපි උදම් ඇනුවද, ද්විතීයික අධ්‍යාපනය සඳහා ලියාපදිංචි වන ඉතාමත් ඉහළ ප්‍රතිශතයක් වන දරුවන් සංඛ්‍යාවෙන් තෘතීයික අධ්‍යාපනය සඳහා ඉදිරියට යන ප්‍රතිශතය වන්නේ 21% පමණි. මෙය ගෝලීය සාමාන්‍යයට වඩා විශාල වශයෙන් අඩු සංඛ්‍යාවක් වීම කනගාටුදායක කරුණකි (UNICEF, 2021). මෙම දත්තවලට අනුව පවතින විසමතාවය හඳුනාගෙන දක්ෂතා පෙන්වන දරුවන් හට ඔවුන් මුහුණ දෙන්නා වූ බාධක මැඩ ගනිමින් උසස් අධ්‍යාපනය කරගෙන යාම සඳහා අත්වැලක් සපයා දීම සිදුවිය යුතුය. AIA උසස් අධ්‍යාපන ශිෂ්‍යත්වය මෙම ගැටලුව දශක තුනකට පෙර හඳුනාගෙන ඒ සඳහා දියත් කර ඇති කදිම විසඳුමකි.

ශ්‍රී ලාංකික ජනතාවට සුවපත්, සැපවත්, දිගුකල් ජීවිතයක් ළඟා කරගැනීම සඳහා සහාය වීම යන AIA හි සන්නාම අරමුණට සැබෑ අරුතක් එක්කරමින් මෙලෙස අධ්‍යාපනය වෙනුවෙන් සහාය වීම දැයේ අනාගතය භාරගැනීමට සිටින දක්ෂ දරුවන්ට වඩාත් හොඳ ජීවිතයක් උදාකර ගැනීම සඳහා සවිබලය ලබා දීමකි. AIA උසස් අධ්‍යාපන ශිෂ්‍යත්ව වැඩසටහන සිය 31 වැනි සංවත්සරය සමරන මේ වසරේ AIA ඉන්ෂුවරන්ස් ලංකා, ශක්තිමත් වූ ශ්‍රී ලංකාවක් ගොඩනැගීමේ අපේක්ෂාවෙන් තවදුරටත් මෙරට තරුණ ජවය වෙනුවෙන් ආයෝජනය කිරීමට කැපව කටයුතු කරනු ඇති.

AIA ඉන්ෂුවරන්ස් ලංකා ලිමිටඩ් යනු ශ්‍රී ලංකා රක්ෂණ නියාමන කොමිෂන් සභාවේ බලපත්‍රලාභී රක්ෂණ සමාගමකි.





රාජ්‍ය රහස්

# පැය එකහමාරේ රනිල් - සජිත් සාකච්ඡාව

## සජිතුයි රනිලුයි

**'මව්රට' පුවත්පතේ 'රාජ්‍ය රහස්' තීරය ආරම්භ කළ දා සිටම සමගි ජන බලවේගයේ සහ එක්සත් ජාතික පක්ෂයේ පාක්ෂිකයන් ඉතා ඕනෑකමින් යුතුව එහි ඇති සියලු තොරතුරු කියවන බව පසුගිය කාලය පුරාම අපට ලැබුණු ප්‍රතිචාර අනුව අප වටහාගෙන ඇති කාරණයකි. ඒ අනුව ඔවුන් ආරම්භයේ සිටම පුළුපුලා බලා සිටියේ සමගි ජන බලවේගය සහ එක්සත් ජාතික පක්ෂය නිල වශයෙන් එකතු වන දිනය කවදාද යන්න පිළිබඳවය.**

අවස්ථා කිහිපයකදීම පක්ෂ දෙක මගින්ම විවිධ කමිටු පත්කරමින් සහ විවිධ සාකච්ඡා ආරම්භ කරමින් ඒ සඳහා යම් උත්සාහයක් දැරුවද ඒ කිසිදු අවස්ථාවක ඒවා විවිධ හේතු මත සාර්ථක අවසානයක් කරා ඇදී ගියේ නැත. ඊට හේතු වූයේ සජබ නියෝජිත කණ්ඩායම් ඒ සඳහා අවංක උත්සාහයක් දැරුවද එක්සත් ජාතික පක්ෂයේ දෙතුන් දෙනකු විසින් ඒ ඇතිවීමට නියමිතව තිබූ සමගිය කඩා බිඳදමින් කටයුතු කරනු ලැබීම නිසාය.

නමුත් ආණ්ඩු බලයක් ලබාගෙන දේශපාලන ජයග්‍රහණයක් කිරීමට නම් මේ පක්ෂ දෙක නියත වශයෙන්ම එකතු විය යුතු බවට පක්ෂ දෙකේම නායකයන්ගෙන් සහ පාක්ෂිකයන්ගෙන් ඉදිරිපත් වූ යෝජනා මත විපක්ෂ නායක සහ සජබ නායක සජිත් ප්‍රේමදාස මහතා අවසානයේදී එම සාකච්ඡා තමන් යටතට ගැනීමට පියවර ගත්තේය. ඒ අනුව සජිත් සජබය සහ එජාපය එකතු කරන කාර්යය මුලින්ම ආරම්භ කළේ එජාපයේ දෙවැනි පෙළ තරුණ නායකයන් සමග කොළඹ ටාජ් සමුද්‍රා හෝටලයේ කලම්බෝ ක්ලබ්හිදී නව සාකච්ඡා වටයක් ආරම්භ කරමින්ය. ඒ අනුව මුලින්ම සජිත් එජාපයේ නියෝජ්‍ය නායක රුවන් විජේවර්ධන, උපනායක අකිල විරාජ් කාරියවසම් සහ උපසභාපති නවීන් දිසානායක යන මහත්වරුන් හමුවී සාකච්ඡා පැවැත්වීමට පියවර ගත්තේය. එම සාකච්ඡා වටය සාර්ථකව අවසන් කිරීමෙන් පසුව සජිත් සහ සජබ මහලේකම් රංජිත් මද්දුමබණ්ඩාර එජාප මහලේකම්වරිය වූ තලතා අතුකෝරාල මහත්මිය සමග ටාජ් සමුද්‍රා හෝටලයේ කලම්බෝ ක්ලබ්හිදීම තවත් සාකච්ඡා වටයක් පැවැත්වීමට පියවර ගත්හ. එයද සාර්ථක අවසානයක් කරා ගෙන යෑමට සමත් වීමෙන් පසු එජාපයේ ජාතික සංවිධායකවරයා වූ සාගල රත්නායක සමගද සජිත් ටාජ් සමුද්‍රා හෝටලයේ තවත් සාකච්ඡා වටයක් පැවැත්වීමට පියවර ගත්තේය. ඒ අනුව එම සාකච්ඡා වට තුන සාර්ථකව අවසන් කිරීමෙන් පසුව 'මව්රට' 'රාජ්‍ය රහස්' තීරය පළමු වතාවට මෙම හමුවීම් සම්බන්ධයෙන් සහ සාකච්ඡා කළ කරුණු සම්බන්ධයෙන් විශේෂ අනාවරණයක් සිදුකිරීමට පියවර ගත්තේය. ඒ අනුව ලක්ෂසංඛ්‍යාත වූ සජබ පාක්ෂිකයනුත්, එජාප පාක්ෂිකයනුත් විශාල බලාපොරොත්තු දල්වාගෙන පක්ෂ දෙක නිල වශයෙන් එක්වන දිනය පිළිබඳ සිහින මැවූ ආකාරයක් දැකගත හැකි විය.

මේ ආකාරයට පක්ෂ දෙක එකමුතු කරන කාර්යය පියවරෙන් පියවර ක්‍රමක්‍රමයෙන් සජිත් විසින් ඉදිරියට ගෙනයනු ලබද්දී එය කඩාබිඳ දැමීමට උත්සාහ කළ පිරිස්ද එජාපය ඇතුළේ නොසිටියා නොවේ. ඇතැම් විට රනිල් - වජිර පාර්ශ්වයම මෙම එකමුතුව කඩාබිඳ දැමීම සඳහා විවිධ කුමන්ත්‍රණ කළ ආකාරය 'රාජ්‍ය රහස්' තීරය හරහා සජබ සහ එජාප පාක්ෂිකයන් දැනුවත් කිරීමට අපි පියවර ගත්තෙමු. ඒ සඳහා සජබයෙන් දොට්ට දැමූ අජිත් මාන්නප්පෙරුම ඇතුළු පරාජිත දේශපාලනඥයන් කිහිප දෙනකු යොදවාගෙන සජිත්ට සහ සජබයට ප්‍රහාර එල්ල කිරීමට කටයුතු කළ ආකාරයද අප වරින් වර වාර්තා කළෙමු. විශේෂයෙන්ම ජී.එල්. පීරිස් මහතාගේ නිවසේ විවිධ සාකච්ඡා පැවැත්වීමෙන් අනතුරුව මාන්නප්පෙරුම යොදාගෙන සජිත්ට පහරදීමට සැලසුම් කළ කුමන්ත්‍රණ පිළිබඳවද අපි මෙම තීරයෙන් වාර්තා කර සිටියෙමු. මේ සියලු සැලසුම් හරහා එජාපයේ සිටින දෙතුන් දෙනකු උත්සාහ කළේ පක්ෂ දෙක අතර ගොඩනැගෙමින් පැවැති එකමුතුව තමන්ගේ ඉතා පටු අරමුණු මුල් කරගෙන කඩා බිඳදැමීමටය.

## කබීර් - රංජිත් - ලකී රනිල් හමුවේ

**කෙසේ වෙතත් මෙම තොරතුරු සියල්ල වාර්තා කළ අප මෙවර 'රාජ්‍ය රහස්' තීරය ඔස්සේ හෙළිදරව් කිරීමට සූදානම් වන්නේ සමගි ජන බලවේගයේ සහ එක්සත් ජාතික පක්ෂයේ පාක්ෂිකයන්ට බොහෝ සතුටු විය හැකි, උද්දාමයට පත්විය හැකි අතිශය ජයග්‍රාහී පුවතක්ය. ඒ, කිසිවකුටත් නොදැනෙන්නට අතිශය රහසිගත ලෙස සජබය සහ එජාපය එකතු කිරීම සඳහා පැවැත්වූ ඉහළ පෙළේ සාකච්ඡා වට දෙකක් පිළිබඳවය.**

ඉන් පළමු සාකච්ඡාව පැවැත්වුණේ එජාප නායක රනිල් වික්‍රමසිංහ මහතා සහ සමගි ජන බලවේගයේ ඉහළම නියෝජිතයන් තිදෙනකු අතරය.

සාකච්ඡාව සඳහා පසුබිම සකස් වීමෙන් අනතුරුව එය පැවැත්වීමට තීරණය වූයේ රනිල්ගේ කොල්ලුපිටිය 5 වැනි පටුමගේ පිහිටි නිවසේදීය. දිනය ලෙස තීරණය වූයේ පසුගිය සෙනසුරාදා රාත්‍රියේය. ඒ අනුව වැඩි සද්ද බද්දයකින් තොරව මේ සාකච්ඡාවට සජබය නියෝජනය කරමින් සහභාගි වූයේ පක්ෂ මහලේකම් රංජිත් මද්දුමබණ්ඩාර, පක්ෂ සභාපති කබීර් හෂීම් සහ සජිත්ගේ සමීප මිත්‍රයකු වූ ලකී ෆොන්සේකාය. සජබයෙන් නියෝජිතයන් තිදෙනකු සාකච්ඡා මේසයේ අසුන් ගන්නා විට එජාපය වෙනුවෙන් රනිල් තනිවම එම සාකච්ඡාවට සහභාගි වී සිටීම විශේෂ සිදුවීමක් විය. පැය එකහමාරක් පුරා පැවැති මෙම දීර්ඝ සාකච්ඡාව සම්බන්ධයෙන් සියලු තොරතුරු අප සතුව නැතත්, යම් යම් විශ්වාසකටයුතු ආරංචි මාර්ග අනුව පක්ෂ දෙක එකතු වීම පිළිබඳවත්, සන්ධානයක් ආකාරයට කටයුතු කරන ආකාරය පිළිබඳවත්, වෙන් වෙන්ව සටන් කළ යුතු ආකාරය පිළිබඳවත්, තීරණාත්මක අවස්ථාවේදී එක්ව ගමන් කළ යුතු ආකාරය පිළිබඳවත් පුළුල්ව සාකච්ඡා වී ඇති බවක් දැනගන්නට ඇත. මීට අමතරව මෙම සාකච්ඡාවේ ප්‍රධානම අරමුණ වී තිබුණේ පක්ෂ දෙකේ නායකයන් වූ සජිත් සහ රනිල් අතර මුහුණට මුහුණ හමුවක් පැවැත්වීම පිළිබඳවය. ඒ සම්බන්ධයෙන් රනිල්ගෙන් එම යෝජනාව ඉදිරිපත් වී තිබුණේ මීට මාස ගණනාවකට පෙරාතුව සිටමය. ඒ අනුව එහිදී තීරණය වී තිබුණේ ඊට පසු දිනම, එනම් ඉරිදා දිනයේදී සජිත් සහ රනිල් අතර මුහුණට මුහුණ හමුවක් පැවැත්වීමටය. මේ සම්බන්ධයෙන් සජිත් සමග සාකච්ඡා කොට දැනුම් දීමක් කළ හැකි බව සජබය පාර්ශ්වයෙන් රනිල්ට දැනුම් දීමට කටයුතු කොට තිබිණි.

ඒ සමගම මෙම සාකච්ඡාව සම්බන්ධයෙන් තහවරු නොකළ තවත් පුවතක්ද 'රාජ්‍ය රහස්' තීරය මගින් අනාවරණ කිරීමට අප සූදානම්ය. ඒ, පක්ෂ දෙක එකතු කිරීම යථාර්ථයක් වීමට පැවැති ප්‍රධාන බාධකය වූ නායකත්වය සම්බන්ධයෙන්ද රනිල් හා කබීර්, රංජිත්, ලකී අතර සාකච්ඡා වෙද්දී ඉතා සුබවාදී අදහසක් ඉදිරිපත් වී ඇති බවය. ඒ අනුව ඉදිරි සාකච්ඡා වටවලදී නායකත්වය සම්බන්ධයෙන් කිසිදු ගැටලුවක් ඇති නොවන ආකාරයේ නිල නොවන ආකාරයේ එකඟතාවක්ද මෙම සාකච්ඡාවලදී ඇති කරගෙන ඇති බවද 'රාජ්‍ය රහස්' තීරයට ආරංචිය.

රනිල් සමග පැවැති මෙම පළමු සාකච්ඡාව සාර්ථකව අවසන් වීමත් සමග කබීර්, රංජිත් සහ ලකී යන තිදෙනාම මුලින්ම පැමිණියේ විපක්ෂ නායක කාර්යාලයටය. ඒ, සාකච්ඡාව සම්බන්ධයෙන් සජිත්ට තොරතුරු වාර්තා කිරීම සඳහාය. ඒ අනුව, තිදෙනාම සාකච්ඡාවේ මුල සිටම කතාබහට ලක්වූ කරුණු එකින් එක පිළිබඳ සජිත්ව දැනුවත් කිරීමට පියවර ගත්හ. එමෙන්ම සජිත් සහ රනිල් අතර හමුවක් ඉරිදා දිනයේදී පැවැත්වීමේ යෝජනාවක් ඉදිරිපත් වූ බවද ඔවුහු සජිත්ට දැනුම්දී සිටියහ. එහිදී රනිල් හමුවී සාකච්ඡා පවත්වන ස්ථානය පිළිබඳවද යම් ගැටලුවක් මතුව තිබිණ. ඒ සඳහා ස්වාධීන ස්ථාන කිහිපයකම නම් යෝජනා වෙද්දී සජිත් පැහැදිලිවම පිරිසට දැනුම් දී සිටියේ මේ වනවිට රනිල් ශල්‍යකර්මයකට භාජනය වීමෙන් අනතුරුව විවේක සුවයෙන් කල් ගතකරන නිසා වෙනත් ස්ථානවලට රනිල්ව ගෙන්වා ගැනීම ඔහුගේ සෞඛ්‍යයට හිතකර නොවනු ඇති බවත්, එම නිසා රනිල්ගේ නිවසටම ගොස් මේ සම්බන්ධයෙන් සාකච්ඡා කිරීමට තමන් සූදානම් බවත්ය. නමුත් කල්තියා යොදාගත් වැඩකටයුතු කිහිපයක් හේතුවෙන් ඉරිදා දිනයේදී එම සාකච්ඡාව පැවැත්වීමට යම් අපහසුතාවක් මතුව ඇති බවද සජිත් පිරිසට දැනුම් දී සිටියේය. නමුත් බදාදා රාත්‍රියේදී එම සාකච්ඡාව පැවැත්විය හැකි බවද සජිත් කබීර්ටත්, රංජිත්ටත්, ලකීටත් සඳහන් කර සිටියේය. ඒ අනුව දිනය සහ වේලාව සම්බන්ධයෙන් නැවතත් සජබ නියෝජිතයන් රනිල් සමග සාකච්ඡා කරද්දී රනිල් දැනුම් දී සිටියේ එසේනම් බදාදා රාත්‍රී 7.30ට සිය නිවසේදී සජිත් හමුවී සාකච්ඡා කිරීමට තමන් සූදානම් බවකි. ඒ බව සජිත්ටද දැනුම් දීමෙන් අනතුරුව සාකච්ඡාව ස්ථිර කරගැනීමට සජබ නියෝජිතයෝ සමත් වූහ.

## සජිත් රනිල්ගේ ගෙදරට

**ඒ අනුව පසුගිය බදාදා දිනයේදී හරියටම රාත්‍රී 7.30ට සජිත් කොල්ලුපිටියේ 5 වැනි පටුමගේ පිහිටි රනිල්ගේ නිවසට යෑමට පියවර ගත්තේය. පසුගිය කාලය පුරාම සජිත් සහ රනිල් අතර යම් යම් දේශපාලන මතගැටුම් තිබුණද මෙම හමුවේදී ඒ කිසිදු දේශපාලන මතගැටුමක් සාකච්ඡා සඳහා බාධකයක් වූ ආකාරයක් දැකගන්නට නොලැබුණේ ආරම්භයේ සිටම ඉතා සුහදශීලී අයුරින් එය ඉදිරියට ගලාගෙන යෑම හේතුකොට ගෙනය.**

ඒ අනුව පළමුවෙන්ම සජිත් රනිල්ගෙන් විමසා සිටියේ හෘදය සැත්කමෙන් අනතුරුව ඔහුගේ සෞඛ්‍ය තත්ත්වය පිළිබඳවය. ඒ සම්බන්ධයෙන් දීර්ඝ වේලාවක් කතාබහ කිරීමෙන් අනතුරුව රනිල් පසුගිය අරගල සමයේදී යම් යම් පාර්ශ්වයන් මගින් සිය නිවසට ගිනිතැබීමෙන් අනතුරුව විනාශයට පත්වූ තමන්ගේ පෞද්ගලික පොත්පත් එකතුව සජිත්ට පෙන්වීමට කටයුතු කළේය. එම ගින්නෙන් තමන් සතුව තිබූ අතිශය වටිනා කියන පොත්පත් රැසක් නම්වලින්ම සඳහන් කළ රනිල්, අවසානයේදී තමන්ට ඉතිරි වූයේ මේ පොත්පත් කිහිපය පමණක් බව සිය පෞද්ගලික පුස්තකාලය පෙන්වමින් සජිත්ට කියා සිටියේය. ඉන් අනතුරුව සාකච්ඡා මේසයේදී තවත් කරුණු කිහිපයක් සම්බන්ධයෙන්ම මෙහිදී දෙදෙනා අතර අදහස් හුවමාරු වී තිබූ ආකාරයක් දැකගත හැකි විය.

## මේකත් කඩාකප්පල් කරයිද?

**ඒ අනුව ලක්ෂසංඛ්‍යාත සජබ සහ එජාප පාක්ෂිකයන්ට අප මෙවර තහවුරු කොට සිටින්නේ පක්ෂ දෙක එකතු කිරීම සම්බන්ධයෙන් සජබය සහ එජාපය අතර පැවැති මෙම සාකච්ඡා දෙකම ඉතා සුබවාදීව අවසන් වී ඇති බවකි. කෙසේ වෙතත් පක්ෂ දෙක එකතු කිරීම සඳහා මෙවැනිම ආකාරයේ ස්වර්ණමය අවස්ථාවක් මීට පෙරද රනිල් සහ සජිත් අතර මතුවිය.**

ඒ, දූෂණ චෝදනා මත රනිල් අත්අඩංගුවට ගැනීමෙන් අනතුරුවය. ඒ අවස්ථාවේදී සජිත් පරණ දේශපාලන තරහමරහා, මතගැටුම් සියල්ල පසෙක දමා රනිල් වෙනුවෙන් කොන්දේසි විරහිතව පෙනී සිටීමට තීරණය කළේය. එමෙන්ම සිය පක්ෂය වූ සජබයද සම්පූර්ණයෙන්ම රනිල් බේරාගැනීම සඳහා යොමු කිරීමටද සජිත් පියවර ගත්තේය. අත්අඩංගුවට ගැනීමෙන් අනතුරුව සජිත් දිනපතාම පාහේ වැලිකඩ බන්ධනාගාරයට ගොස් රනිල්ගේ තත්ත්වය සොයා බැලීය. ඉන් අනතුරුව රනිල් ජාතික රෝහලට ඇතුළත් කිරීමෙන් අනතුරුවද දිනපතාම උදේ සවස යමින් රනිල්ගේ සුවදුක් විමසීමට සජිත් පියවර ගත්තේය. සජිත් එය කළේ වංක හෝ ව්‍යාජ අරමුණකින් නොව ඉතාම අවංක අරමුණකින් බව පක්ෂ දෙකේ සියලු දෙනාම ඒ වනවිටත් වටහාගෙන සිටියේය. අවසානයේදී රනිල් සමග සිටින පාක්ෂිකයන් දහ දෙනකු හෝ සොයාගැනීමට නොහැකි යම් යම් දේශපාලන පක්ෂ පසෙකට වද්දී රනිල් වෙනුවෙන් දහස් සංඛ්‍යාත පාක්ෂිකයන් කොළඹට ගෙන්වා රනිල්ට ශක්තියක් දීමටද සජිත් පියවර ගත්තේය.

මේ ආකාරයට සජිත් ඉතා අවංකව රනිල් වෙනුවෙන් පෙනී සිටියද රනිල් සහ සජිත් අතර ජාතික රෝහලේදී සිදුවූ අවසාන හමුවේදී රනිල් කළේ සජිත්වද අත්අඩංගුවට ගැනීමේ සූදානමක් ඇති බව කියමින් සජිත්ව බිය වැද්දීමට උත්සාහ කිරීමය. එමෙන්ම රනිල්ගේ පවුලට අයත් පුවත්පත් ඔස්සේ සජිත් අත්අඩංගුවට පත්වීමේ සූදානමක් ඇති බව කියමින් සජිත්ව අපහසුතාවට පත්කිරීමටද රනිල්ගේ 'නිවුස් ප්ලාන්ට් කල්ලිය' පියවර ගත්හ. ඒ හරහා රනිල් පාර්ශ්වයේ සැලසුම වී තිබුණේ දිගට හරහට සජිත්ට පහරදී, සජිත් බියවද්දා එජාපයේ සහ රනිල්ගේ දෙපතුල ළඟට ගෙන්වා ගැනීමටය. නමුත් 'මව්රට' මෙම කුමන්ත්‍රණය මුල සිටම 'රාජ්‍ය රහස්' තීරය ඔස්සේ හෙළිදරව් කිරීමට කටයුතු කිරීම නිසාම රනිල් සහ රනිල් සමග සිටින කුමන්ත්‍රණකාරී දෙතුන් දෙනකුගේ කල්ලිය දියත් කිරීමට සූදානම් කොට තිබූ දේශපාලන මෙහෙයුම ආපසු කැරකී ගිය ආකාරයක් දැකගත හැකි විය.

ඒ අනුව අප ඉදිරියේදී රනිල් සමග සිටින මේ 'නිවුස් ප්ලාන්ට් කල්ලිය' සම්බන්ධයෙන්ද නම් ගම් සහිතව විශේෂ අනාවරණයක් කිරීමට සූදානම්ය. මේ ආකාරයේ සජබය සහ සජිත් අපහසුතාවට පත්කරමින් බොරු පුවත් පළකිරීමට කටයුතු කළේ කවුද, ඒ සඳහා මුදල් ලබාදුන්නේ කවුරුන් විසින්ද, එමෙන්ම මුදල් ගෙවා එම ව්‍යාජ පුවත්වලට ප්‍රසිද්ධිය දුන් යූටියුබ් මාධ්‍යවේදීන් සහ සමාජ මාධ්‍යවේදීන් කවුද යනාදී වශයෙන් ඉදිරි සිදුවීමකදී එම සියලු දෙනාගේම තොරතුරු එම හෙළිදරව්වේදී රටට ඉදිරිපත් කිරීමටද අප සූදානම්ය.

එදා අප එම කුමන්ත්‍රණ පිළිබඳ සඳහන් කළ ආකාරයටම සජබය සහ එජාපය අතර ගොඩනැගෙමින් පවතින මෙම අලුත් සබඳතාව පිළිබඳවත්, සජිත් සහ රනිල් අතර සිදුවූ සුබවාදී සාකච්ඡාවේ ඉදිරිය පිළිබඳවත් එදා වගේම අදද තොරතුරු වාර්තා කිරීමට කටයුතු කරන්නෙමු. නමුත් දැන් අප බලා සිටින්නේ රනිල් සහ සජිත් අතර පැවැති මෙම හමුව සම්බන්ධයෙන් මෙම නිවුස් ප්ලාන්ට් කල්ලිය ක්‍රියාත්මක වන ආකාරය පිළිබඳවය. යම් හෙයකින් මෙම නිවුස් ප්ලාන්ට් කල්ලිය මෙම රනිල්-සජිත් හමුව පිළිබඳ වෙනදා මෙන්ම අසත්‍ය පුවත් යම් යම් මාධ්‍ය හරහා රටට ගෙන යෑමට කටයුතු කිරීමට උත්සාහ කරන්නේ නම් අන්න ඒ අවස්ථාවේදී සජිත් සහ රනිල් හමුවේ සාකච්ඡා වූ සියලු සත්‍ය තොරතුරු රටට ඉදිරිපත් කිරීම අප සූදානම් බවද මෙහිදී කිව යුතුය. එමෙන්ම එජාපයේ වජිර ඇතුළු දෙතුන් දෙනකු හැසිරෙන ආකාරය පිළිබඳවත්, ඒකාබද්ධ විපක්ෂය නමැති බෝඩ් ලෑල්ලි පිටුපස සිට සිදුකරන දේශපාලන කුමන්ත්‍රණ පිළිබඳවත් විශාල තොරතුරු රැසක් රටට හෙළිදරව් කිරීමට 'රාජ්‍ය රහස්' තීරය කටයුතු කරන බවද මෙහිදී සඳහන් කර සිටිමු.

## හැබැයි සජිත් පරෙස්සම් වෙන්න

**කෙසේ වෙතත් මෙහිදී තවත් එක් විශේෂ කාරණාවක්ද අවසන් වශයෙන් මෙහි සටහන් කර තැබීමට අප සූදානම්ය. ඒ, සජබ - එජාප සාම සාකච්ඡාවලදී එජාපයේ කකුලෙන් අදින්නන්ගෙන් පමණක් නොව සජබය ඇතුළේ සිටින ප්‍රබලයකුගෙන්ද සජිත් ප්‍රවේසම් විය යුතු බවය.**

මන්ද යත් අපට ඇති තොරතුරුවලින් නම් කියැවෙන්නේ මේ සජබ ප්‍රබලයා එජාපයේ සිටින සජබ-එජාප එකමුතුව කඩන ලොකුම භූතයකු සමග සමීප සබඳකම් පවත්වන බවකි. ඔහුව නිතර නිතර හමුවන බවකි. එමෙන්ම තවත් එජාප ප්‍රබලයකු නිතර නිතර හමුවී මේ සජබ ප්‍රබලයා සාකච්ඡා පවත්වමින් සිටින බවක්ද 'රාජ්‍ය රහස්' තීරයට ආරංචිය. මේ සජබ ප්‍රබලයා සම්බන්ධයෙන් ඉදිරියේදී 'රාජ්‍ය රහස්' තීරය ඔස්සේ විශේෂ හෙළිදරව්වක් කිරීමටද අප සූදානම්ය.

## නවීන් මහනුවර වර්ජනයක

**සජිත් සහ රනිල් අතර මෙම සාකච්ඡාව පැවැත්වීමට දින කිහිපයකට පෙරාතුව දහ දොළොස් දෙනකුවත් පාක්ෂිකයන් නොමැති දේශපාලන පක්ෂ කිහිපයක් විසින් අටවාගත් ඒකාබද්ධ විපක්ෂය නමැති සංවිධානයේ සාකච්ඡාවක් කොළඹදී පැවැත්විණි. එහිදී ප්‍රධාන වශයෙන් සාකච්ඡාවට ලක්වූයේ මහනුවර පැවැත්වීමට නියමිතව තිබූ මෙම පාර්ශ්වයේ සම්මන්ත්‍රණය සාර්ථක කරගන්නා ආකාරය පිළිබඳවය.**

ඒ අනුව එම සාකච්ඡාවේදී එජාප මහලේකම් තලතා හරහා නවීන්ට නිකුත් කළ නියෝගයකින් දැනුම් දී තිබුණේ සම්මන්ත්‍රණයේ සංවිධාන කටයුතු සිදුකරන ලෙසටය. නවීන් එජාපයේ මහනුවර නායකයා ලෙස කටයුතු කිරීම ඊට හේතුවී තිබිණි.

කෙසේවෙතත් මෙම සම්මන්ත්‍රණය සාර්ථක කරගැනීම සඳහා වූ තවත් සාකච්ඡාවක් ඊට දින කිහිපයකට ඉහතදී මහනුවරදීද පැවැත්විණි. ඊට එජාපය නියෝජනය කරමින් තලතාද සහභාගි වී සිටි ආකාරයක් දැකගන්නට ලැබිණි. නවීන්ද ඊට එක්ව සිටි අතර, රනිල්ගේ මොළයයි සජිත්ගේ කඳයි එකතු විය යුතු බවට වූ ප්‍රකාශය මාධ්‍ය හමුවේ නවීන් සිදුකර තිබුණේ මෙම සාකච්ඡාව අවසානයේදීය. ඒ අනුව එජාපයේ සියලු දෙනාම පාහේ සිතා සිටියේ ඡන්දයක් දිනීමට නොහැකි, ඡන්ද 10ක් හෝ නොමැති පක්ෂ කිහිපයක් විසින් අටවාගෙන කරනු ලබන මෙම මහනුවර සම්මන්ත්‍රණයට නවීන්ද එකතු වනු ඇතැයි කියාය. ඒකාබද්ධ විපක්ෂය මෙවැනි හමුවක් මහනුවර පැවැත්වීමට යෝජනා කොට තිබුණේද කෙසේ හෝ නවීන්ව එම සම්මන්ත්‍රණයට එකතු කරගැනීම සඳහාය.

ඒ අනුව පසුගිය ඉරිදා දිනයේදී මහනුවර පිහිටි කුඩා ශාලාවක මෙම සම්මන්ත්‍රණය පැවැත්වීමට පිරිස කටයුතු කර තිබිණි. නමුත් එහිදී දැකගන්නට ලැබුණු විශේෂම සිදුවීම වූයේ නවීන් කෙළින්ම මෙම සම්මන්ත්‍රණය වර්ජනය කිරීමට පියවර ගෙන තිබීමය.

එමෙන්ම මෙම සම්මන්ත්‍රණයට පෙරාතුව රනිල්ගේ හෘදය සැත්කමෙන් පසුව පැවැත්වූ එජාපයේ පළමු කෘත්‍යාධිකාරී මණ්ඩල රැස්වීමේදීද නවීන් ඒකාබද්ධ විපක්ෂය සම්බන්ධයෙන් ප්‍රබල ප්‍රකාශයක් සිදුකොට ඇති බව 'රාජ්‍ය රහස්' තීරයට ආරංචිය. එහිදී නවීන් පැහැදිලිවම කියා ඇත්තේ එජාපය ඡන්ද නැති ඒකාබද්ධ විපක්ෂයට ඡන්ද හදාදීමට කිසිලෙසකින්වත් කටයුතු නොකළ යුතු බවකි.

'මේ ඒකාබද්ධ විපක්ෂයට ඡන්ද නෑ. එතන පක්ෂ නායකයන් කියලා හිටියට ඒ අය ඡන්ද තියෙන අය නෙමෙයි. මේ අය හදන්නේ අපේ මිනිස්සුගේ ඡන්ද ටික අරගෙන ඒ අය ගොඩයන විදිහක් හදාගන්නයි. ඉතින් අපි මොකටද ඒ අයට අපේ මිනිස්සුන්ගේ ඡන්ද අරන් දෙන්න හදන්නේ...' යනුවෙන් නවීන් කියද්දී වහාම නවීන්ගේ කතාවට බාධා කොට ඇති රනිල් කියා තිබුණේ, 'දැන් මගේ කඳයි මොළෙයි දෙකම හොඳට වැඩ කරනවා. ඒ හින්දා ඔක්කොම එකතු කරන වැඩේ අපි දැන් කරන්න ඕනෙ' යැයි කියාය.

රනිල් එසේ කියා තිබියදී පවා ඒකාබද්ධ විපක්ෂයේ මහජන සම්මන්ත්‍රණය වර්ජනය කිරීමට නවීන් කටයුතු කිරීම විශේෂ සිදුවීමක් විය.

## රුවන්ගෙනුත් විරෝධයක්

**එමෙන්ම මෙම කෘත්‍යාධිකාරී මණ්ඩල රැස්වීමට පෙර එජාප නියෝජ්‍ය නායක රුවන් විජේවර්ධනද රනිල් හමුවී පවතින දේශපාලනය සම්බන්ධයෙන් විශේෂ සාකච්ඡාවක් පවත්වා තිබිණි. එහිදී සාකච්ඡාවට ලක්ව තිබූ එක් ප්‍රධාන මාතෘකාවක් වී ඇත්තේ රාජ්‍ය බුද්ධි සේවයේ හිටපු ප්‍රධානී සුරේෂ් සලේ මහතා අත්අඩංගුවට ගැනීමය.**

එහිදී රුවන් සලේ සම්බන්ධයෙන් තිබූ එජාපයේ මුල් ස්ථාවරය පසුව වෙනස් කිරීම සම්බන්ධයෙන් දැඩි විවේචනයක් සිදුකිරීමට පියවර ගෙන තිබූ බවක් ආරංචිය.

'පාස්කු ප්‍රහාරය වෙලාවේ අපේ තිබ්බ ආණ්ඩුව සලේ සම්බන්ධයෙන් යම් ස්ථාවරයක් අරන් තිබ්බා. හැබැයි මේ වෙද්දී ඒ ස්ථාවරය වෙනස් වෙලා තියෙනවා. ඒ හින්දා ගොඩ දෙනෙක් දැන් අපිව විවේචනය කරනවා පාස්කු ප්‍රහාරයේ ස්ථාවරය වෙනස් කිරීම සම්බන්ධයෙන්. මොකද අපි තමයි මුලින්ම කිව්වේ මේ ප්‍රහාරය පිටිපස්සේ කුමන්ත්‍රණයක් තියෙනවා කියලා...' යනුවෙන් රුවන් කියද්දී රනිල් ඊට ප්‍රතිචාර දක්වා තිබුණේ එජාපය මේ මොහොතේ ගතයුතුව ඇත්තේ පාස්කු ප්‍රහාරය සම්බන්ධයෙන් ඇමෙරිකාව ගෙන ඇති ස්ථාවරය යැයි කියාය.

'එහෙම නෙවෙයි, අපි දැන් මේ වෙලාවේ කරන්න ඕනේ ඇමෙරිකාව කියන දේ. එෆ්.බී.අයි. එක වාර්තාවක් දීලා කියනවා මේ ප්‍රහාරය පිටිපස්සේ අයි.එස්.අයි.එස්. එක ඉන්නවා කියලා. ඒ හින්දා අපි පෙනී ඉන්න ඕනේ ඇමෙරිකාව කියන ඒ මතයටයි...' යන්න රනිල්ගේ ස්ථාවරය වී තිබිණි. නමුත් රනිල්ගේ මේ ප්‍රකාශයට පිළිගැනීමට රුවන් සූදානම් වූයේ නැත. ඒ වෙනුවට ඔහු කියා තිබුණේ ඇමෙරිකාව කෙසේ වුවද පාස්කු ප්‍රහාරය සම්බන්ධයෙන් එජාපය මේ මොහොතේ ගත් ස්ථාවරය නිවැරැදි නොවන බවය.

'ඒ කොහොම වුණත් පාස්කු ප්‍රහාරය ගැන එජාපය මේ මොහොතේ ගත්ත ස්ථාවරය වැරැදියි. ප්‍රහාරය ගැන අපි මුලින්ම ගත් ස්ථාවරයේ දිගටම ඉන්න ඕනේ. දැන් බලන්න සජිතුයි සජබයයි මොන විවේචන ආවත් කොයිම අවස්ථාවකවත් ඒ අය පාස්කු ප්‍රහාරය සම්බන්ධයෙන් මුලින් ගත්ත ස්ථාවරය වෙනස් කළේ නෑ. ඒක තමයි හරි ප්‍රතිපත්තිය...' යනුවෙන් එහිදී රුවන් රනිල්ට දැනුම් දී තිබිණ.

එමෙන්ම රුවන්ද ඒකාබද්ධ විපක්ෂයේ මහනුවර සම්මන්ත්‍රණයට එක් නොවීම කැපීපෙනෙන සිදුවීමක් විය. සාමාන්‍යයෙන් රුවන් සහ නවීන්ද සැලකෙන්නේ එජාපයේ සැබෑ උරුමක්කාරයන් ලෙසටය. ඒ අනුව මේ වනවිට සිදුවන සිදුවීම්වලින් පෙනී යන්නේ එජාපයේ දෙවැනි පෙළේ සැබෑ උරුමක්කාරයන් මේ වනවිට පක්ෂය නිවැරැදි විය යුතු බවට වූ දැඩි ස්ථාවරයක සිටින ආකාරයය.

## ජවිපෙට ගමෙන් රතු එළි

**පසුගිය මහ මැතිවරණයේදී තුනෙන දෙකක බහුතර බලයක් ලබා මාලිමා ආණ්ඩුවක් පිහිටුවනු ලැබුවද මේ වනවිට මාලිමාව යටපත් කොටගෙන ජවිපෙ ඉදිරියට එමින් සිටින බවට වූ මැසිවිල්ල මාලිමාවේ බොහෝ දෙනාගෙන් ප්‍රසිද්ධියේම ඉදිරිපත් වන ආකාරයක් දැකගන්නට තිබේ.**

එය සත්‍යයක් බවට පත්කරමින් අද වනවිට මාලිමාවක් සොයාගන්නට නොහැකි වී ඇති අතර, ජවිපෙ පැලවත්ත මූලස්ථානයේ සිට පක්ෂයේ සියලු දේශපාලන කටයුතු සියතට ගෙන හසුරුවමින් සිටින ආකාරයක් දැකගන්නට පුළුවන.

සාමාන්‍යයෙන් ජවිපෙ මාස කිහිපයකට වරක් ආණ්ඩුවේ ගමන් මග සම්බන්ධයෙන් සහ ජනතාව ආණ්ඩුවට දක්වන ප්‍රතිචාරය සම්බන්ධයෙන් සිය පක්ෂ ජාලය හරහා යම් මතවිමසීමක නිරත වන අතර, ඒ අනුව යමින් මීට සති කිහිපයකට ඉහතදී රට වටා පිහිටි සෑම පළාත් පාලන ආයතනයක් වෙතින්ම සහ සෑම පක්ෂ ශාඛාවකින්ම ආණ්ඩුව සම්බන්ධයෙන් වාර්තා කැඳවීමට කටයුතු කොට තිබිණි. වෙනදා නම් මෙසේ ලැබෙන තොරතුරු විශ්ලේෂණය කළේ පැලවත්ත පක්ෂ කාර්යාලයේ පිහිට වෙනම කාමරයකය. නමුත් මේ වනවිට එය වැඩිදියුණු කොට නවීන පරිගණකවලින් සමන්විත වෙනම ඒකකයක් දක්වා වර්ධනය කිරීමට ජවිපෙ පියවර ගෙන තිබේ. ඒ අනුව ජවිපෙ ගමේ, රටේ දේශපාලන නාඩිය අල්ලන්නේ රට වටා පිහිටි සිය පක්ෂ ජාලයෙන් මෙම ඒකකයට ලැබෙන තත්ත්ව වාර්තා අනුවය.

# අනුර අලුත් සටන පටන්ගනී



කපිල පුංචිමාන්නගේ

රාජ්‍ය රහස්

## ඡන්ද නම් තියෙන්න එපා

**ඒ අනුව පසුගිය සතිය වනවිට මෙසේ ගම් මට්ටමේ බිම් මට්ටමේ ශාඛාවන්ගෙන් පක්ෂ මූලස්ථානයට ලැබුණු වාර්තාවල තිබූ පොදු කරුණක් වූයේ මොන යම් හේතුවකටවත් පළාත් සභා මැතිවරණය පැවැත්වීමට කටයුතු නොකරන ලෙසටය.**

යම් යම් කොට්ඨාසවලින් ඒ සඳහා විවිධ හේතු ඉදිරිපත් කොට තිබුණද මෙසේ පළාත් සභා මැතිවරණය නොපවත්වන ලෙසට අතිබහුතරයක් දැනුම් දීමට පියවර ගෙන තිබූ ප්‍රධාන හේතුවක් වී තිබුණේ මාලිමාව දිගින් දිගටම ගම් මට්ටමේ පවත්වන සමූපාකාර ඡන්ද පරාජයට පත්වීමය. යම් යම් අවස්ථාවලදී මාධ්‍ය මගින් මෙසේ සමූපාකාර ඡන්දවලින් මාලිමාව පරාජයට පත්වීම පිළිබඳව ජවිපෙ ප්‍රධානීන්ගෙන් ප්‍රශ්න කරද්දී ඔවුන් එය විහිළුවට කාරණාවක් ලෙස ගනිමින් ප්‍රශ්නවලින් මගහැර යැමට කටයුතු කොට තිබුණද, ගම් මට්ටමෙන් ජවිපෙට ලැබුණු මෙම පණිවුඩයෙන් කියැවුණේ දිගින් දිගටම සමුපකාර ඡන්ද පරාජයට පත්වීම සැහැල්ලුවට නොගන්නා ලෙසත්, එය ජනතාව ගම් මට්ටමෙන් ආණ්ඩුවට දැල්වූ රතු එළියක් බවත්ය. ඒ අනුව ඔවුන් වැඩිදුරටත් පක්ෂ මූලස්ථානයට දැනුම් දී තිබුණේ එම අනතුරු ඇඟවීම අවතක්සේරු නොකරන ලෙසත්, පළාත් සභා මැතිවරණය පැවැත්වුවහොත් නියත වශයෙන්ම මාලිමාව පරාජයට පත්වී විපක්ෂය ඒකාබද්ධව පළාත් සභාවල බලය අල්ලන බවත්ය. ඒ අනුව වහාම ගම් මට්ටමෙන්, බිම් මට්ටමෙන් සංවර්ධන කටයුතු ආරම්භ කරන ලෙසටත්, මේ වනවිට අලසභාවයට පත්ව ඇති ගම් මට්ටමේ පක්ෂ ක්‍රියාකාරීත්වය යළි සක්‍රීය කරන ලෙසටත් එහිදී යම් දැනුම්දීමක් සිදුකර ඇති බවක්ද ආරංචිය. කෙසේ වෙතත් විවිධ අදහස් සහ යෝජනා ගම් මට්ටමෙන් පැලවත්තට පක්ෂ මූලස්ථානයට පැමිණියද පොදුවේ 90%ක්ම දෙනා එහිදී පක්ෂයට දැනුම් දී තිබුණේ කුමන තත්ත්වයක් යටතේ වුවද පළාත් සභා මැතිවරණය නොපවත්වන ලෙසටය. මේ අදහස කෙතරම් දුරට පැලවත්තේ හදවතටම වැදිලා තිබෙනවාද කියනවා නම් ටිල්වින් සිල්වා යාපනයේ කළ සංචාරය අතරතුරදී නොදැනුවත්වම ඔහුගේ කටින් මෙය එළියට පැන්න ආකාරයක් දැකගත හැකි විය. එහිදී ටිල්වින් කියා සිටියේ පළාත් සභා මැතිවරණය මේ වසරේ නොපවත්වන බවත්, හැකියාවක් ලැබුණහොත් පමණක් එය ලබන වසරේදී පවත්වන බවත්ය.

## අනුර ගේමට බසී

**කෙසේ වෙතත් පසුගිය සතිය වනවිට ගම් මට්ටමෙන් පැලවත්තට ලැබුණු මේ අතිභයානක ප්‍රතිචාරය ආණ්ඩුවේ ඉහළ තැන්වලටද වාර්තා කිරීමටද පියවර ගෙන තිබිණි. ඒ අනුව මේ සතියේ අප ජනාධිපතිවරයා විසින් ඉදිරියේදී ක්‍රියාත්මක කිරීමට සැලසුම් කොට ඇති දැවැන්ත සංවර්ධන වැඩපිළිවෙළක් පිළිබඳ පළමු වතාවට 'රාජ්‍ය රහස්' තීරය ඔස්සේ රටට තොරතුරු හෙළිදරව් කිරීමට සූදානම්ය.**

නමුත් මෙම සංවර්ධන වැඩපිළිවෙළ මේ වසරේ ක්‍රියාත්මක කිරීමට ආණ්ඩුවට අපහසු වී ඇත්තේ තවමත් ජාත්‍යන්තර මූල්‍ය අරමුදල සමග අස්සන් කළ ගිවිසුම ක්‍රියාත්මක වෙමින් පවතින නිසාය. මන්ද යත් එම ගිවිසුමේ වගන්තිවලට අනුව ආණ්ඩුවට සහනාධාර සඳහා හෝ වෙනත් වැඩකටයුතු සඳහා සිතූ සිතූ ආකාරයට මුදල් වියදම් කළ නොහැකිය. භාණ්ඩාගාරයේ ට්‍රිලියන ගණනින් මුදල් ඉතිරිව තිබුණද ආණ්ඩුවට ඒවා වියදම් කිරීමට නොහැකිව ඇත්තේ එම හේතුව නිසාය.

ඒ අනුව අප මීට පෙර 'රාජ්‍ය රහස්' තීරය ඔස්සේ අනාවරණ කළ පරිදිම ජනාධිපතිවරයා මේ වනවිට තීන්දු කොට ඇත්තේ ලබන වසරේ මාර්තු මාසයේ අයි.එම්.එෆ්. සමග අස්සන් කළ ගිවිසුමේ කාලසීමාව අවසන් වීමෙන් පසු නව ගිවිසුමකට නොගොස් එය අවසන් කිරීමටය. ඉන් අනතුරුව ජනාධිපතිවරයා තීන්දු කොට ඇත්තේ ලබන මාර්තු මාසයෙන් පසු භාණ්ඩාගාරයේ ඉතිරි වී ඇති ට්‍රිලියන ගණන් මුදල් උපයෝගී කොටගෙන මුළු රටම ආවරණය වන පරිදි ගම් මට්ටමෙන් දැවැන්ත සංවර්ධන වැඩසටහන් ආරම්භ කිරීමටය. ඒ අනුව ගම්වල සියලු පාරවල්, පාලම්, බෝක්කු ආදිය සංවර්ධනය කිරීමටත්, දැනට ඉතිරිව ඇති අධිවේගී මාර්ගවල ඉදිකිරීම් වහාම අවසන් කිරීමටත් ජනාධිපතිවරයා තීන්දු කොට අවසානය. ඊට අමතරව ගමට විශාල වශයෙන් සංවර්ධන ප්‍රතිලාභ බෙදීයන දැවැන්ත ව්‍යාපෘති රැසක්ම දියත් කිරීමටත් ජනාධිපතිවරයා තීන්දු කොට ඇති බවක් දැනගන්නට ඇත.

එම සංවර්ධන වැඩපිළිවෙළ මාර්තු මාසයේ ආරම්භ කිරීමෙන් පසු ජනාධිපතිවරයා තීන්දු කොට ඇත්තේ 2027 මැද භාගයේදී, එනම් අගෝස්තු මාසය පමණ වනවිට පළාත් සභා මැතිවරණය පවත්වා අවසන් කිරීමටය. එමෙන්ම මෙම සංවර්ධන කටයුතු දියත් කිරීමේදී මාලිමාවට බලය හිමි සියලු පළාත් පාලන ආයතන මෙන්ම ජවිපෙ ආසන සංවිධායකවරුන්, ගම් මට්ටමේ ජවිපෙ ක්‍රියාකාරීන් සම්පූර්ණයෙන්ම ඊට අනුයුක්ත කොට දැවැන්ත ප්‍රචාරක ව්‍යාපාරයක් ආරම්භ කිරීමටද ජනාධිපතිවරයා සැලසුම් කොට ඇති බවක් ආරංචිය.

## උතුරට වෙනම වැඩපිළිවෙළක්

**මීට අමතරව ජනාධිපතිවරයා උතුරු නැගෙනහිර පළාත් වෙනුවෙන්ම වෙනම සංවර්ධන වැඩපිළිවෙළක් ක්‍රියාත්මක කිරීමටද මේ වනවිට සැලසුම් කරමින් සිටින බවක් දැනගන්නට තිබේ. මන්ද යත් පළාත් සභා මැතිවරණය පැවැත්වීම කල් යද්දී එහි උණුසුම වඩාත් දැනෙන්නේ දකුණටත් වඩා උතුරටය.**

මන්ද යත් පළාත් සභා ලංකාව ඇතුළේ පිහිටෙව්වේම උතුරු නැගෙනහිර වාර්ගික ප්‍රශ්නයට දේශපාලන විසඳුමක් සෙවීමේ අරමුණෙන් වීම නිසාය. ඒ අනුව යම් හෙයකින් පළාත් සභා පවත්වන ලෙස ඉල්ලා උතුරේ ප්‍රබලම දේශපාලන පක්ෂය වූ තමිල් අරසු කච්චි පක්ෂය එළියට බැස්සහොත් එය අහිතකර ආකාරයට දකුණේ ආණ්ඩුවට බලපෑම වැළැක්විය නොහැක.

අනෙක් අතට පළාත් සභා මැතිවරණය පැවැත්වීම කල් දමන්න දමන්න ඊට ඉන්දියාව දක්වන ප්‍රතිචාරය සම්බන්ධයෙන් සහ තමිල්නාඩු මහඇමැති තලපති විජේ දක්වන ප්‍රතිචාරය සම්බන්ධයෙන්ද ආණ්ඩුවට යම් කියවීමක් තිබේ. ඒ අනුව මේ සියල්ල සමබර කරගැනීම සඳහා පළාත් සභා මැතිවරණය පවත්වන තෙක් උතුරට සහ නැගෙනහිරට වෙනම සංවර්ධන වැඩපිළිවෙළක් දියත් කිරීම කෙරෙහිද ජනාධිපතිවරයාගේ අවධානය යොමුව ඇති බවක් 'රාජ්‍ය රහස්' තීරයට ආරංචිය.

## අනුර තද තීන්දුවක

**මේ දිනවල බොහෝ දෙනා මෙගා නාට්‍යයක් බලන ආකාරයට ඇස් කන් දල්වාගෙන බලා සිටින්නේ දිනපතාම පාහේ අත්අඩංගුවට පත්වන විපක්ෂයේ නියෝජිතයන් දෙසය. පසුගිය සතියේ රාජපක්ෂ පවුලේ ප්‍රබලයන් සිව්දෙනකු වූ බැසිල් රාජපක්ෂ, නාමල් රාජපක්ෂ, යෝෂිත රාජපක්ෂ සහ ශෂීන්ද්‍ර රාජපක්ෂට එරෙහිව විශේෂ තීන්දු කිහිපයක්ම අධිකරණය මගින් නිකුත් විය.**

එමෙන්ම ගෝඨාභයගේ හිටපු පෞද්ගලික ලේකම්වරයා වූ සුගීශ්වර බණ්ඩාරව අත්අඩංගුවට ගැනීමට අල්ලස් කොමිසම කටයුතු කළ අතර, පසුව ඔහුව ජූලි 01 වැනිදා දක්වා රිමාන්ඩ් බන්ධනාගාර ගත කිරීමට පියවර ගැනිණි. මේ අතරවාරයේ පාස්කු ප්‍රහාරය සම්බන්ධයෙන් හිටපු රාජ්‍ය බුද්ධි සේවයේ ප්‍රධානී සුරේෂ් සලේ සම්බන්ධ විමර්ශනද මේ වනවිට සමාජය තුළ දැඩිව කතාබහට ලක්වන සිදුවීමක් බවට පත්ව අවසානය.

කෙසේ වෙතත් මේ වනවිට ජනාධිපතිවරයාගේ පැත්තෙන් දැඩි තීන්දුවක් ගෙන ඇත්තේ කොපමණ බලපෑම් සහ විවේචන එල්ල වුවද දූෂණයට එරෙහිව ගනු ලැබූ ක්‍රියාමාර්ග ඒ ආකාරයටම ඉදිරියට රැගෙන යැමටය. ඇතැම් ස්ථානවලදී යම් යම් විමර්ශන හරහා ආණ්ඩුවට දරුණු ප්‍රතිචාරවලට මුහුණ දීමට සිදුවුවද ඒ සියල්ලට මුහුණ දීමටද ජනාධිපතිවරයා තීන්දු කොට ඇති බවක් ආරංචිය. ඒ අනුව ඉදිරි වසර දෙකක කාලය ඇතුළත නියත වශයෙන්ම දූෂණ විරෝධී සටනේ විශාල ප්‍රගතියක් අත්පත් කරගැනීමට ජනාධිපතිවරයා සැලසුම් කරමින් සිටින බව දැනගන්නට තිබේ.

## සජිත් වෙනම සටනක

**ඒ සමගම විපක්ෂ නායක සජිත් ප්‍රේමදාස මහතාගේ ප්‍රධානත්වයෙන් සමගි ජන බලවේගය තවත් අලුත් දේශපාලන සටනක් ආරම්භ කොට තිබේ. ඒ, දැනට උපරිමාධිකරණවල හිස්ව පවතින විනිසුරු ධුර 8ක් පිරවීමට ජනාධිපතිවරයා කටයුතු කොට නොමැති බවට චෝදනා කරමිනි. ඒ අනුව පසුගිය සතියේදී සමගි ජන බලවේගය මේ සම්බන්ධයෙන් වහාම අවධානය යොමුකරන ලෙස ඉල්ලමින් කතානායකවරයාට විශේෂ ලිපියක් කතානායකවරයා වෙත භාරදීමට පියවර ගෙන තිබිණි. පහත දැක්වෙන්නේ එම ලිපියය.**

2026 ජුනි 12

ගරු කථානායකතුමා

පාර්ලිමේන්තුවේ කථානායක සහ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථා සභා සභාපති

ශ්‍රී ලංකා පාර්ලිමේන්තුව

ශ්‍රේෂ්ඨාධිකරණයේ සහ අභියාචනාධිකරණයේ නොකඩවා පවතින අධිකරණ පුරප්පාඩු

ශ්‍රේෂ්ඨාධිකරණයේ පුරප්පාඩු හතරක් සහ අභියාචනාධිකරණයේ පුරප්පාඩු හතරක්, පිළිගත නොහැකි තරම් දීර්ඝ කාලයක් තිස්සේ නොපුරවා පවතින තත්ත්වය පිළිබඳ වහාම අවධානය යොමු කිරීම සඳහා මෙම ලිපිය ඉදිරිපත් කරන්නෙමු. මෙම දිගුකාලීන අපොහොසත් වීම, ආණ්ඩුක්‍රම ව්‍යවස්ථා සභාවේ අනුමැතියට යටත්ව ජනාධිපතිවරයා විසින් ශ්‍රේෂ්ඨාධිකරණයේ සහ අභියාචනාධිකරණයේ විනිසුරුවරුන් පත් කළ යුතු බවට පනවනු ලබන ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 107(1) වගන්තියට පටහැනි බව පෙනී යයි.

ගරු අග්‍රවිනිශ්චයකාරවරයා විසින් මෙම පුරප්පාඩු පිළිබඳව ආණ්ඩුක්‍රම ව්‍යවස්ථා සභාව හෝ ජනාධිපතිවරයා වෙත නිල වශයෙන් දැනුම් දී තිබේද යන්න ආණ්ඩුක්‍රම ව්‍යවස්ථා සභාව විසින් සොයා බලන ලෙස ගෞරවයෙන් ඉල්ලා සිටිමු. එවැනි දැනුම්දීමක් සිදු කර නොමැති නම්, එම මගහැරීමට හේතු විමසා බලන ලෙසද ඉල්ලා සිටිමු.

මෙම පුරප්පාඩු අඛණ්ඩව පැවතීම, උසස්වීම් සඳහා සුදුසුකම් ලබන ජ්‍යෙෂ්ඨ විනිසුරුවරුන් අධෛර්යමත් කිරීමට හේතු විය හැකි අතර ඔවුන්ගේ වෘත්තීය ප්‍රගතිය පිළිබඳ අවිනිශ්චිතතාවයක් ඇති කළ හැකිය. සාධාරණ සහ කාලෝචිත ආකාරයකින් තමා උසස්වීම් සඳහා සලකා බලනු ඇතැයි එවැනි විනිසුරුවරුන් විසින් සාධාරණ ලෙස අපේක්ෂා කළ හැකිය. එබැවින්, මෙම පුරප්පාඩු පිරවීමේ දිගුකාලීන ප්‍රමාදය විසින්, ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාව යටතේ සහතික කර ඇති නීතියේ සමාන ආරක්ෂාව පිළිබඳ ගැටලු මතු කිරීමට ඉඩ ඇත.

පුද්ගලික මට්ටමේ බලපෑම්වලින් ඔබ්බට ගමන් කරමින්, මෙම පුරප්පාඩු අධිකරණ පරිපාලනයේ කාර්යක්ෂමතාවයට අහිතකර ලෙස බලපාන අතර, දැනට සිටින විනිසුරුවරුන්ගේ කාර්යභාරය පුළුල් කරමින් අධිකරණ පද්ධතිය කෙරෙහි පවත්නා මහජන විශ්වාසය පළුදු කරන සුළු වේ. ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 4(ඇ) ව්‍යවස්ථාව යටතේ, නිසි ලෙස ස්ථාපිත උසාවි හරහා අධිකරණ බලය ඵලදායී ලෙස ක්‍රියාත්මක කිරීම මූලික ව්‍යවස්ථාපිත වගකීමකි.

පාර්ලිමේන්තුවේ කථානායක සහ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථා සභාවේ සභාපති යන ඔබගේ ද්විත්ව ධුරයන්හි කාර්යභාරය උපයෝගී කරගනිමින්, වහාම ක්‍රියාත්මක වන පරිදි මෙම කරුණ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථා සභාවේ සහ ජනාධිපතිවරයාගේ අවධානයට යොමු කරන ලෙසත්, පෙරකී 4(ඇ) ව්‍යවස්ථාව යටතේ පවතින මෙම ව්‍යවස්ථාමය ගැටලුව වෙත පාර්ලිමේන්තුවේ අවධානය යොමු කරන ලෙසත් ඔබගෙන් ගෞරවයෙන් ඉල්ලා සිටිමු.

## අනුර සජිත් එක මතයක

“එමෙන්ම මේ වනවිට අපරාධ පරීක්ෂණ දෙපාර්තමේන්තුව මගින් ආරම්භ කොට ඇති යම් යම් පරීක්ෂණ සම්බන්ධයෙන් කිසිදු විරෝධයක් පළ නොකරන බවද එහිදී සජිත් අවධාරණය කර සිටියේය. ඇතැම් අවස්ථාවලදී එම විමර්ශනයන්ට සජබය සමග එක්ව සිටින ඇතැම් සහෝදර දේශපාලන පක්ෂ සම්බන්ධ වී තිබුණද ඒ කිසිවකට සජබය කිසිදු ආකාරයකින් මැදිහත් නොවන බවත්, පාරට බැස උද්ඝෝෂණ හෝ විරෝධතා ව්‍යාපාර නොපවත්වන බවත්, සත්‍යග්‍රහ හෝ එවැනි කිසිදු අවස්ථාවකට සම්බන්ධ නොවන බවත් සජිත් පැහැදිලි කොට සිටියේය. එම ප්‍රකාශය කිරීමට සජිත්ට එක්තරා හේතුවක්ද තිබිණි. ඒ, මේ වනවිට සජබය දූෂිතයන්ගෙන් තොර පිරිසිදු පක්ෂයක් බවට පත්ව තිබීමය.

**මීට අමතරව පසුගිය සතියේ පැවැති සාකච්ඡා කිහිපයකදීම සජිත් පක්ෂයේ මන්ත්‍රීවරුන්ට අවධාරණය කොට කියා සිටි විශේෂ කරුණක් තිබේ. ඒ, දැනට විමර්ශන සිදුකෙරෙන දූෂිත ගනුදෙනුවලට සම්බන්ධ කිසිවකු වෙනුවෙන් කිසිදු ආකාරයකින් හෝ සජබය පෙනී නොසිටින බවය.**

එමෙන්ම මේ වනවිට අපරාධ පරීක්ෂණ දෙපාර්තමේන්තුව මගින් ආරම්භ කොට ඇති යම් යම් පරීක්ෂණ සම්බන්ධයෙන් කිසිදු විරෝධයක් පළ නොකරන බවද එහිදී සජිත් අවධාරණය කර සිටියේය. ඇතැම් අවස්ථාවලදී එම විමර්ශනයන්ට සජබය සමග එක්ව සිටින ඇතැම් සහෝදර දේශපාලන පක්ෂ සම්බන්ධ වී තිබුණද ඒ කිසිවකට සජබය කිසිදු ආකාරයකින් මැදිහත් නොවන බවත්, පාරට බැස උද්ඝෝෂණ හෝ විරෝධතා ව්‍යාපාර නොපවත්වන බවත්, සත්‍යග්‍රහ හෝ එවැනි කිසිදු අවස්ථාවකට සම්බන්ධ නොවන බවත් සජිත් පැහැදිලි කොට සිටියේය. එම ප්‍රකාශය කිරීමට සජිත්ට එක්තරා හේතුවක්ද තිබිණි. ඒ, මේ වනවිට සජබය දූෂිතයන්ගෙන් තොර පිරිසිදු පක්ෂයක් බවට පත්ව තිබීමය.

'අපේ පක්ෂයේ ඉන්න කිසිම කෙනෙක් කිසිම දූෂිත ගනුදෙනුවකට සම්බන්ධ වෙලා නෑ. මෙතෙන ඉන්න කිසිම කෙනෙක් හොරකම් කරලා නෑ. ඒක ජනතාව දන්නවා. ඉතින් අපිට කිසිම දූෂිත ගනුදෙනුවකට හරි ඒ වෙනුවෙන් ගැවුණු පුද්ගලයන් වෙනුවෙන් හරි ඒ විමර්ශනවලට හරි සම්බන්ධ වෙන්න විදියක් නෑ. මොකද මුළු රටම දන්නවා මෙතන දූෂිත පුද්ගලයන් නෑ කියලා. ඒක තමයි අපිට ඉදිරි මැතිවරණවලදී තියෙන එකම වාසිය. ඒ හින්දා කොයි තරාතිරමක අයෙක් වෙනුවෙන් වුණත් අපි පෙනී ඉන්න යන්නේ නෑ...' යනුවෙන් සජිත් එහිදී දැඩිව කියා සිටි ආකාරයක් දැකගත හැකි විය. ඒ අනුව මේ වනවිට දැකගැනීමට ඇති කාරණයක් වන්නේ දූෂණයට එරෙහි සටනේදී ජනාධිපතිවරයා මෙන් විපක්ෂ නායක සජිත්ද එකම ස්ථාවරයකට පැමිණ ඇති බවකි.

## කපූර් ලංකාවට එනවා

**පසුගිය පෙබරවාරි 22 වැනි දින 'රාජ්‍ය රහස්' තීරය ඔස්සේ අතිවිශේෂ හෙළිදරව්වක් කරමින් අප කියා සිටියේ ඇමෙරිකානු සෙනෙට් මණ්ඩලයේ විදේශ සබඳතා කමිටුවේ රැස්වීමකදී දකුණු සහ මධ්‍යම ආසියානු කලාපය භාර සහකාර ලේකම් පෝල් කපූර් මහතා ලංකාව චීන ග්‍රහණයෙන් මුදාගැනීම සම්බන්ධයෙන් විශේෂ අනාවරණයක් සිදුකොට ඇති බවකි. එදා අප කළ එම හෙළිදරව්ව මෙසේය.**

'පසුගිය සතියේ ඇමෙරිකානු සෙනෙට් මණ්ඩලයේ විදේශ සබඳතා කමිටුවේ රැස්වීමක් පැවැති අතර, ඊට දකුණු සහ මධ්‍යම ආසියානු කලාපය භාර සහකාර ලේකම් පෝල් කපූර් මහතාද එක්ව සිටි ආකාරයක් දැකගත හැකි විය. එහිදී සාකච්ඡාව කේන්ද්‍ර වී තිබුණේ දකුණු ආසියානු කලාපය තුළ ඇමෙරිකානු විදේශ ප්‍රතිපත්තිය ක්‍රියාත්මක කිරීම සම්බන්ධයෙන් සහ ඊට අදාළ උපාය උපක්‍රම තේරීම සම්බන්ධයෙන්ය. මෙම සාකච්ඡාවේදී කිසිවකුත් නොසිතූ ආකාරයට ලංකාව සම්බන්ධයෙන් අතිශය වැදගත් කතාවක් මේ පෝල් කපූර්ගෙන් එළියට පැමිණියේය. එහිදී ඇමෙරිකානු බලධාරීන් ඉන්දීය සාගර කලාපය ඇතුළත දියත් කළ යුතු ඉදිරි සැලසුම් මොනවාද යන්න පිළිබඳ විමසද්දී පෝල් කපූර් ලංකාව සම්බන්ධයෙන් අතිශය වැදගත් කරුණු කීපයක් අනාවරණ කිරීමට පියවර ගත්තේය.

'මේ වෙද්දි ලංකාව ඉන්දියන් සාගරයේ සහ දකුණු ආසියානු කලාපයේ තියෙන වැදගත්ම මුහුදු මාර්ගය බවට පත්වෙලා අවසානයි. මැදපෙරදිග තෙල් නැව් විතරක් නෙවෙයි ආනයන අපනයන සිදුකරන ප්‍රධාන මුහුදු මාර්ගයන් වැටිලා තියෙන්නේ ලංකාව ආසන්නයෙන්. පහුගිය කාලෙදි වොෂින්ටන් මැප් එකේ ලංකාවටයි, ලංකාවේ මුහුදු තීරයටයි ලොකු අවධානයක් යොමුවෙලා නොතිබුණත්, මේ වෙද්දී මතුවෙලා තියෙන තත්ත්වය අනුව ලංකාව තවත් දකුණු ආසියාවේ සාමාන්‍ය රටක් විදියට පිළිගන්න බෑ. මේක කල්තියා තේරුම් අරගෙන වෙන්න ඇති චීනය බරපතළ විදියට ලංකාව ඇතුළේ බලය අත්පත් කරගන්න හදන්නේ. ඔවුන් දැනටමත් හම්බන්තොට වරාය අත්පත් කරගෙන අවසන්. ඒක ඔවුන්ට විශාල හයියක්. ඒ වගේම 2022 චීන පර්යේෂණ නෞකාවේ ලංකා ගමනත් අතිශය භයානකයි. ඒක අපිට දීපු ලොකු සංඥාවක්. ඒ නිසා මින් ඉදිරියට ඇමෙරිකාවටයි ඉන්දියාවටයි මේ ගැන ඉතා සමීපව ඇහැ ගහගෙන ඉන්න වෙනවා' යැයි කී කපූර් තවත් පුදුමසහගත ප්‍රකාශයක් කිරීමට මෙහිදී පියවර ගත්තේය. ඒ, චීනය මුල්කරගෙන මතුවී ඇති ඉන්දු-පැසිෆික් කලාපයේ ගැටුම දෙස ඇමෙරිකාව ඉතා සමීපව නිරීක්ෂණය කළ යුතු බවකි.

## මොකද කරන්න ඕනෑ

**ඒ අනුව සෙනට් කමිටුව කපූර්ගෙන් නැවතත් ප්‍රශ්න කර සිටියේ එසේ නම් ලංකාව නැවතත් ඇමෙරිකාව දෙසට හරවා ගැනීම සඳහා ගතයුතු ක්‍රියාමාර්ග යන් මොනවාදැයි කියාය. ඊට කපූර් දුන්නේ මෙවැනි පිළිතුරකි.**

ලංකාව මේ වෙද්දී විශාල ආර්ථික අර්බුදයකින් ගොඩ එමින් ඉන්නේ. නමුත් ඒ අයට මේ අර්බුදයට මුහුණ දෙන්න නිසි ආර්ථික සැලැස්මක් නැහැ. ඒ හින්දා අපි ඒ අයට ආර්ථික සැලැස්මක් හදන්න ඕනේ. ඒකට මූල්‍ය අරමුදලේ සහාය ලංකාවට අපි දෙන්න ඕනේ. ඒ වගේම ලංකාව විදෙස් ණය ප්‍රතිව්‍යූහගත කිරීමේ ප්‍රශ්නයක හිරවෙලයි ඉන්නේ. ආයෝජන ගලා ඒමේ ප්‍රශ්නයකත් ලංකාව හිර වෙලා ඉන්නවා. ඒ හින්දා අපි පුළුවන් තරම් ඉන්දියාවත් එක්ක සම්බන්ධය හදාගන්න ලංකාවට උදව් කරන්න ඕනේ.මේ වෙද්දී ලංකාව චීන ග්‍රහණයට අහුවෙලා ඉන්නේ. චීනයෙන් විශාල වශයෙන් ලංකාව ණය අරගෙන ඉන්නවා. ඒකෙන් නිදහස් වෙන්න ඔවුන්ට බැහැ. යටිතල පහසුකම්වලට විශාල වශයෙන් චීන ණය අරන් තියෙනවා. ඒ ගෙවන්න තියෙන ණය දැන් ටිකක් අඩු කරලයි තියෙන්නේ.

ඒ වගේම ලංකාව එක්ක ඇමෙරිකාව යුදමය සහයෝගිතාව ශීඝ්‍රයෙන් වැඩි කරන්න ඕනේ. මම නම් කියන්නේ ඒකට ලංකාව ඇතුළේ ඇමෙරිකානු හමුදා කඳවුරක් හදනවට වඩා ඉන්දියාවත් එකතු කරගෙන නාවික ආරක්ෂාව සම්බන්ධයෙන් මෙහෙයුම් කරන්න ඕනේ කියලයි. ලංකාවට ඒකට අවශ්‍ය යුද උපකරණ ලබාදෙන්න ඕනේ' යනුවෙන් කපූර් එහිදී යෝජනා කර සිටියේය. ඒ හරහා කපූර් පෙන්වා දුන්නේ ඇමෙරිකානු කඳවුරක් ලංකාවේ ස්ථාපිත කරනවාට වඩා හමුදාමය පුහුණු මෙහෙයුම්, බුද්ධි සේවා, යුද උපකරණ සම්බන්ධයෙන් තවදුරටත් ලංකාව සමග ගිවිසුම්වලට එළඹිය යුතු බවකි. එමෙන්ම ඉන්දීය සාගරයේ සිදුකරන මත්ද්‍රව්‍ය ජාවාරම නිරීක්ෂණය කිරීම සඳහා ක්‍රමවේදයක් සකස් කළ යුතු බවද කපූර් මෙහිදී ඇමෙරිකානු සෙනට් කමිටුවට පෙන්වා දුන්නේය.

ඒ අනුව බැලීමේදී කපූර්ගේ මේ ප්‍රකාශය හරහා එක්තරා ආකාරයකට ලංකාවට පැහැදිලි වාසිසහගත තත්ත්වයක් ගොඩනැගී තිබේ. විශේෂයෙන්ම ලංකාවට ආයෝජන ලබාගැනීම සහ ආර්ථික අර්බුදයෙන් ගොඩ ඒම සඳහා දැවැන්ත සහායක් කපූර්ගේ මෙම ප්‍රකාශය හරහා උදාකර ගැනීමේ අවස්ථාවක් උදාවී ඇති ආකාරයක් දැකගත හැකිය.'

2026 පෙබරවාරි 22 ('රාජ්‍ය රහස්')



## වරාය බලන්නත් යනවා

**අද අප හදිසියේම 'රාජ්‍ය රහස්' තීරයෙන් මේ කියන පෝල් කපූර් පිළිබඳ පාඨකයන්ට යළි මතක් කිරීමක් කළේ ලබන 22, 23 යන දෙදින තුළ ශ්‍රී ලංකාවේ සංචාරයක නිරත වීමට පෝල් කපූර් සූදානමින් සිටීම නිසාය. කපූර් මෙවර පැමිණෙන්නේ ඇමෙරිකානු රජය මගින් ලංකාවට ලබාදුන් ආපදාවලදී භාවිත කළ හැකි ජීවිතාරක්ෂක හෙලිකොප්ටර් යානා 8 ලංකාවට ලබාදීමේ නිල උත්සවයට එක්වීම සඳහාය. ජනාධිපතිවරයා විසින් එය භාරගැනීමට නියමිතව ඇත්තේ රත්මලාන ගුවන් තොටුපළේදීය.**

මේ ආකාරයටම පසුගිය මාසයේ ඇමෙරිකාව විසින් ලංකාවට ලබාදුන් වෙරළාරක්ෂක නෞකාවක් භාරදීමේ උත්සවයට ඇමෙරිකානු ජනාධිපති ඩොනල්ඩ් ට්‍රම්ප්ගේ විශේෂ නියෝජිතයකු ලෙස සර්ජියෝ ගෝර් මහතා සහභාගි වීමට නියමිතව සිටියද අවසන් මොහොතේ ඔහු එම අවස්ථාවට සහභාගි වීමෙන් වැළකී සිටියේය. ඊට හේතු වී තිබුණේ ඉරානයට එරෙහිව ඇමෙරිකාව විසින් ආරක්ෂක මණ්ඩලයට ඉදිරිපත් කළ යෝජනාවට අස්සන් තැබීම ශ්‍රී ලංකාව මගින් ප්‍රතික්ෂේප කොට තිබීම නිසාය. ලංකාව ඊට අස්සන් නොකළද අතිබහුතරයක් රටවල් ඊට අස්සන් තැබීම හරහා මේ යෝජනාව ආරක්ෂක මණ්ඩලයේදී සම්මත කරගැනීමට ඇමෙරිකාවට හැකිවී තිබිණි. නමුත් ඊට ප්‍රතිචාර දක්වමින් ලංකාවේ පැවැති උත්සවය වර්ජනය කිරීමට ගෝර් කටයුතු කොට තිබූ බවක් 'රාජ්‍ය රහස්' තීරයේ අප මීට පෙර වාර්තා කර සිටියෙමු.

කෙසේ වෙතත් ලබන 22 සහ 23 යන දෙදින පෝල් කපූර් ලංකාවට පැමිණ ජනාධිපතිවරයාට හෙලිකොප්ටර් යානා භාරදීමෙන් පසු කොළඹ වරායේ නිරීක්ෂණ චාරිකාවක නිරත වීමට සැලසුම් කොට තිබේ. ඒ, කෝල් කපූර් විසින්ම මීට පෙර ඇමෙරිකානු සෙනෙට් සභාවට ලංකාව සම්බන්ධයෙන් ඉදිරිපත් කළ කරුණු තහවුරු කිරීම සඳහා බව බොහෝ දෙනාගේ අදහස වී තිබේ.

මේ ආකාරයටම ඉකුත් අවස්ථාවේදී සර්ජියෝ ගෝර් ලංකාවට පැමිණි විටද කොළඹ වරායට ගොස් බටහිර පර්යන්තයේ ඉදිකිරීම් ආරම්භ කිරීම සම්බන්ධයෙන් නිරීක්ෂණ චාරිකාවක නිරතව තිබිණි. ඒ අනුව පෝල් කපූර්ද ලංකාවට පැමිණෙන්නේ වරායේ එම පර්යන්තයේ ඉදිරි ඉදිකිරීම් කටයුතු සම්බන්ධයෙන් සාකච්ඡා කිරීමට බව පැවැසේ.

කපිල පුංචිමාන්නගේ



# මාලිමාව හදපු උපුල් කුමාරප්පෙරුමට ජවිපෙ මාතරින් ගහපු ගේම



## පුතාගේ මරණයෙන් පසු හෙළිවෙයි

### හිතාමතාම මාතර පොඩ්ම ආසනයට දැම්මා

### වෙන ආසනවල රැස්වීම්වලට ගියාම ටිල්වින් වහාම යන්න කිව්වා

### අනුරට මචං කියපු එකත් දිරෙව්වේ නෑ

### එදා ටිල්වින් ජනිත් විපුලගුණට කළේත් මේ දේමයි

**ජෙප්පො කියන්නෙ සාමාන්‍යයෙන් සහකම්පනය තියෙන ජාතියක් නෙවෙයි. ඒත් මේ දවස්වල ජෙප්පො සහකම්පනයට ලක්වෙලා හොටු පෙරනවා අපි දකිනවා. ඒ තමයි උපුල් කුමරප්පෙරුමගෙ පුතාගෙ වියෝව වෙනුවෙන්. මම මේ පෙන්වන්න හදන්නෙ ජෙප්පො මේ අඬන්නෙ බොරුවට බව ඔබට කරුණු ඇතුවම, සාක්ෂි ඇතුවම පෙන්නලා දෙන්න.**

මේ කතාව ලියන්න කලින් මම ඒ දරුවට නිවන් සුව අත්වේවා කියලා ප්‍රාර්ථනා කරනවා. මේ ලිපියේ කරුණු හේතුවෙන් මෙම කනගාටුදායක මොහොතේ උපුල් හෝ ඔහුගේ පවුලේ කිසිවකුගේ හිත් පෑරෙන එකක් නෑ කියලා හිතන නිසාත්, මේක ලියන්න මේක තරම් තත්කාලයක් නැහැ කියලා හිතන නිසයි මම මේක ලියන්නේ.

උපුල්ගෙ පුතාගෙ අභාවය වෙනුවෙන් අද හොටු පෙරන ජෙප්පො, මීට අවුරුදු එකහමාරකට කලින් උපුල්ගෙ දේශපාලන ගමන නැත්තටම නැති කළා. මාතරින් අංක එකට දිනන්න ඕනෙ මිනිහව සැලසුම්සහගතව පරාද කරලා, මාතරට කැළලක් වෙන ජාතියෙ හැඩි ජෙප්පො රොත්තක් පාර්ලිමේන්තුවට ගත්තා. ඇත්තම කියනවා නම් එදා ජෙප්පො පරාද කළේ උපුල් කුමරප්පෙරුම කියන මිනිහා විතරක් නෙවෙයි... මාතරින් බිහිවෙන්න තිබ්බ කෘතහස්ත තවත් දේශපාලනඥයෙක් තමයි උන් අපට නැතිකළේ. එහෙමත් නැත්නම් මේ රටේ බිහිවෙන්න තිබ්බ වැඩදායක සහ ගරුසරු අධිකරණ ඇමැතිවරයෙක් තමයි ජෙප්පො උන්ගෙ පටු තීන්දු නිසා නැතිකරලා දැම්මේ. ජෙප්පො, උපුල් කුමරප්පෙරුමට ෂොට් එක දීපු හේතු සහ කතාව කියන්න කලින් මාලිමාව හැදුණු හැටි මම කියන්නම්.

2015න් පස්සෙ කාලෙ වෙද්දි ජවිපෙ ප්‍රතිසංවිධානය කරමින් දේශපාලන අත්හදා බැලීම් කළත් ඒ කිසි දේකින් ජනතාව තමන් වටා රොක්වෙන්නෙ නෑ කියලා අනුර කුමාර දිසානායකට හොඳින්ම තේරිලයි තිබුණේ. ඒ වෙද්දි අනුර කුමාර එක එක පොරවල් හමුවෙලා මේකට විසඳුම් අහ අහා රස්තියාදු ගහ ගහ තමයි හිටියෙ. අනුර දැනගෙන හිටියා ටිල්වින් වගේ කල් ඉකුත් වුණු අයගෙන් අලුත් ගමනක් යන්න පාර අහලා වැඩක් නෑ කියලා.

ඔන්න ඔය කාලෙ දවසක හවසක, අනුර කුමාර දිසානායක උපුල් කුමරප්පෙරුමගෙ ගෙදර එනවා. ඒ වෙලාවෙ උපුල් විස්කි ෂොට් එකක් ගහලා ආතල් එකේ ඉන්න වෙලාව. අනුර එළිපිට බොන්නෙ නැති නිසා ටොනික් ෂොට් එකක් ගහමින් කතාවට මුලපිරුවා.

'උපුල්, මෙ තත්ත්වෙන් ගියොත් තව අවුරුදු ගානක් ගියත් අපට ආණ්ඩුවක් ගන්න බැරිවෙයි වගේ...'

අනුර කඩවූ බලාපොරොත්තු ඇතිව කිව්වා.

'මචං... උඹලා ඔය කරන විදියට මේ ගමන යන්න බෑ තමයි. අපි මධ්‍යම පන්තිය පක්ෂෙ ඇතුළට ගත්තෙ නැත්තං අපිට දිනන්න බෑ.'

උපුල්, අනුරට එහෙම කිව්වා.

'ඉතිං සහෝදරයා ඒක කරන්න මොනවද අපි කරන්න ඕනෙ?'

මධ්‍යම පන්තිය තමන්ගෙ ව්‍යාපාරයට ඇතුළත් කරගන්න හැටි ඒ වෙනකොටත් දැනගෙන හිටපු නැති අනුර උපුල්ගෙන් එහෙම ඇහුවා.

'මචං... අපි ඉස්සෙල්ලා රතුපාට අයින් කරන්න ඕන... සීනුව අයින් කරන්න ඕනෙ... ඒ විතරක් නෙවෙයි මචං, අපි ජවිපෙත් අයින් කරන්න ඕනෙ. අපි ජවිපෙන් සම්පූර්ණයෙන් වෙනස් වුණු අලුත් දේශපාලන ව්‍යාපාරයක් ආරම්භ කරන්න ඕනෙ.'

**'මව්රට' කලින්ම කියූ හෙළිදරව්ව හරියටම හරි**

රතු පාට වෙනුවට රෝස පාට එන්නේත්, සීනුව වෙනුවට මාලිමාව ලකුණ එන්නේත්, ජවිපෙ වෙනුවට මාලිමාව එන්නේත් අනුරට නොතේරුණු, උපුල් කුමරප්පෙරුම පුරවා දුන් ප්‍රහේලිකාව අනුවය. ඒ කියන්නේ, 'මාලිමාව' නමැති මහා ජන පවුරේ නිර්මාතෘවරයා උපුල් කුමරප්පෙරුමය.

එක් වැරැද්දක් සිදුවුණේය. උපුල්ගේ ශුක්‍රාණුව, එක් වූයේ ටිල්වින් සිල්වාගේ ඩිම්බයක් එක්කය. ඒ අනුව පිළිසිඳගත් කලලය ජවිපෙ බඩෙන් එළියට එද්දී උප්පැන්නය ලියවුණේ මව ටිල්වින් සිල්වා හැටියටය. පසුගිය මහ මැතිවරණයට උපුල් තරග කළේ ජයග්‍රහණය අතේ තබාගෙනය. එහෙත් උපුල් මාතර ආසනයට පමණක් කොටුකර ඔහුගේ දේශපාලනය ලත් තැනම ලොප් කිරීමට ඒ වනවිටත් පිඹුරුපත් සකසා ඇති බව මේ ජනාධිපති නීතිඥයා දැන නොසිටියේය.

මාතර දිස්ත්‍රික්කයේ ඉතා කුඩාම සහ අඩුම ඡන්ද ප්‍රමාණය සහිත මාතර ආසනයෙන් පමණක් දිස්ත්‍රික් ඡන්දයක් ජයග්‍රහණය කිරීම උගහට බව මාතර දේශපාලනය දන්නා අප හොඳින්ම දන්නේය. දෙණියාය, හක්මණ, දෙවිනුවර හෝ වැලිගම වැනි ආසනවලින් තරග කරන අයට ඒ තත්ත්වය එතරම් ගැටලුවක් නැත්තේය. ඒ නිසා මාතර ආසනය නියෝජනය කරන අය තමන්ගේ වෙනත් සබඳතාවක් හෝ සාධකයක් යොදාගෙන සෙසු ආසනවලට රිංගන ආකාරය අප ඕනෑතරම් දැක ඇත්තේය.

ඊට හොඳම උදාහරණය මංගලය. මුළු ලෝකයටම සංහිඳියාව ගැන කියූ මංගල සමරවීර ඡන්ද කාලයට සිය දුරාවේ කම විකුණන බව අප දැක ඇත්තෙමු.

උපුල්ටද විකිණිය හැකි දේ තිබුණේය. එකක් වන්නේ ඔහුගේ 'රාහුලකම'ය. සාමාන්‍ය පෙළ දක්වා මාතර රාහුල විද්‍යාලයේ අධ්‍යාපනය හැදෑරූ ඔහුට තුනෙන් ගුණකළ හොඳ මිත්‍ර සමාගමක් මාතර තිබුණේය. තුනෙන් ගුණකළ යැයි කීවේ, උපුල්ට සේම ඔහුගේ සහෝදරයන් දෙදෙනාගේ මිත්‍ර සමාගම්ද එවර පෙනීසිටියේ උපුල් දිනවීමට වූ නිසාය. අනෙක් කරුණ වූයේ උපුල්ගේ බිරිඳ දෙණියායේ වීම නිසා වැදගත් සහ බලවත් ඥාති සනුහරයක් එකී ආසනයෙන් උපුල්ට ඇතිවී තිබීමය.

එපමණක් නොව, ජයග්‍රහණය ගැන සැකයක් නැති, දිනුමෙන් පසු නිසැක කැබිනට් ඇමැතිවරයෙක් වන මිනිසකු වෙනුවෙන් ජනතාව පෙළගැසීම අරුමයක්ද නොවූයේය. ඒ නිසාවෙන් මාතර සෙසු ආසනවලද උපුල් වෙනුවෙන් රැස්වීම්, ජනහමු, සාකච්ඡා පවත්වන්නට මිනිස්සු පොරකෑහ.

ඔහු දිනක් දෙණියායේ රැස්වීමකට ගියේය...

'වහාම දෙණියායෙන් පිටවෙන්න... වාහන හතර පහ දාගෙන රැස්වීම්වලට යන්න එපා. ඔයා මාතර ආසනයට විතරයි දාලා තියෙන්නෙ... වෙන කිසි තැනක රැස්වීම් තියන්න එපා...'

උපුල්ගේ දුරකතනයට ආ ඇමතුම එසේ විය. මහ මැතිවරණයක අපේක්ෂකයකුට එසේ නියෝග දිය හැකි කෙනා කවුරුන් විය හැකිදැයි සෙස්සන් තේරුම් ගත්තේ උපුල් ඊට කීකරු වූ නිසාය.

ඉන්පසු තවත් දිනයක උපුල් වෙනුවෙන් දික්වැල්ලේ රැස්වීමක් පැවැත්වුණේය. එතැන සිටියදී තවත් අයෙක් උපුල් ඇමතීය.

'ඔයා දිස්ත්‍රික්කෙ හැම තැනම රැස්වීම් තිය තිය යන්න එපා... වහාම ඔය රැස්වීම නවත්වලා මාතරට යන්න...'

ඒ කතා කළේ කවුදැයි කියාද අපි නොදනිමු.... එහෙත් ඒ නියෝගය ලද සැණින් කටයුතු ඒ නියෝගය ආකාරයෙන්ම සිදුවූ බැවින් ඔහුද ජවිපෙ ලොක්කෙකු බව උපකල්පනය කළ හැකිය.

'උපුල් කුමරප්පෙරුමට පක්ෂෙ ලොකුම තැන්වලින් කැපිල්ලක් තියෙනවා... එයාට දිනන්න අමාරුයි වගේ.... දින්නත් ඇමැතිකමක් ලැබෙන්නෙ නෑ.....'

සිදුවීම් කීපයකට පසු මාලිමාව වටා එක්වෙමින් සිටි මාතර මිනිසුන්ගේ මුවින් මුව කියැවුණේ ඒ කතාවය.

ඡන්දය අවසන් විය. උපුල් පරාදය. උපුල් පරාද වන බව අපි දැන සිටියේ ඡන්ද විමසීම පැවැත්වීමටත් දින ගණනාවකට කලින් බව මෙහිලා කිව යුතුය. 1994දී ජවිපෙට කෙළින් එන්න බැරි නිසා, ප්‍රගතිශීලී පෙරමුණේ 'මල් බඳුන' ලකුණින් තරග කර හම්බන්තොටින් එක් තරුණ මන්ත්‍රීවරයෙක් ජයගත්තේය. ඔහු ජනිත් විපුලගුණය. ඒත් එදා මේ ටිල්ටින් සිල්වාම කළේ, ජනිත් ගෙදර තබා, පරාජිත නිහාල් ගලප්පත්ති පාර්ලිමේන්තුවට ගත්තේය.

'ජනිත්ව පාර්ලිමේන්තු යැව්වා නම් කොතරම් ආකර්ෂණීයද?' යන මැයෙන් මා එවකටද රෝහණ කුමාරගේ 'සටන' පුවත්පතේ ලිපියකින් විමසුවෙමි.

උපුල් කුමරප්පෙරුම විෂයෙහි අද මා අසන්නේද ඒ පැනයමය.

'උපුල් කුමරප්පෙරුම පාර්ලිමේන්තු යැව්වා නම් කොතරම් ආකර්ෂණීයද?'

ඉන්පසු අනුරට හෝ ටිල්වින්ට අවශ්‍ය වූයේ නම් උපුල්ව ජාතික ලැයිස්තුවෙන් පාර්ලිමේන්තුවට ගන්නට තිබුණේය. එසේ කළේ නැත. ඊට හේතු ගණනාවක් ඇත්තේය. ඒත් ඉන් ප්‍රබලම හේතුව මම කිව යුතුමය. එය කිව යුත්තේ ඒ හේතුව මේ රටේ ජවිපෙ හෝ මාලිමාවේ බොරුවට රැවටුණු සියලු දෙනා දැනගත යුතු නිසාය...

'උපුල් කුමරප්පෙරුම ජවිපෙට නොදිරවීමට බලපෑ ලොකුම හේතුව, උපුල්, අනුර කුමාරට මෙන්ම තවත් බොහෝ දෙනකුටම කතා කරන්නේ 'මචං' කියා වන නිසාය.'

දකින දකින හැම එකාටම 'සහෝදරයා' යැයි ආමන්ත්‍රණය කරන පක්ෂයක නායකයන්ට, යම් අයෙක් 'මචං' යැයි ඇමතීම නුරුස්සන්නේ ඇයිදැයි දැන් ඔබ සැමට ප්‍රශ්නයක් ඉතිරිව ඇතුවාට සැක නැත. එසේ සැකයක් ඇති අයට උපුල් කුමරප්පෙරුම අමතා හෝ, රාහුල ආදිශිෂ්‍ය සංගමය අමතා ඊට පිළිතුරු ලබාගත හැකි බවද සඳහන් කරමි. ඒ කතාව කියද්දී පරණ දේශපාලන කතාවක්ද මට මතක් වුණේය. මහර මැතිවරණ සමයේ ජේ.ආර්. ජයවර්ධන සමග ගේම ඉල්ලූ විජය කුමාරතුංගට ඔහුගේ මිතුරන් අවවාද කළේ දේශපාලනයෙන් ඈත්ව සිටින ලෙසටය. මිතුරකුගේ නිවසේ පැවැති භෝජන සංග්‍රහයක් අතරතුරේදී මේ සංවාදය පැමිණි අවස්ථාවක, විජය සිය මිත්‍රයන්ගෙන් මෙසේ විචාළේය.

'උඹලා කැමැති නැද්ද කවදා හරි මේ රටේ ජනාධිපතිට මචං කියන්න....?'

එදා ඒ ප්‍රශ්නය ඇසූ 'විජයගේ ඔළුව කුඩුවෙන්න වෙඩිතබා මරාදැමුවේද අනුර කුමාරලාගේ ජනතා විමුක්ති පෙරමුණේ 'බුලට්' එකෙන්ය'.

අද... අනුරට මචං කියන, උපුල් කුමරප්පෙරුමට ජනතා විමුක්ති පෙරමුණ ෂොට් එක දුන්නේ 'බැලට්' එකෙන්ය. උපුල්ලාට තිසි තැන නොදීමේ ආදීනව මාලිමා ආණ්ඩුව දැන් හොඳටම අත්විඳින බව නොකිවමනාය. උපුල්ලා වැන්නන් ඇතුළේ සිටියා නම් අනුර හෝ මාලිමාව මේ තරම් කුජීත නොවනු ඇති බව මගේ පෞද්ගලික තක්සේරුවය.

ඇත්තම කතාව... අනුර කුමාර දිසානායකට වඩා උපුල් කුමරප්පෙරුම ප්‍රායෝගික දේශපාලන භාවිතාවෙන් ගව් ගණනක් ඉදිරියෙන්ය. අනාගතයේ ඇපත් නැතිවන ජවිපෙ වෙනුවට වමේ පොදු අපේක්ෂකයෙක් සොයාගැනීමට අනිවාර්යයෙන්ම සිදුවන්නේය. එවැනි අවස්ථාවක අපේක්ෂකයෙක් සොයාගැනීම ගැටලුවක් වේනම් ඊට කදිම තෝරාගැනීම උපුල් කුමරප්පෙරුමය.



අවසාන වශයෙන් කිව යුත්තේ, සිනහ සිසී... උපුල් කුමරප්පෙරුමගේ දේශපාලන ජීවිතය ඝාතනය කළ ජවිපෙ හෝ මාලිමාවේ අයියලා, අද උපුල්ගේ ආදරණීය පුතණුවන්ගේ මරණය වෙනුවෙන් කඳුළු සැලීම කොතරම් හාස්‍යජනකද? මොන විගඩමක්ද?

*උපුල් ගලප්පත්ති*

---




## ජීවිතයම ජනතාව වෙනුවෙන් කැපකළා

# අවස්ථාවාදී දේශපාලකයන් උගත යුතු සූකීගේ පාඩම

**ප්‍රජාතන්ත්‍රවාදී පාලන ව්‍යුහයක් පවතින දේශයක ජනතාව සිය ඡන්ද බලය භාවිත කොට තමන් කැමැති දේශපාලන පක්ෂයක කණ්ඩායමකට සිය රටේ පාලන බලය පවරති. ජනතාව එසේ කරනුයේ දේශයේ පාලනය යහපත් ආකාරයට ගෙන ගොස්, තම රට ඉදිරියට ගෙනයාමත් තමන්ට නිදහසේ ජීවත්වීමට අවශ්‍ය පරිසරයක් නිර්මාණය කරවා ගැනීමේ ඒකායන අරමුණද පෙරදැරි කරගෙනය.**

මෙම අරමුණ තුළ ගැබ්වන අවශ්‍යතාද රැසකි. තමන් එතෙක් පෙළනු ලැබූ ආර්ථික ගැටලු සමනය කර ගැනීම යහපත් පරිභෝජන රටාවක් ඇති කරවා ගැනීම, තම දරුවන්ට හොඳ අධ්‍යාපන පසුබිමක් නිර්මාණය කරවා ගැනීම තමන්ගේ උගත් දූදරුවන්ට ගැළපෙන උසස් රැකියා උත්පාදනය කරවා ගැනීම, රටේ කෘෂි ක්ෂේත්‍රය නගාසිටුවා ගැනීම, මෙන්ම තම රට තිබුණු අඩියෙන් තව ටිකක් ඉදිරියට දියුණු කරවා ගැනීම වැනි අරමුණු රැසක් ඉටුකරවා ගැනීම නව පාලක පිරිසක් රටට පත්කර ගැනීම තුළින් රටක ජනතාව අපේක්ෂා කරති.

එසේ රාජ්‍ය පාලන බලය ඉල්ලන දේශපාලන පක්ෂ නියෝජිතවරුද තම කණ්ඩායමට බලය ලබාදෙන්නේ නම් ඉටුකර දෙන පොරොන්දු මලු පිටින් ජනතාව ඉදිරියේ විවර කර තබති.ඒ ආකාරයට මෙතෙක් අප රටේ බලයට පැමිණි පාලක කණ්ඩායම් රටට අඩුවැඩි වශයෙන් සේවා සපයා ඇති බව අපි දනිමු. මෙයට කලකට පෙර මෙරට දේශපාලන ප්‍රවාහයට එක්වුණේ රටේ ප්‍රභූ පවුල් යැයි සම්මත පවුල්වල සාමාජික, සාමාජිකාවෝය. රට වශයෙන් ගත්තත්, ග්‍රාමීය පාලනය දෙස බැලුවත් සිදුව තිබුණේ එවැනි ක්‍රියාදාමයකි. කලින් කලට තේරීපත්වුණු පාලන තන්ත්‍රයන් තුළ සිටි උගතුන්, බුද්ධිමතුන් යන පිරිසගෙන් රටක් හැටියට, රටේ දියුණුවට සිදුකෙරුණු මහා පරිමාණ ව්‍යාපෘතිද අපේ දෑස් පනාපිට අදද දක්නට ලැබේ.

විදේශ ආධාරයන්ගෙන්, විදේශයන්ගෙන් ලබාගැනෙන ණය අරමුදල් වැයකිරීමෙන් මෙන්ම, දේශීය වශයෙන්ද වැය පස යොදා එවැනි ව්‍යාපෘති බිහිවුණු යුගයන්ද අපට දක්නට ලැබිණි. තමන් උපන් රටට ප්‍රජාතන්ත්‍රවාදී ප්‍රවාහය ඔස්සේ බලයට පැමිණ, සිය පරම්පරාවෙන් ලැබුණු ආදායම්, සම්පත් පවා අහිමිකර ගෙන දේශපාලනයේ නියැළී සිට සිය දිවියෙන් සමුගෙන ගිය දේශපාලන නායක නායිකාවෝද මෙරට සිටියහ. එදා ඩඩ්ලි සේනානායක වැනි නායකයන් සිය දිවියෙන් සමුගන්නා විට ඔවුන් සතුව මුල්‍ය කඳු තිබුණේ නැත. ඔහුට අයත් බැංකු පොතක තිබුණේද රුපියල් 34ක් වැනි සොච්චම් මුදලකි. සර් ජෝන් කොතලාවල වැනි දේශපාලනඥයන් දිවියෙන් සමුගත් පසු, ඔහු ජීවත් වූ කඳවල වලව්ව පවා අදවන විට රටේ ජනතාවගේ දූදරුවන්ට විවර වූ අධ්‍යාපන මූලස්ථාන බවට පත්ව තිබේ. අප රට පාලනයට සහසම්බන්ධ වූ නායක කාරකාදීන් අතලොස්සක්ම එසේ ක්‍රියාකර ඇති බව පෙනේ. එහෙත් ක්‍රම ක්‍රමයෙන් මෙරට දේශපාලනයට පිවිසි බොහොමයක් දෙනා තමන් උපන් රට දියුණු පමුණු කොට, තමන්ගේ ජනතාවට උසස් ජීවන තත්ත්වයක් උදාකර දෙනුවා වෙනුවට තමන්ගේ සහ තම පවුල්වල නෑදෑ කාරකයන්ගේ ආර්ථිකය තරකර ගන්නා තැනට ක්‍රම ක්‍රමයෙන් තල්ලුවී ගොස් ක්‍රියා කරන ලද බව ගෙවීගිය කාලය තුළ පැහැදිලිව දක්නට ලැබිණි.

මෙය අප රටේ පමණක් නොව අප රටෙන් බැහැර රාජ්‍යවලද සිදුවූ කැපීපෙනෙන දසුනක් බවද දක්නට ලැබිණි. දියුණු වෙමින් පවතින රටවලට ප්‍රසිද්ධියේ යම් යම් උපකාර කොට ඒ වෙනුවට ඊට වඩා වටිනා යමක්, එබඳු රටවලින් ලබාගැනීම ඇති හැකි බලවත් රටවල පුරුද්දක් වී ඇති බවද පෙනේ.

හැම රටකටම එකහා සමාන සම්පත් නොමැතිකම නිසාම, එසේ බලවත් ලෝක බලවත් රාජ්‍යවල අකටයුතුකම්වලට කොටුවන අවස්ථාද නැතුවා නොවේ. ඒ කෙසේ වෙතත් තමන් උපන් දේශයට කිසියම් සෙතක්, සේවයක් කළයුතු යැයි කල්පනාකොට සේවා සැපයූ එස්.ඩබ්ලිව්.ආර්.ඩී. බණ්ඩාරනායක, සිරිමාවෝ බණ්ඩාරනායක, ජේ.ආර්. ජයවර්ධන, රණසිංහ ප්‍රේමදාස, මහින්ද රාජපක්ෂ, ගාමිණී දිසානායක, ලලිත් ඇතුලත්මුදලි වැනි දේශපාලන නායක නායිකාවන් මේ රට තුළද තවත් බොහෝ නායක නායිකාවන් වෙනත් රාජ්‍යයන් තුළද කටයුතු කළ ආකාරයන් අපි දැක ඇත්තෙමු.

අප රටේ බැංකු පද්ධති, රාජ්‍ය ප්‍රවාහන සේවා, රටේ උරුමය අපට නොලැබෙන විට විදෙස් කොම්පැනි සතුව පැවැති යම් යම් සේවා, ආයතන ජනසතු ව්‍යාපාර යටතේ ජනසතු කිරීම් වැනි ජනහිතකාමී අභීත රාජ්‍ය තීන්දු ගෙන ක්‍රියා කළ අයද අපට මතකය. එහෙත් කල්යෑමේදී රාජ්‍යයන් සතුව පැවැති එවැනි බොහොමයක් ආයතන, සේවා මධ්‍යස්ථාන නැවත පෞද්ගලික අංශ වෙත කුණු කොල්ලෙට බිලිදී තම මඩි තරකරගෙන ජනතාව ඉදිරියේ අත පිසදාගත් දේශපාලුවෝද අප අතරම සිටියහ. එසේ කිරීමෙන් ලැබෙන යම් යම් කොමිස් කුට්ටි තම දේශපාලන හිතවතුන් මෙන්ම තම ඥාති පවුල් අතර බෙදාහදාගෙන වැජඹුණු දේශපාලනඥයෝද අප අතරම සිටි වග ජනතාවට අමතක නැත.

ඒ අතර තමන්ගේ රටේ ජනතාව වෙනුවෙන් තම දේශපාලන භාවිතාව ඉතාම අවංකව කැපකළ දේශපාලන නායිකාවකගේ කතාවද අවිවාදයෙන්ම අපවැනි රටවලට කදිම ආදර්ශයක් ලබාදෙනු ඇත. ඇය අන් කවරකුවත් නොව මියන්මාරයේ (බුරුමයේ) දේශපාලන ක්‍රියාකාරිනියක වූ අවුං සාං සුකීය.

ඔක්ස්ෆර්ඩ් සරසවියේ උපාධිධාරියකු වූ මයිකල් ඇරිස් මහත්මා හොඳ ගති තිබූ සන්සුන් පුද්ගලයෙකි. එසේම දැඩි අභ්‍යන්තර ශක්තියක්ද ඔහු සතුව පැවැතිණි.

මෙයට විසි වසරකට පමණ පෙර මියන්මාරයේ පැවති මිලිටරි ජුන්ටාව එරට ජනතාව අපමණ ලෙස තළා පෙළුවේය. ජනතාවට පක්ෂපාතී දේශපාලන ක්‍රියාකාරිනියක වූ අවුං සාං සුකී ජනතාව සමග එක්ව, එරට තුළ ගෙනගිය ජන අරගල, ජනතාවාදී උද්ඝෝෂණ අකාමකා දැමීමට පාලන බලයේ සිටි මිලිටරි ජුන්ටාව නොකළ දෙයක් නැත.

1972 වසරේදී මයිකල් ඇරිස් සහ අවුං සාං සුකී යුවළ විවාහ පත්වූහ. ඔවුන් දෙපළට ඇලෙක්සැන්ඩර් සහ කිම් යනුවෙන් දරුවන් දෙදෙනකුද වූහ. සුකී මියන්මාරයේය. මයිකල් බ්‍රිතාන්‍යයේය. තමාට මියන්මාරයට යාමටත්, සිය බිරිඳ සහ දරු දෙදෙනා දැකබලා ගැනීමටත් බ්‍රිතාන්‍යයේ සිටි මයිකල් ඇරිස්ට තදබල ඕනෑකමක් තිබිණි. තමාට මියන්මාරයට යාමට ප්‍රසිද්ධියේ ඉල්ලුම් කළ විට මිලිටරි ජුන්ටා පාලනය කිසි ලෙසකින් විසා අනුමත නොකරනු ඇතැයි සිතූ මයිකල් ඒ සඳහා අප්‍රසිද්ධියේ ඉල්ලුම් කළේය. එදා මියන්මාරයේ පැවැති මිලිටරි ජුන්ටා පාලනය එවැන්නක් නොදන්නා ලෙස හැසිරුණේය. එමෙන්ම බටහිර රටවල්ද, ඉන්දියාව, ජපානය, මැලේසියාව ආදී රටවල්ද, එක්සත් ජාතීන්ගේ සංවිධානයේ නායක කොෆී අන්නන්ද ඒ වෙනුවෙන් අප්‍රසිද්ධියේ කළ කිසිදු ඉල්ලීමකට ජුන්ටා ජෙනරාල්වරු ඇහුම්කන් දුන්නේම නැත. එසේම මේ පවුලේ සියල්ලන්ටම එක්ව සිටීමට එවක මියන්මාරයේ පාලන බලය ගෙනගිය මිලිටරි ජුන්ටාව කිසි ලෙසකින්ම ඉඩ දුන්නේ නැත. 1998 වසරේ අගභාගය වනවිට පුරස්ථි ග්‍රන්ථියේ පිළිකාවක් වැළඳී සිටි මයිකල් ඇරිස්ගේ තත්ත්වය දරුණු විය. ඔහු ඒ වනවිට සිටියේ ජීවිතයත් මරණයත් අතර සටනකය. සිය රෝගී තත්ත්වයට ප්‍රතිකාර ලබාගනිමින් සිටියේද බ්‍රිතාන්‍යයේ රෝහලකය. ඒ වනවිට අවුං සාං සුකී සිටියේ මියන්මාරයේ (බුරුමයේ) නීත්‍යනුකූල එහෙත් බලය නොලත් රටේ නායිකාව ලෙසිනි. සුකීට රෝගීව සිටි සිය සැමියාව බැලීමේ වාසනාව පවා මිලිටරි ජුන්ටාව අහිමිකර තිබිණි.


1990 පැවැති මහ මැතිවරණයේදී විශිෂ්ට ජනතා ජයක් ලැබූ අවුං සාං සුකීගේ පක්ෂය (ප්‍රජාතන්ත්‍රවාදය උදෙසා ජාතික ලීගය) වෙත බලය පවරාදීම පවා ප්‍රතික්ෂේප කළ මිලිටරි ජුන්ටාව, ඒ වනවිට එරට අත්තනෝමතික පාලනයක් ගෙන ගියේය. රටේ ප්‍රබල ජනබලයක් ලබා සිටියදීත් සුකී එක පැත්තකය. ඇගේ සැමියා වූ මයිකල් තවත් පැත්තකය. තම දයාබර බිරිඳ ළඟට යාමට මයිකල් ඇරිස්ට වසර දහයක් පුරාවට පැවැති බලාපොරොත්තුව ඉටු නොවිණි. මේසා කාලයක් තුළ ඔහුට ඇයව දැකගැනීමට අවස්ථාව සැලසුණේ පස් වතාවකි. ඒද ඉතාම කෙටි කාලසීමාවකට කොටුවය.

සුකී මියන්මාර ජනතාවට හිතවාදීව කටයුතු කළ නිසාම මියන්මාර වැසියෝද ඇයට පෙරළා ආදරය කළහ. ජනතාව ඇයට සිය කැමැත්ත (ඡන්දය) පිදුවද, එයින් ඇය ලද විශිෂ්ට ජයග්‍රහණය ගැනද නොතකා ජුන්ටා මිලිටරි පාලනය ඇයට රටේ පාලන බලය ලබාදුන්නේ නැත. ඔවුන් සුකීගේ නිවසේ දුරකතන ජාල පවා කපාදැමුවේය. මේ නිසා ඇයට බාහිර සමාජය සම්බන්ධ කරගැනීමට පවා නොහැකි විය. බ්‍රිතාන්‍යයේ ප්‍රතිකාර ලබමින් සිටි සැමියාට ඇය අවස්ථා ගණනාවකදීම කතා කළේද, එරට පිහිටි බ්‍රිතාන්‍ය තානාපති කාර්යාලයට ගොස් එහි දුරකතන පද්ධතිය හරහාය. ඒ වනවිට මරණාසන්නව සිටි සැමියා තම රටට ගෙන්වා දෙන්නැයි සුකී කළ ඉල්ලීමට පවා මිලිටරි ජුන්ටා පාලනය සවන් දුන්නේ නැත. එසේ ඇය කළ ඉල්ලීමට ජුන්ටා නිලධාරීන් කීවේ, රෝගී තත්ත්වයෙන් සිටින මයිකල් ඇරිස් මියන්මාරයට ගෙන්වා ගැනීමට හදනවාට වඩා කළ යුත්තේ, නිරෝගී තත්ත්වයේ සිටින සුකීට බ්‍රිතාන්‍යයට ගොස් තම සැමියාව බැලීමය යැයි කියාය. ජුන්ටාවේ මෙකී උප්පරවැට්ටියට අවුං සාං සුකී හසුවුණේ නැත. මෙය වංචනික කියමනක් බව ඇය දැන සිටියාය. මියන්මාරයේ ජනතාවාදී නායිකාව එසේ රටෙන් පිටවූ පසු නැවත ඇයට රටට ඒමට ඉඩ නොතැබීම ජුන්ටා පාලනයේද අරමුණ විය. සුකී ජුන්ටා ගැටයට අසුවුණේ නැත. අන්තිමේදී සුකීගේ දයාබර සැමියා මයිකල් ඇරිස් බ්‍රිතාන්‍යයේදීම සිය දයාබර බිරිඳගේ රුවවත් නොදැක අවසන් හුස්ම හෙළුවේය. අවසන් මොහොතේවත් තම සැමියා දැකගත නොහැකිව අතිශය ශෝකයට පත්ව සිටි සුකීව, සිය සැමියා වූ මයිකල් ඇරිස්ගේ අවමංගල්‍යයට සහභාගි කරවීමට, බ්‍රිතාන්‍යයට පිටත්කර හැරීමට මිලිටරි ජුන්ටාව හැකි සෑම උත්සාහයක්ම ගත්තේය. එහෙත් තමා එසේ ගිය විට සිදුවන දේ මැනවින් දැන සිටි සුකී, බ්‍රිතාන්‍යයට නොයා තම ජනතාව වෙනුවෙන් මියන්මාරයේම රැඳී සිටීමට තීරණය කළාය.

'මගේ දයාබරිත සැමියා මාව සපුරා තේරුම් ගත්තා..... එවැනි සැමියකු ලබන්න මා වාසනාවන්ත වුවා. කිසිම කෙනකුට කිසිම අවස්ථාවක එය මා වෙතින් උදුරාගත නොහැකියි....' සුකී කීවාය.

සුකී ගත් මෙම තීන්දුවත් සමග මියන්මාර ජනතාව සමග ඇයගේ පවතින බැඳීම බොරුවක් යැයි කීමට එරට මිලිටරි ජුන්ටා පාලනය එතෙක් ගෙන ගිය මතය බිඳවැටිණි. මෙම සිද්ධිය තුළින් සුකී තුළ තම රට වෙනුවෙන්, තම රටේ ජනතාව වෙනුවෙන් පැවැති නොසැලෙන ශක්තිය මුළු ලොවටම විදහා දැක්විණි. ඉතා හීන්දෑරි ප්‍රසන්න භාද්‍රාමක පෙනුමක් තිබුණද, ඇය තුළ පැවැති ශක්තිය ඉමහත් බවද ඇය ප්‍රකට කළාය. එසේම තම රට සහ ජනතාව වෙනුවෙන් සිය සැමියා කැපකළ නායිකාවක ලෙස එදා ඇය ලෝක දේශපාලන ඉතිහාසයට එක්වූවාය.

දේශය යහපත් ලෙස පාලනයට, ජනතාවට හිතකර යහපාලනයක් ලබාදීමට යැයි කියා රටක පාලන බලය ලබාගෙන තම යටිමඩි තරකර ගන්නා දේශපාලන පක්ෂවල නායක නායිකාවනට අවුං සාං සුකීගේ මෙම දේශපාලන භාවිතාව අගනා පාඩම් රැසක් කියා දෙන්නේය.



*නන්දන ඩී. කෙහෙල්ගමුව*

කොළඹ 05, තිඹිරිගස්යාය, ජයරත්න මාවත, අංක 22හි පිහිටි ශ්‍රී මීඩියා ඉන්ඩිපෙන්ඩන්ට් නෙට්වර්ක්ස් ප්‍රයිවට් ලිමිටඩ් සමාගම විසින්, මත්තේගොඩ නිවාස සංකීර්ණය පාර, අංකඃ 102/176හි පිහිටි සයුරි ප්‍රින්ටර්ස් ඇන්ඩ් පබ්ලිෂර්ස් ප්‍රයිවට් ලිමිටඩ් ආයතනයේදී 2026 ජූනි 21 වැනි ඉරිදා මුද්‍රණය කර ප්‍රසිද්ධ කරන ලදී.